





# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report

# 2013


**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**
**நிர்மாணம் பயிற்சியளிப்பு அபிவிருத்திக்கான நிறுவனம்**
**Institute for Construction Training and Development**

ICTAD
SETTING THE STANDARDS
INSTITUTE FOR CONSTRUCTION TRAINING AND DEVELOPMENT

**ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය**
நிர்மாணத்துறை, பொறியியல் சேவைகள், வீடமைப்பு மற்றும் பொதுவசதிகள் அமைச்சு
**Ministry of Construction, Engineering Services, Housing and Common Amenities**

# වාර්ෂික වාර්තාව
# 2013

# පටුන

1.0 දැක්ම .......................................................................1

2.0 මෙහෙවර .......................................................................1

3.0 මූලික පරමාර්ථ .......................................................................1

4.0 සංවිධානය .......................................................................2

5.0 ආංශික කාර්යයන් .......................................................................5

5.1 උපදේශක සේවා අංශය .......................................................................6

5.2 සංවර්ධන අංශය .......................................................................9

5.3 ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය ..........................13

5.3.1 ඉදිකිරීම් යන්ත්‍ර මෙහෙයුම් ශිල්පී විද්‍යාල ..........................14

5.3.2 ඉදිකිරීම් යන්ත්‍ර නඩත්තු කිරීම පුහුණු කිරීමේ අංශය ..............18

5.4 පුහුණු කිරීම් අංශය .......................................................................24

5.4.1 ජනාවාස සැළසුම් සහ සංවර්ධන මධ්‍යස්ථානය (CHPD) ..........26

5.5 මානව සම්පත් හා පරිපාලන අංශය .......................................... 31

5.6 මූල්‍ය අංශය ....................................................................... 33

6.0 ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව .......................................... 60

## 1.0 දැක්ම

**"විශ්වාසනීය සහ ගෝලීය තරඟකාරිත්වයට සුදුසු ඉදිකිරීම් කර්මාන්තයක් බිහිකිරීම".**

## 2.0 මෙහෙවර

**"ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සම්පත් සංවර්ධනය සඳහා රෙගුලාසි සහ පහසුකම් සැපයීම මගින් ඒවායෙහි ගුණත්ව සම්මතයන් ප්‍රවර්ධනය හරහා ක්‍රියාශීලී වෘත්තිමය සහ විශ්වාසනීය වටිනාකම් එකතුවූ සේවාවක් තහවුරු කිරීම මගින් දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට මුහුණදිය හැකි ස්ථිරසාර ජාතික සංවර්ධනයක් ඇති කිරීම".**

## 3.0 මූලික පරමාර්ථ

**ඉක්ටාඩ් ( ICTAD*)* ආයතනය මූලික පරමාර්ථ වන්නේ:**

- සංවර්ධන අරමුණු මූලික කරගත් ජාතික ඉල්ලුමට සරිලන සේ ඉදිකිරීම් කර්මාන්තයේ දායකත්වය නඟා සිටුවීම.
- ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින්නන්ට එහි දියුණුවට සහ ප්‍රතිසංස්කරණයන්ට මෙන්ම තිරසාර වර්ධනයක් අත්පත් කර ගැනීමට හැකිවන සේ උපාය මාර්ගික නායකත්වයක් ලබාදීම.

**ප්‍රධාන ක්‍රියාකාරී ක්ෂේත්‍රයක් වන්නේ:**

- ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමෙහි ලා සහාය වීම;
- කොන්ත්‍රාත්කරුවන් සහ දේපළ සංවර්ධනය කරන්නන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය කළමනාකරණය සහ අලෙවිකරණ හැකියාවන් පදනම් කොට ඔවුන්ව ශ්‍රේණිගත කිරීම;
- ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින උපදේශකවරුන්ගේ වෘත්තියවේදිත්වය ප්‍රවර්ධනය සහ මෙම කර්මාන්තයේ වෘත්තිමය ආයතන වල කාර්යයන් සම්බන්ධීකරණය කිරීම සහ ඉදිකිරීම් කර්මාන්තය තුළ සෙසු ආයතන ගොඩනැගීමට සහාය වීම;
- ඉදිකිරීම් කර්මාන්තය තුළ උපදේශන සේවා අපනයනයකිරීමට සහාය වීම සහ අධාර ලබාදීම සහ දේශීය කොන්ත්‍රාත්කරුවන් හට විදේශීය ඉදිකිරීම් කටයුතු සහ සේවාවන් ලබා ගැනීමට දිරිමත් කිරීම;
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන සේවාවන් සැපයීම;
- ඉදිකිරීම් කර්මාන්තයේ මානව සම්පත් අවශ්‍යතාවයන් සමාලෝචනය කිරීම සහ ඒවා ලඟාකර ගැනීම සඳහා පුහුණු පහසුකම් අධීක්ෂණ කටයුතු වලට සහාය වීම;
- ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින ආයතනවල සහ පුද්ගලයන්ගේ නිපුණතාවය සහ විශේෂ කුසලතා අභිවර්ධනය ප්‍රවර්ධනය කිරීම;
- ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය හෝ භාර ගැනීම;
- ඉදිකිරීම් කර්මාන්තය හා සම්බන්ධ කර්මාන්ත සංවර්ධනය සඳහා උපකාර කිරීම සහ ඒවා වැඩි දියුණු කිරීම;
- ඉදිකිරීම් කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා වෙනත් ඕනෑම ක්‍රියාකාරකමක් භාරගැනීම හෝ සහාය වීම;

## 4.0 සංවිධානය

### හැඳින්වීම

1957 අංක 49 දරන රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංවිධානයක් වන ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ඉක්ටාඩ්) වර්තමානයේ දී ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එහි ප්‍රධානත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති විසින් දරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලය

| නම සහ පෞද්ගලික ලිපිනය | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| අනුර දිසානායක මහතා<br>අංක. 81/6, කන්දෙකැටිය වත්ත<br>කොස්වත්ත පාර,<br>කිරිවත්තුඩුව. | සභාපති | 2013-05-30 |
| සුනිල් සමන්ත කුමාරසිංහ මහතා<br>මිල්ක් විලිං සෙන්ටර් බාරේ,<br>මිල්කෝ පුද්ගලික සමාගම,<br>එරගම පාර,අම්පාර. | ක්‍රියාකාරී අධ්‍යක්ෂ | 2012-09-10 |
| හේමන්ත අපොන්සු මහතා,<br>වරලත් ප්‍රවාහන සමීක්ෂක,<br>නො. 45/B, පාසල් මාවත,<br>නාවල. | සාමාජික | 2013-02-19 |
| එන්.එම්.පී. නවරත්න මහතා,<br>වාස්තු විද්‍යාඥ,<br>නො. 26/9A, 1 වන පටුමග,<br>රැම්පට් පාර,ඇතුල් කෝට්ටේ. | සාමාජික | 2013-05-20 |
| ජයසිරි සමරතුංග මහතා,<br>නො. 162, නුවර පාර,<br>දළුගම,කැළණිය. | සාමාජික | 2013-05-20 |
| දේශමාන්‍ය එස්.පී. ලියනාරච්චි මහතා,<br>නො. 547, අකුරෙගොඩ පාර,<br>තලංගම දකුණ,<br>බත්තරමුල්ල. | සාමාජික | 2013-05-20 |
| එච්.ආර්.පී.පී. ජයවර්ධන මහතා,<br>අංක. 7A, බලබෝව,<br>දෙවලපොල. | සාමාජික | 2013-06-15 |

## පූර්ව අධ්‍යක්ෂ මණ්ඩලය


| නම සහ පෞද්ගලික ලිපිනය | තනතුර | පත්වීම් දිනය |
|---|---|---|
| උදුල බණ්ඩාර අවුසදහාමි මහතා,<br>නො. 71, දිගන විලේජ්,<br>රජවැල්ල. | සභාපති | 2010-05-24 |
| ඉංජිනේරු එන්. රූපසිංහ මහතා,<br>අංක. 57, මහවැලි නිවාස සංකීර්ණය,<br>පල්ලෙකැලේ,<br>කුන්ඩසාලේ. | සාමාජික | 2010-05-24 |
| අජිත් අබේසේකර මහතා,<br>නො. 513/26, පසන් මාවත,<br>ඇරැව්වල බටහිර,<br>පන්නිපිටිය. | සාමාජික | 2010-05-24 |
| ඉංජිනේරු. එන්. නිස්සංක විජේරත්න මහතා,<br>නො. 465, ගාලුපාර,රාවතාවත්ත, මොරටුව. | සභාපති | 2009-07-14 |
| කේ.එල්. සමරසිංහ මහතා,<br>නො. 46/23, ලේඩි ලැවීනියා,<br>1 වන හරස් වීදිය,<br>පන්සල පාර,<br>ගල්කිස්ස. | සාමාජික | 2009-02-25 |
| ඉංජිනේරු මහාචාර්ය, ඒ.කේ. ඩබ්. ජයවර්ධන මහතා,<br>නො. 14, විජේරාම මාවත,<br>දේවානන්ද පාර,<br>නාවින්න,<br>මහරගම. | සාමාජික | 2007-12-07 |
| දේශබන්දු සුරත් වික්‍රමසිංහ මහතා,<br>නො. 108 B, හෝර්ටන් පෙදෙස,<br>කොළඹ 07. | සාමාජික | 2007-12-07 |
| ඩබ්.ඒ.කේ.එස්.ද. අල්විස් මහතා,<br>නො. 107/1 D, දළදාවත්ත පාර,<br>තල්පිටිය,<br>වාද්දුව. | සාමාජික | 2007-12-07 |
| මහාචාර්ය රවිස්ඩීන් මහතා,<br>නො. 21 1/3, මැජස්ටින් මහල් නිවාස,<br>දුම්රිය පල පාර,<br>කොළඹ 6. | සාමාජික | 2007-12-07 |
| ජයසිරි සමරතුංග මහතා,<br>නො. 162, නුවර පාර,<br>දළුගම,<br>කැළණිය. | සාමාජික | 2007-12-07 |
| මහාචාර්ය . චිත්‍රා වෙඩික්කාර මහත්මිය,<br>නො. 31 A, ඇල්බට් පෙදෙස,<br>දෙහිවල. | සාමාජික | 2007-12-07 |

ඉක්ටාඩ් ආයතනය සභාපතිගේ ප්‍රධානත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ අංශ 4 ක් මඟින් එහි කාර්යයන් පවත්වා ගෙන යනු ලැබේ. පහත දක්වා ඇති ආකාරයට සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයෙකුගේ ප්‍රධානත්වයෙන් පාලනය වේ:

අ) උපදේශන සේවා අංශය
ආ) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අංශය
ඇ) ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ අංශය
ඈ) පුහුණු කිරීමේ අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයේ පරිපාලනමය වගකීම සභාපතිතුමාගේ මඟ පෙන්වීම යටතේ ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ ජනරාල් විසින් දරනු ලබයි. මෙහෙයුම් අංශ වන පරිපාලන හා මූල්‍යඅංශ පිළිවෙලින් පරිපාලන කටයුතු හා මුදල් කටයුතු පිළිබඳ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වේ. (ආංශික කාර්යයන් දක්වා ඇති වගුව බලන්න.)

# 5.0 ආංශික කාර්යයන්


සභාපති
සහ අධ්‍යක්ෂ මණ්ඩලය
ක්‍රියාකාරී අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ ජනරාල්
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අංශය
උපදේශන සේවා අංශය
ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු
පුහුණු කිරීමේ අංශය
පරිපාලන අංශය
මූල්‍යමය අංශය
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (උපදේශන)
අධ්‍යක්ෂ (ඉදිකිරීම්
අධ්‍යක්ෂ (පුහුණු)
අධ්‍යක්ෂ (පරිපාලන)
අධ්‍යක්ෂ (මූල්‍ය)
අභ්‍යන්තර
කාර්යයන්:
1. නියාමන හා කර්මාන්ත සංවර්ධන.
2. තාක්ෂණ සංවර්ධන.
ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර:
1. ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම.
2. ක්‍රමවේදය වැඩි දියුණු කිරීම
3. ප්‍රතිපත්ති උපදෙස්.
4. කොන්ත්‍රාත්කරුවන් සංවර්ධනය
5. උපදේශනයන් සංවර්ධනය.
6. ප්‍රතිපත්ති අධීක්ෂණය.
7. භෞතික සංවර්ධනය.
8. ක්‍රම සහ තාක්ෂණය.
9. පරිගණක පහසුකම් පවත්වාගෙන යාම.
10. මෘදුකාංග සංවර්ධනය සහ පරීක්ෂණ අංශයට සහාය දීම.
කාර්යයන්:
1. ඉදිකිරීම් ආර්ථික හා කාර්මික විගණන.
2. ප්‍රවර්ධන/සම්බන්ධීකරණ/ ඉදිකිරීම් සම්බන්ධ තොරතුරු වාර්තා කිරීම.
ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර:
1. ඉදිකිරීම් කර්මාන්ත, සංඛ්‍යානමය හා දත්ත පද්ධති.
2. කාර්මික විගණනය.
3. කොන්ත්‍රාත් කටයුතු කළමනාකරණය.
4. තොරතුරු මධ්‍යස්ථාන පවත්වාගෙන යාම.
5. ඉක්ටෑඩ් වාර්තා ප්‍රකාශනයට පත්කිරීම හා පරිවර්තන කටයුතු කිරීම.
6. ඉක්ටෑඩ් ප්‍රචාරනය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
කාර්යයන්:
1. ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරවීම හා නඩත්තු කිරීම් පිළිබඳ විශේෂඥ පුහුණුවක් ලබාදීම.
2. ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරවීමෙහි හා නඩත්තු කිරීමෙහි යෙදී සිටින්නන් පිළිබඳ මානව සම්පත් සංවර්ධනය.
ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර:
1. කාර්මික හා යන්ත්‍ර ක්‍රියාකරුවන්ට විශේෂ පුහුණුව ලබාදීම.
2. පුහුණුව සඳහා හසුකම් ලබාදීම.
3. ආයතනික වෘත්තීය සංවර්ධනය.
4. ඉදිකිරීම් උපකරණ ක්‍රියාත්මක කිරීමෙහි හා නඩත්තු කිරීමෙහි යෙදී සිටින්නන් පුහුණු කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම.
කාර්යයන්:
1. ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින්නන් සම්බන්ධ මානව සම්පත් සංවර්ධනය.
ප්‍රධාන කාර්යය ක්ෂේත්‍ර:
1. කොන්ත්‍රාත්කරුවන්, ශිල්පීන්, පරිපාලකයන්, කළමනාකරුවන් පුහුණු කිරීම සඳහා පහසුකම් සැපයීම.
2. ආයතනික හා වෘත්තීය සංවර්ධනය.
3. ශ්‍රමබල අධ්‍යනය හා ආයතනික තොරතුරු.
4. ඉදිකිරීම් කර්මාන්ත පුහුණුකරු පුහුණුව.
5. ඉදිකිරීම් පරිපාලකයන් හා කළමනාකරුවන් සඳහා විශේෂ පුහුණුව.
6. ප්‍රතිපත්ති ප්‍රකාශන යෙදවුම්Paper Inputs.
කාර්යයන්:
1. පිරිස් හා පරිපාලන සේවා අංශවලට සැපයීම.
2. පුස්තකාලය පවත්වාගෙන යාම.
කාර්යයන්:
1. අංශවලට මූල්‍යමය හා කළමනාකරණ සේවාවන් සැපයීම.

## 5.1 උපදේශක සේවා අංශය

**සැපයූ සේවාවන්:**

ඉදිකිරීම් කර්මාන්තයෙහි නියැලෙන්නන් වන කොන්ත්‍රාත්කරුවන්, උපදේශකයින්, සේවාදායකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන් හා ආයෝජකයන් ලිඛිතවූ දුරකථන පණිවුඩ මගින් හෝ ආයතනයට පෞද්ගලිකව පැමිණීමෙන් කරනු ලබන ඉල්ලීම් සඳහා පහත සේවාවන් සපයනු ලබයි.

1. **ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන සේවා සැපයීම**

    - ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන සේවා සැපයීම.
    - ඉදිකිරීම් වැඩ සහ උපදේශන සේවා ලබා ගැනීම සඳහා උපදෙස් ලබා දීම.
    - කොන්ත්‍රාත් පරිපාලනය සහ ආරවුල් නිරාකරණය සඳහා උපදෙස් ලබා දීම.
    - යෙදවුම්වල මිළ උච්ඡාවචනය වීම සහ ඉක්ටාඞ් සූත්‍රය යෙදාගැනීමේ ක්‍රමය හේතුවෙන් වියදම් ආපසු ගෙවීම සඳහා උපදෙස් ලබාදීම.
    - ගොඩනැගිලි වැඩ සඳහා මිනුම්කරණ ක්‍රම පිළිබඳ උපදෙස් ලබාදීම. (SLS 573)
    - හිමිකම් ඉල්ලීම සම්බන්ධව කටයුතු කිරීම සඳහා ස්වාධීන මත හා උපදෙස් ලබාදීම.
    - ඉක්ටාඞ් සම්මත ප්‍රසම්පාදන ලේඛන, විශේෂිකරණය, උපදේශන ලේඛන සඳහා උපදෙස් ලබාදීම.

2. **ආරවුල් ස්වභාවය අනුව ආරවුල විසඳීම සඳහා මැදිහත්වීම / සුසාධ්‍යකරණය හා තීරකයන් පත් කිරීම.**
3. **ඉක්ටාඞ් ඉදිකිරීම් සංඛ්‍යාලේඛන මාසිකව ප්‍රකාශයට පත්කිරීම.**
4. **තෝරාගත් සුළු පරිමාණ ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණය, උපදේශන සේවා හා ස්වාධීන වාර්තා සැපයීම.**
5. **ඉක්ටාඞ් ප්‍රමිති ප්‍රසම්පාදන ලේඛන, ඉක්ටාඞ් සූත්‍ර ක්‍රම හා වෙනත් අදාළ ප්‍රකාශන ප්‍රකාශයට පත්කිරීම / සංශෝධනය කිරීම හා පරිවර්තනය.**
6. **තොරතුරු ලබාදීම සහ දැනුම බෙදාහදා ගැනීම සඳහා සුදුසු මාතෘකාවන්ට අදාළව සම්මන්ත්‍රණ පැවැත්වීම.**

### 5.1.1 ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපදේශන සේවා සැපයීම.

උපදේශක සේවා අංශය මඟින් ප්‍රසම්පාදන ලේඛන සැකසීම, කොන්ත්‍රාත් පරිපාලනය, ආරවුල් සමථයට පත්කිරීම, ඉක්ටාඞ් ක්‍රමවේදය හා ඉක්ටාඞ් සම්මත ප්‍රසම්පාදන ලේඛන විශේෂකරණයන් ආදිය සඳහා උපදේශන සේවා ලබාදීම ආදී කර්තව්‍යයන් සිදු කෙරේ. 2013 වර්ෂය තුළදී සේවාදායකයන්, උපදේශකයන්, කොන්ත්‍රාත්කරුවන් විසින් පෞද්ගලිකව පැමිණීමෙන් දුරකථනය මගින් හා ලිඛිතව අංශය වෙත ඉදිරිපත් කෙරුණු ඉල්ලීම්වලට අනුව මෙවැනි උපදේශන සේවා 280 පමණ ප්‍රමාණයන් ලබාදෙන ලදී.

දෙන ලද විශේෂඥ උපදෙස්,

- අධ්‍යාපන සේවකයින්ගේ සීමිත ඉතුරුම් හා ණය දෙන සහයෝගිතා සංගමය
- පෙඩිගා ඉදිකිරීම්
- පරමාණුගත බලශක්ති අධිකාරිය

### 5.1.2 ආරවුලේ සවභාවය අනුව ආරවුල විසඳීම සඳහා සුසාධ්‍යකරණය, මැදිහමත්වීම හා තීරකයන් පත් කිරීම

ගිවිසුම් ලේඛන, ගෙවීම හා කොන්ත්‍රාත් පරිපාලනය සම්බන්ධ ආරවුල්වලට මුහුණපාන කොන්ත්‍රාත්කරුවෝ විශාල සංඛ්‍යාවක් මෙම අංශයෙන් /උපදෙස් පැතූහ. ඇතැම් අවස්ථාවලදී ආරවුලට සම්බන්ධ පාර්ශවයන් කැඳවා විසඳුමකට පැමිණීම පිණිස සාකච්ඡා කරන ලදී.

2013 වර්ෂය තුළදී නිරාකරණය කෙරුණු ප්‍රධාන ආරවුල් නම්,

- මීගමු බස් පර්යන්තය
- ජාතික ඉතිරි කිරීම් බැංකුවේ ඉදිකිරීම් වැඩ සඳහා උපදෙස් සැපයීම
- ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය
- ශ්‍රී ලංකා ටෙනිස් සංගමය
- රඹුක්කන බස් පර්යන්තය
- බුද්ධිමය දේපළ අලෙවිකිරීම් මධ්‍යස්ථානයේ අළුත්වැඩියාව

කොන්ත්‍රාත් පාර්ශවකරුවන්ගේ ඉල්ලීම පරිදි 2013 වර්ෂය තුළදී තීරකයන් 12 දෙනෙකු ඉක්ටාඩ්විසින් පත්කර ඇත. (කරුණාකර ඇමුණුම බලන්න). 2013 වසර සඳහා ඉක්ටාඩ් තීරකයන්ගේ සංචිතය සඳහා ලැබුණු අයදුම්පත් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට 37 දෙනෙකු තෝරාපත් කරගන්නා ලදී. එම තීරකයන්ගේ ලැයිස්තුව දෙසැම්බර් මාසයේදී අන්තර්ජාලයට යොමු කර ඇත.

### 5.1.3 ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම

තාක්ෂණික නොවන රාජ්‍ය සංවිධාන ඔවුන්ගේ ගොඩනැඟිලි ව්‍යාපෘති සඳහා මෙම අංශයෙන් ව්‍යාපෘති කළමනාකරණ සේවා ඉල්ලා සිටියි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උපදෙස් ලබාදීම (කොන්ත්‍රාත්කරුවන් හා උපදේශකයන් තෝරා ගැනීම සඳහා ප්‍රසම්පාදන ලේඛන පිළියෙල කිරීම හා ලැබී ඇති ලංසු ඇගයීම ඇතුළුව) ගිවිසුම් පරිපාලනය හා ඇතැම්විට ගෙවීම් සඳහා නිර්දේශ කිරීම ද මෙම සේවාවන්ට අයත් වේ.

ප්‍රධාන සංවිධාන නම්,

- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව
- මධ්‍යම පරිසර ව්‍යාපෘතිය
- තොරතුරු දෙපාර්තමේන්තුව
- ජාතික පශ්චාත් පාරිභෝජන ප්ලාස්ටික් කසළ කළමනාකරණ ව්‍යාපෘතිය (ව්‍යාපෘති 2 )
    - කඩුවෙල නගර සභාව
    - මාතර නගර සභාව
- ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය
- ඉඩම් පාරිභෝජන ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව

### 5.1.4 ඉක්ටාඩ් මාසික ඉදිකිරීම් සංඛ්‍යා ලේඛන ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.

2013 වසර තුළ ඉක්ටාඩ් ඉදිකිරීම් සංඛ්‍යා ලේඛන ප්‍රකාශන 12 ක් ප්‍රකාශයට පත් කර ඇත. අමුද්‍රව්‍ය වල මිළ ගණන්, කම්කරු වේතන සහ යන්ත්‍රෝපකරණ කුළියට ගැනීම පිළිබඳ තොරතුරු එක්රැස් කර ඒවා පරීක්ෂා කොට මනා විශ්ලේශණය කර ඉහත ප්‍රකාශන එළි දක්වා ඇත. ඉන් පිටපත් 1804 ක් පමණ මෙම වසර තුළදී සේවා දායකයන්, උපදේශකයන් සහ කොන්ත්‍රාත්කරුවන්ට අලෙවිකොට ඇත. ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා යොදන යෙදවුම් වල මිල උච්චාවචනය ගණනය කිරීම සඳහා මෙම ප්‍රකාශ වල ඉදිරි පත් කර ඇති සංඛ්‍යා ලේඛන උපයෝගී කරගනු ලබයි.

### 5.1.5 ඉක්ටාඩ් ප්‍රකාශන සංශෝධනය කිරීම හා කෙටුම්පත් කිරීම.

ඉක්ටාඩ් ප්‍රකාශන පිළිබඳ ක්‍රියාකාරී කමිටුව වෘත්තිය සංවිධානවලින් නම් කරනු ලැබූවන්ගෙන් සමන්විත වන අතර, එයට ඉක්ටාඩ් ප්‍රකාශන සංශෝධනය කිරීමේ හා කර්මාන්ත ක්ෂේත්‍රයට නව ප්‍රකාශන එළි දැක්වීමේ වගකීම පැවරේ. නව ක්‍රියාකාරී කමිටුවේ කාර්යයන් වනුයේ ඉක්ටාඩ් ප්‍රකාශන සංශෝධන

සම්බන්ධව මග පෙන්වීම හා තීරණ ගැනීම, නව ලේඛන ප්‍රකාශනයට පත්කිරීම සුදුසු ක්ෂේත්‍ර හඳුනා ගැනීම, ඉක්ටාඩ් ප්‍රකාශන සංශෝධනය හා යාවත්කාලීන කිරීම සඳහා උප කමිටු පත්කිරීම, ඉක්ටාඩ් ප්‍රකාශනයන්ට අදාල සංශෝධනයන් කෙටුම්පත් කිරීම ගැටළු සඳහා තීරණ ගැනීම සඳහා සම්පත් දායකයින් හඳුනා ගැනීම හා අනුමත කිරීමයි.

නව ලේඛන කෙටුම්පත් කිරීම හා පවතින ලේඛන සංශෝධනය කිරීම සඳහා සම්පත් දායකයින්ට මග පෙන්වීම, සම්පත් පුද්ගලයන් විසින් ඉදිරිපත් කරන කෙටුම්පත් සමාලෝචනය කිරීම හා අවසාන කෙටුම්පත නිර්දේශ කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවට ඉදිරිපත් කිරීම යනාදිය සඳහා ක්‍රියාකාරී කමිටුව විසින් උප කමිටුව පත්කරනු ලබයි.

2013 වසර තුළදී ග්‍රන්ථ 2 ක් සංශෝධනය කරන ලද අතර නවතම ලේඛනයක් කෙටුම්පත් කරන ලදී.

- ICTAD/DEV/16 - කොන්ක්‍රීට් කුළුණු ශක්තිමත් කිරීම සඳහා වූ විදිපිරි ටැඹ සඳහා වූ පිරිවිතරයන්.
- ICTAD/DEV/17 - ගොඩනැගිලි සහ සිවිල් ඉන්ජිනේරු වැඩ සඳහා වැඩබිම් පරීක්ෂාවන් සඳහා පිරිවිතරයන්.
- ICTAD/ADV/01 - ලැයිස්තුගත ඉක්ටාඩ්(ICTAD) තීරකයන් සඳහා නිර්නායකයන්.

### 5.1.6 සම්මන්ත්‍රණ පැවැත්වීම

මෙම අංශය මගින් පහත මාතෘකා යටතේ සම්මන්ත්‍රණ 04 ක් පවත්වා ඇත.

- වෘත්තීමය අචාරධර්ම පිළිබඳ සම්මන්ත්‍රණය (2013 මැයි 30)
- ඉක්ටාඩ් මිළ උච්චාවචන සූත්‍රය (2013 ජූනි 11)
- ඉදිකිරීම් දීමාන ඉල්ලීම් සහ ආරවුල් නිරාකරණය (2013 අගෝස්තු 02)
- ඉදිකිරීම් අවධානම සහ රක්ෂණය (2013 දෙසැම්බර් 03)

### 5.1.7 **තීරක පුහුණු කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව**

සම්මන්ත්‍රණයට යොමු වීමට පෙර විකල්ප ආරවුල් විසැඳීමේ ක්‍රියාදාමයන් ලෙස සහ ඒ සඳහා වඩාත් සුදුසු වූ ක්‍රියාපටිපාටියන් වශයෙන් "සමථකරණය" යන ක්‍රමවේදය ඉක්ටාඩ් විසින් තම සම්මත ප්‍රසම්පාදන ලේඛනයන්හි හඳුන්වා දී ඇත. "සමථකරණයෙහි" අර්ථය වන්නේ කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක වෙමින් තිබියදීම ආරවුල සඳහා කඩිනම් විසඳුමක් ලභාකර ගැනීම වේ. ඉක්ටාඩ් සම්මත ප්‍රසම්පාදන ලේඛනයන්ට අනුව තීරකයා හෙවත් විනිශ්චයකරුවා අදාළ කරුණ පිළිබඳව වෘත්තීමය අත්දැකීම් වලින් යුත් අයෙකු විය යුතු අතර කොන්ත්‍රාත් ලිපිලේඛන අර්ථ දන්වන්නෙකු නොවිය යුතුය.

සමථකරණය සඳහා තීරක පුහුණු කරුවන් පුහුණු කිරීමේ පාඨමාලාව සඳහා යෝජනා ආසියානු කළාපයෙන් කැඳවන ලද අතර ඒ සඳහා යෝජනා දෙකක් ලැබී තිබේ. තීරකයන් සඳහා වන වරලත් ආයතන මැලේසියානු ශාඛාව, (CIArb) වෙත 2013 වසරෙහි නොවැම්බර් මස 22 දින උපදේශනයන් ලබාදී ඇත .

### 5.1.8 **තේමා උද්‍යානය**

ඉදිකිරීම් තාක්ෂණ උද්‍යානය යනු ඉක්ටාඩ්, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සහ NERDC ආයතනයේ එකමුතුවෙන් හඳුන්වා දෙනු ලබන වැඩ සටහනකි. SEC විසින් 2013 වසරෙහි වෙළඳ ප්‍රදර්ශන ශාලාව, අධ්‍යාපන ප්‍රදර්ශන ශාලාව, බොජුන් හල් වලින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර එය 2014 මාර්තු මස 31 වැනි දිනට නිම කරන ලදී.

## 5.2 සංවර්ධන අංශය

### 5.2.1 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා වන ජාතික ලියාපදිංචි කිරීමේ හා වර්ගීකරණය කිරීමේ වැඩ පිළිවෙල.

කිසියම් කොන්ත්‍රාත්තුවක් පිළිබඳ විශේෂ වර්ගීකරණයන් නොකර කොන්ත්‍රාත්කරුවෙකුට සාමාන්‍ය ධාරිතාව මත ඉටු කළ හැකි විවිධ මට්ටම් වල ව්‍යාපෘතීන්ගේ හැකියාව තීරණය කිරීමේ සාමාන්‍ය ලියාපදිංචිය වේ. කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණික හා මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම මගින් ලියාපදිංචිය හා වර්ගීකරණය කිරීම තීරණය කෙරේ.

2013 වසර තුළ නව ලියාපදිංචි කිරීමේ 551 ක් නිකුත් කළ අතර කොන්ත්‍රාත්කරුවන් 337 දෙනෙකුගේ ශ්‍රේණි ඉහළ දමා ඇත. එසේම ලියාපදිංචිය අලුත් කිරීමේ 651 ක්ද සිදුකරන ලදී.

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා වන නිර්ණායන අළුත් කිරීම පිණිස ඒ ඒ අංශයන්ට අදාළනිපුණතාවය ලබාගන්නවුන්ගෙන් යුත් ප්‍රතිශෝදන සංචිතයන් පත් කරන ලදී. ප්‍රධාන (ගොඩනැගිලි සහ සිවිල්), විශේෂ (විද්‍යුත් යාන්ත්‍ර), විශේෂ (නිමැවුම් සහ වෙනත් විශේෂ කාර්යයන්).පසුගිය වසරෙහි සිදු කරන ලද ප්‍රතිශෝධනයන් තවමත් සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇත.

ප්‍රධාන ඉදිකිරීම් අංශයන් සඳහා (ගොඩනැගිලි සහසිවිල්ඉංජිනේරු) - C, විද්‍යුත් හා යාන්ත්‍රික – EM සහ නිමැවුම් – F වන ලියාපදිංචි ගාස්තු ප්‍රතිශෝධනය2012 වසරේ අවසන් භාගයේ සිට ක්‍රියාත්මක වන පරිදි හඳුන්වා දී ඇත. මෙම ප්‍රතිශෝධනයන් සමඟම ලියාපදිංචි කාළ සීමාවේ වලංගුභාවය වසර 02 සිට 03 දක්වා දීර්ඝ කර ඇත.

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංවර්ධනය සඳහා ඔවුන් දැනුම හා හැකියාවන් වර්ධන වැඩමුළු/සම්මන්ත්‍රණ සඳහා සහභාගි වීම වෙනුවෙන් ලකුණු ලබාදීමේ අඛණ්ඩ නිපුණතා වර්ධන වැඩ පිළිවෙලක්ද දියත් කොට ඇත. මෙමසීසීඩීඅඛණ්ඩ නිපුණතා වර්ධන ලකුණු ලබාදීමේ පරිපාටිය ***$C_1$***ශ්‍රේණියේ සිට ***$C_5$*** ශ්‍රේණිය දක්වා ලියාපදිංචි වීමේදී ***2013*** ජනවාරි සිට බලපැවැත්වෙන පරිදි අනිවාර්ය කොට ඇත.

**කොන්ත්‍රාත්කරුවන් (මාර්ග ගත ) සහ ප්‍රලේඛන ව්‍යාපෘතිය සඳහා ජාල පදනම් ලියාපදිංචි ක්‍රියාවලිය**

මෙම ව්‍යාපෘතිය 2013 සැප්තැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි දියත් කොට ඇත.

මහා භාණ්ඩාගාරය සතු අරමුදල් භාවිතා කොට මෙම ක්‍රියාවලිය ක්‍රියාත්මක කර ඇත. මෙම කර්මාන්තයේ නියැලී සිටින සියළුම පාර්ශවකරුවන්ගේ දැඩි අවශ්‍යතාවයන් වන්නේ ගමනා ගමනය සඳහා ගතවන කාලය සහ වෙනත් පිරිවැය අවම කර ගැනීම සඳහා මාර්ග ගත ක්‍රමවේදය භාවිතා කිරීමයි. කඩදාසි භාවිතය සහ ගබඩාකරණ පහසුකම් සඳහා වැයවන පිරිවැය අවම කර ගැනීමට ප්‍රලේඛන ක්‍රමවේදය ද මේ සඳහා උපයෝගී කොට ඇත. ප්‍රලේඛන මෙහෙයුම් වසර පුරාවට දියත් කරන ලදී.

### 5.2.2 ඉදිකිරීම් විශිෂ්ටතා වෙනුවෙන් ඉක්ටාඩ් සම්මාන ප්‍රධානය

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවය හා විශිෂ්ඨත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉක්ටාඩ් විසින් 1990 වසරේදී ආරම්භ කරන ලද වාර්ෂික සම්මාන ප්‍රධාන වැඩසටහන අඛණ්ඩව 23 වන වරටත් 2013 වසරේදී ද පවත්වා ඇත. මෙම සම්මාන ප්‍රධාන වැඩ පිළිවෙල මගින් ඉදිකිරීම් කළමනාකරණයේ විශිෂ්ඨ කුසලතාවය, තාක්ෂණිකතා හා තත්ත්ව නිපුණතාවයෙන් යුත් උසස් වෘත්තීමය භාවය, නම්‍ය හා යෝග්‍ය තාක්ෂණය හඳුන්වාදීම හා වෘත්තීය කාර්මිකයන් පුහුණුව සඳහා සහභාගිත්වය ආදිය හඳුනාගෙන එවා ඇගයීමට ලක්කරනු ලැබේ.

2013, වසර තුළ වැඩබිම් පරික්ෂාවන් 23 ක් ද, කමිටු රැස්වීම් ද පවත්වා ඇත. ඉදිරිපත් කිරීම් 03 ක් වසර අගදී පැවැත්වූ අතර ඉක්ටාඩ් සහ ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ සහයෝගිත්වයෙන් සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී 2013 වසරේ පැවැත්වූ මහාභිමානී සම්මාන උළෙලේදී මෙම සම්මානයන් පිරිනමනු ලැබ ඇත. පසුගිය වසරවල අවධානයට ලක්නොවුනු ශිල්පීන් ඛණ්ඩයන් උසස් කිරීම ප්‍රමුඛ කොට නිර්මාණය හා සැළසුම් ගත නව්‍ය සංකල්පයකි මාහාභිමානී.

**ඉදිකිරීම් විශිෂ්ඨතාවය සඳහා වූ ජාතික**

**සම්මාන ප්‍රධානය – 2013**

**ජයග්‍රාහකයන් - ගොඩනැඟිලි අංශය**

| වසර | සම්මාන වාර්ගය | ව්‍යාපෘතිය සහ ලබන්නා |
|---|---|---|
| 2013 | විශිෂ්ටතාවය | පරිපාලන සංකීර්ණ ගොඩනැඟිල්ල, සෙත්සිරිපායඅධියර II, සෙත්සිරිපාය, බත්තරමුල්ල. - මාගා ඉංජිනේරු (පුද්ගලික) සමාගම. |
| | විශිෂ්ටතාවය | හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය අධියර I, පරිපාලන සංකීර්ණය. - මාගා ඉංජිනේරු (පුද්ගලික) සමාගම.<br>සෙන්ටර පාසිකුඩා රිසෝට් සහ ස්පා - තුඩාවේ බ්‍රදර්ස් (පුද්ගලික)සමාගම. |
| | විශිෂ්ටතාවය | ජායා බේ හොටෙල්, බේරුවල ඉන්ටර්නැෂනල් කන්ස්ට්‍රක්ෂන් කොන්සෝටියම් (පුද්ගලික) සමාගම. |
| | කුසලතා | වෛද්‍යා නෙවිල් ප්‍රනාන්දු ශ්‍රී ලංකා – රුසියන් මිත්‍රත්ව ශික්ෂණ රෝහල, මාලඹේ. - ආර්.එන්. ක්‍රන්ස්ට්‍රක්ෂන්ස් (පුද්ගලික) සමාංගම. |
| | කුසලතා | හික්කඩුව සංස්කෘතික කේන්ද්‍රය සහ සුනාමි පරියේෂණ මධ්‍යස්ථානය, (සුනාමි අනුස්මරණ කෞතුකාගාරය) අධියර I, - පේරලිය, හික්කඩුව. - ශ්‍රී පාලි කොන්ත්‍රාත් (පුද්ගලික) සමාගම. |
| | කුසළතා | ගම්පහ සෙලින්කෝ ලයිෆ් ආයතනය සඳහා සෙලින්කෝ ශාඛා ගොඩනැඟිල්ල. - සතුට බිල්ඩර්ස් (පෞද්ගලික) සමාගම. |
| | කුසළතා | දෙහිවල මිශ්‍ර සංවර්ධන නිවාස සංකීර්ණය - එල්.එච්. පියසේන (පෞද්ගලික) සමාගම. |
| | ඇගයීම් සහතිකය | |

**ජයග්‍රාහකයන් - සිවිල් ඉංජිනේරු අංශය**

**කාර්යඵල සම්මාන**

**I ඛාණ්ඩය - රු.මි.: 1000 වැඩි වටිනාකමින් යුත් ව්‍යාපෘති සඳහා**

| | | |
|---|---|---|
| 1 | හම්බන්තොට වලවේ ගඟ හරහා ලවණතා බාධක දොරටුව නිර්මාණය කිරීම, ඉදිකිරීම් සහ නිමකිරීම කොන්ත්‍රාත් අංක SB/UWS/PB2/HAM/ICB | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම |
| 2 | උතුරු කොළඹ ජල සැපයුම් ව්‍යාපෘතිය - අධියර II, මහර සහ බියගම ජල සැපයුම් පද්ධති ඉදිකිරීම. කොන්ත්‍රාත් අංකය. WSDP/TNC/C2 | සියෙරා කන්ස්ට්‍රක්ෂන් (පෞද්ගලික) සමාගම. |

| | | |
|---|---|---|
| 3 | වාලෙයි සිට අරලි දක්වා B437 මාර්ගය ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීමේ උතුරු මාර්ග සම්බන්ධන ව්‍යාපෘතිය (NRCP) (0+000 km-27+400 km) | KDA. වීරසිංහ සහ (පුද්) සමාගම. |
| 4 | කි.මී 63 නුවර – යාපනය පාර (A009) 257 Km සිට 320 Km දක්වා ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත් අංකය. RDA/NRRP/CGF/CIB | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 5 | පරන්තන් - මුලෙයිතිව් මාර්ගය(A035) 25+5 Km 00.00Km to 30.00 Km උප කොන්ත්‍රාත් වැඩ කොන්ත්‍රාත් අංකය . RDA/NRIP/PRP1/C11 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 6 | තෝනිගල සිට ගල්කුලම දක්වා මාර්ග බණ්ඩ A009 දක්වා ප්‍රතිසංස්කරණය සහ අළුත්වැඩියාව (98+000 Km – 122+170 Km) කොන්ත්‍රාත් අංකය. RDA/NRCP/ICB/ADB/CP-02 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 7 | නවත්කුලි සිට කරෙයිතිව් ජැටිය දක්වා මාර්ග බණ්ඩ A032 ප්‍රතිසංස්කරණය සහ අළුත්වැඩියාව (00+000 Km – 17+400 Km) කොන්ත්‍රාත් අංකය . RDA/NRCP/ICB/ADB/CP-04 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |

**<u>II බාණ්ඩය - රු.මි. : 500 ත් 1000 අතරවටිනාකමකින් යුත් ව්‍යාපෘති සඳහා</u>**

| | | |
|---|---|---|
| 8 | අඹේපුස්ස – කුරුණෑගල – ත්‍රිකුණාමලය පාර (A06) from 157+000 Km to 167+280 Km සහ කන්තලේ සිට ගන්තලාව මාර්ගය (B196) | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම |
| 9 | අඹේපුස්ස Rehabilitation– කුරුණෑගල - ත්‍රිකුණාමලය මාර්ග බණ්ඩය ප්‍රතිසංස්කරණය / වැඩිදියුණුව (A06) from 167+280 Km සිට 178+000 - කොන්ත්‍රාත් අංකය. WB/RSAP II/KT/02 | තුඩාවේ බ්‍රදර්ස් (පුද්) සමාගම. |
| 10 | ලෝක බැංකු ආධාර යටතේ ප්‍රාදේශීය මාර්ග ව්‍යාපෘතිය. ඌව පළාත, ක්‍රෙඩිට් අංකය 4630 LK පැකේජය "A" කොන්ත්‍රාත් අංකය. ඌව -04: හග්ගල – ෆෝඩ් මැග්ඩොනල්ඩ් පාර | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 11 | හක්මන – බෙලිඅත්ත – තංගල්ල මාර්ග ව්‍යාපෘතිය වැඩිදියුණුව සහ ප්‍රතිසංස්කරණය කිරීම 11+500 Km සිට 19+140 Km කොන්ත්‍රාත් අංකය. RDA/RNIP/PRP1/CIA-1 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 12 | අනුරාධපුරය සිට රඹෑව දක්වා A020 මාර්ග බණ්ඩය ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණුව (0+0000 Km – 14+500 Km) කොන්ත්‍රාත් අංකය. RDA/NRCP/ICB/ADB/CP-03 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 13 | මිනිපේ සිට කයිතඩි මාර්ග බණ්ඩය ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණුව (0+000 Km – 14+020 Km) කොන්ත්‍රාත් අංකය. RDA/NRCP/ICB/ADB/CP -05 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 14 | මාන්කුලම් සිට මුලතිව් දක්වා මාර්ග බණ්ඩය ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම් (0+000 Km – 13+000 Km) කොන්ත්‍රාත් අංකය. RDA/NRCP/ICB/ADB/CP-07 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |

**<u>බණ්ඩය III –රු.මි. 100 ත් 500 අතර වටිනාකමින් යුත් ව්‍යාපෘති සඳහා</u>**

| | | |
|---|---|---|
| 15 | ආසියානු සංවර්ධන බැංකුආධාර යටතේ නැගෙනහිර සහ උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය – අධියර I කොන්ත්‍රාත් අංකය. ENCPRP/NCB/EPBP/02 | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම |
| 16 | කොළඹ වරායේ නව උතුරු දියකඩනයේ යුනිට් බහාලුම් පර්යන්තයේ හදිසි අළුත්වැඩියාව. | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම |

| | | |
|---|---|---|
| 17 | වන්කලෙයි ශාඛාව සමඟ මුරුන්කන් සිට මන්නාරම දක්වා ප්‍රධාන ජල සම්ප්‍රේෂනය සඳහා HDPE, DI pipes සැපයීම සහ ඇතිරීම. කොන්ත්‍රාත් අංකය.P&D/C,N/ADB 5/2010/01 | KDA. වීරසිංහ සහ (පුද්) සමාගම. |
| 18 | කෝට්ටේ පාර්ලිමේන්තු සංකීර්ණයේ නො. 1/1 ආරක්ෂක පිවිසුම් මාර්ගය පුළුල් කිරීම. | CML-MTD ඉදිකිරීම් සමාගම. |
| 19 | ආසියානු සංවර්ධන බැංකුවේ අධාර යටතේ නැගෙනහිර සහ උතුරු මැද පළාත් මාර්ග ව්‍යාපෘතිය – අධියර I පැකේජය EP-03 කොන්ත්‍රාත් අංකය. ENCPRP/NCB/EP/03 | V V කරුණාරත්න සහ සමාගම |
| 20 | ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ගැටුම්වලින් හානියට පත් කළාප සඳහා හදිසි අවශ්‍යතා ව්‍යාපෘතිය සඳහා පේදුරුතුඩුව, ජල සැපයුම් පද්ධතියේ සිවිල් වැඩ කටයුතු කොන්ත්‍රාත් අංක . P&D/C,N/ADB/CARE/PP/2010/01 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |
| 21 | බෝපලේ හන්දිය - කිරි ඉබ්බන්ආර – උඩමළුර මාර්ග සංවර්ධනය0+000 Km - 8+500 Km කොන්ත්‍රාත් අංක. RDA/RNIP/PRP1/CIA-2 | මාගා ඉංජිනේරු (පුද්)සමාගම. |

**IV බාණ්ඩය – රු.මි.Rs: 100 දක්වා වටිනාකමකින් යුත් ව්‍යාපෘති සඳහා**

| | | |
|---|---|---|
| 22 | දෙමළවාඩිය අම්බාන ඔපල්ගල මාර්ගය ප්‍රතිසංස්කරණය - කොන්ත්‍රාත් අංකය. ENDRP-07 | ගාමිනී කන්ස්ට්‍රක්ෂන්ස් |

**ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නම්‍යකරණ තාක්ෂණය සඳහා වූ සම්මාන**

| | | |
|---|---|---|
| 23 | කොළඹ වරායේ නව උතුරු දියකඩනයේ යුනිට් බහාලුම් පරියන්තයේ අත්‍යවශ්‍ය අළුත්වැඩියාව | ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම |
| 24 | යෝජිත තට්ටු පහේ සුපිරි වෙළඳ සංකීර්ණයේ අත්තිවාරම සඳහා (cast-in-situ) වාත්තු කරන ලද කුළුණු වලින් යුත් යෝජිත හයිබ්‍රිඩ් ෆ්‍රැන්චර් ග්‍රවුටින් (දියර බදාම) | සොයිල් ටෙක් (පුද්) සමාගම |

**හරිත ඉදිකිරීම් සම්මාන**

| වසර | සම්මාන වර්ගය | ව්‍යාපෘතිය සහ ලබන්නා |
|---|---|---|
| 2013 | විශිෂ්ටතා | ව්‍යාපෘතිය සහ ලබන්නා හැටන් නැෂනල් බැංකුව, නිට්ටඹුව තුඩාවේ බ්‍රදර්ස් (පුද්ගලික) සමාගම |
| | විශිෂ්ටතා | CECB මූලස්ථාන කර්යාලය – අදියර II<br>මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාලය |

## 5.2.3 පාරිභෝගික පැමිණිලි මෙහෙයවීම

කොන්ත්‍රත්කරුවන් පිළිබඳ ලැබෙන පැමිණිලි විභාග කිරීම සඳහා ඉදිකිරීම් සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය, ශ්‍රී ලංකා කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමය, ඉක්ටාඩ් ආයතනය ආදායෙහි සාමාජිකයන්ගේ සැඳුම්ලත් මූලික විමර්ශන මණ්ඩලය පත් කරන ලදී.

2013 වසර තුළදී,

| විස්තරය | 2013 ගැටළු | % |
|---|---|---|
| ඉක්ටාඩ් තොරතුරු සඳහා පමණක් | 20 | 43% |
| කොන්ත්‍රාත්කරුවන්ගෙන් නිදහසට කරුණු විමසීම සහ දිය යුතු පිළිතුරු | 17 | 36% |
| නිරාකරණය කරන ලද | 8 | 17% |
| ඉක්ටාඩ් සඳහා වඩාත් අදාල | 2 | 4% |
| මුළු එකතුව | 47 | 100% |

### 5.2.4 ඉක්ටාඩ් ජර්නලය – 2013

2013 වසරේ ප්‍රකාශයට පත් කරන ලද ඉක්ටාඩ් ජර්නලය මහාභිමානී සම්මාන ප්‍රධානෝත්සවයේදී එළි දක්වන ලදී. මෙම ජර්නලයේ අරමුණ වන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ගුණාත්මක බවට අදාළ තොරතුරු ව්‍යාප්ත කිරීමයි. මෙමගින් ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා ප්‍රයෝජනවත් තොරතුරු හා ලිපි ඉදිරිපත් කෙරේ.

මෙම වසරේදීත් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලෙන්නන් හා වෘත්තිකයන්ගේ උපරිම සහයෝගයෙන් හා කැපවීමෙන් ඉක්ටාඩ් ඉතිහාසයේ තෙවන වරටත් ජාත්‍යන්තරව පිළිගත් ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත්විය.

### 5.2.5 ඉක්ටාඩ් පරිගණක පද්ධතිය

පහත සඳහන් අංශයන්ගෙන් සැඳුම්ලත් පරිගණක පද්ධතිය සහ වෙබ් අඩවිය සතුටුදායක මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ.

1. ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ජාල පදනම් මාර්ගගත ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය නිම කරන ලදී. (C1,C2 සහ C3 නැවත වරක් අලුත් කිරීම)
2. ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා මාර්ගගත ගෙවීමේ ක්‍රමවේදය ඇතුලත් ව්‍යාපෘතියක් අරඹන ලදී.
3. සංවර්ධන අංශයෙහි ලේඛන සංරක්ෂණ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී.
4. ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා මාර්ගගත නිරීක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදන ලද.
5. ජාල පදනම් ලියාපදිංචිවීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍යකරන පරිගණක ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර සහ අනෙකුත් අවශ්‍ය උපකරණ හා ද්‍රව්‍ය මිලදී ගන්නා ලදී.
6. අනෙකුත් අංශයන්ගේ කාර්යයන් පහසුවෙන් කරගෙන යාම සඳහා එම අංශවලට ද පරිගණකයන් මිලදී ගන්නා ලදී.

### 5.2.6 2013 වසරේ පැවැත්වූ සම්මන්ත්‍රණ / සමුළු / වැඩමුළු

වසර තුළ පහත සඳහන් වැඩසටහන් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී.

1. ඉදිකිරීම් කර්මාන්තයේ වෘත්තීමය ආරක්ෂාව - 2013 මාර්තු 23
2. ඉදිකිරීම් කර්මාන්තයේ නව බඳුකරණය පිළිබඳ සම්මන්ත්‍රණය - 2013 මැයි 27
3. ඉදිකිරීම් කර්මාන්තයේ පාරිසරික හිතෛෂීභාවය සඳහා පිරිසිදු නිෂ්පාදන පිළිබඳව සම්මන්ත්‍රණ පැවැත්වීම – 2012 සැප්තැම්බර් 07
4. මෙම සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමේ අරමුණ වන්නේ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ තොරතුරු ව්‍යාප්ත කිරීම හා ආදායම් ඉපයීමයි.

### 5.3 විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

මෙම අංශයේ මෙහෙවර වනුයේ ඉදිකිරීම් කර්මාන්තයේ කුසලතා බෙදාදීම සහ මෙහෙයුම් කටයුතු ලෙසද දැනුම, නඩත්තුව හා ඉදිකිරීම් උපකරණ කළමනාකරණය තුළින් දක්ෂ ශ්‍රම බලකායක් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුල බිහිකිරීම සහ එමඟින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායිත්වයේ මැනිය හැකි වර්ධනයන් ලබා ගැනීමයි.

**ඉදිකිරීම් උපකරණ පුහුණු අංශය CETRACඅරමුණු වනුයේ:**

1. ස්වකීය වෘත්තීය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට හැකි වන පරිදි ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මික ශිල්පීන්ගේ හා ක්‍රියාකරුවන්ගේ නිපුණත්වය ඉහළ දැමීම.

2. ස්වකීය කාර්යයන් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීම සඳහා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අධීක්ෂණ හා කළමනාකරණ කාර්ය මණ්ඩලයෙහි නිපුණතාවය ඉහළ දැමීම.


3. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන්නන් අතර නඩත්තු කිරීම් අවම කිරීමේ හා දියුණු කිරීමේ ක්‍රම යොදා ගැනීමෙන් අළුත්වැඩියා කටයුතු සඳහා යන පිරිවැය හා කාලය අවම කිරීමෙන් වැඩෙහි නිරත කාලය ඉහල නැංවීම.

4. ඉදිකිරීම් කර්මාන්තයට එක්වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මිකයන්ට හා ක්‍රියාකරුවන්ට ඉදිකිරීම් උපකරණ පිළිබඳව ක්‍රමවත් මූලික පුහුණුවක් ලබාදීම.

5. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේදී ආදර්ශ කර්මාන්ත ශාලාවක අවශ්‍ය පුහුණුව ලබා දීමෙන් ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කිරීමේ මධ්‍යස්ථානවල තත්ත්වය උසස් කිරීමෙහිලා කර්මාන්තයට සහාය දැක්වීම.

6. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ කාර්මිකයන්ගේ හා ක්‍රියාකරුවන්ගේ වෘත්තීය සඳහා වූ සමාජ පිළිගැනීම ඉහළ දැමීම.

CETRAC අංශය අංශ දෙකකින් සමන්විත වේ. එනම් ඉදිකිරීම් යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය (OTC) සහ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු කිරීමේ මධ්‍යස්ථානය. (CETRAC)




### 5.3.1 ක්‍රියාකරු පුහුණු ඒකකය

**මෙහෙවර:**

**"ඉදිකිරීම් කර්මාන්තයේ මැනිය හැකි ලෙස ඉහල ඵලදායිතාවයක් ළඟාකර ගැනීම අරභයා මෙහි නියැදි ශ්‍රම බලකායේ උන්නතිය සඳහා ඉදිකිරීම් කර්මාන්තයේ යන්ත්‍රෝපකරණ භාවිතය පිළිබඳ දැනුම, ඒවා පවත්වා ගැනීම සහ කුසලතාවය ලබාදීම"**

**අරමුණු:**

- යන්ත්‍රෝපකරණ ක්‍රියාකරුවන් ස්ථාපිත ජාතික කුසළතා තත්ත්වයනට සරිලන ලෙස පුහුණු කිරීම
- යන්ත්‍රෝපකරණ කළමනාකරණය සහ අධීක්ෂණ කළමනාකරණය පිළිබඳව පාඨමාලා පැවැත්වීම
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ පැවැත්වීම
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන්ගේ කාර්යය ඵලදායී ලෙස හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ හැකියාවන් ඉහළ නැංවීම
- ඉදිකිරීම් වැඩ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ කුළියට දීම

ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ ආයතනය ක්‍රෝලර් ට්‍රැක්ටර්ස්, ලෝඩර්ස්, එක්ස්කැවේටර්ස්, මෝටර් ග්‍රේඩර්ස් ආදී ඉදිකිරීම් උපකරණ විශේෂයෙන්ම තමාගේ ආරක්ෂාව, ප්‍රධාන නඩත්තුව සහ ක්‍රියාකරවීමේ ක්‍රම භාවිතය පිළිබඳව පුහුණුවක් ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදුකරයි. OTC සතුව ඉදිකිරීමේ උපකරණ 50 න් පමණ යුත් ඇණියකින් සමන්විත වන අතර ප්‍රමාණවත් තරම් පුහුණු කිරීමේ නිළධාරීන්ගෙන් සහ මාර්ගෝප දේශනයන්ගෙන් සමන්විත වේ.



පුහුණුවන්නන්ගේ පුහුණු කාලයෙන් 70% ක් ප්‍රායෝගික පුහුණුව සඳහා ද 30% ක් න්‍යායික පුහුණුව සඳහා ද වෙන්කර ඇත. සමහර ඉදිකිරීම් උපකරණ කුළියට දීම තුළින් ආදායම් උපදවන අතරම පුහුණුවන්නන්ට රැකියා අවස්ථාද එමඟින් ලබාදේ.

OTC ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයෙහි ආයතන පුහුණුව මෙන්ම රැකියා පුහුණුව ලබාදෙන පාඨමාලා වලින්ද සමන්විත වේ. ආයතනික පුහුණුවනිමකිරීමෙන් අනතුරුව අවම වශයෙන් මාස තුනකවත් ක්‍රියාකරු රැකියා පුහුණුව ලබා ගන්නා පුහුණුවන්නන්NVQ ජාතික වෘත්තීය සුදුසුකම සඳහා සුදුසුකම් ලබයි. ඉදිකිරීම් පුහුණුකරුවන්ට ජාතික වෘත්තිය පරීක්ෂණ සහ NVQ පරීක්ෂණය පැවැත්වීම සඳහා OTC ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානය NAITA ආයතන විසින් පිළිගෙන ඇත.

**වර්තමානයේදී OTCක්‍රියාකරුවන්** පුහුණු කිරීමේ ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්**:**

1 ප්‍රාථමික පුහුණුව
- 1.1 මූලික ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තුව

2 කුසලතා වර්ධනය
- 2.1 සැහැල්ලු ඉදිකිරීම් යන්ත්‍රොප්කරණ
- 2.2 ගොඩගසන ට්‍රැක්ටර්
- 2.3 ෆාර්ම් ට්‍රැක්ටර් (නවතම හඳුන්වාදීම )
- 2.4 මං රෝලරය (නවතම හඳුන්වාදීම)

3 පස් ඉවත් කරන උපකරණ මූලික මොඩියුල
- 3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්
- 3.2 වීල්ඩ් ලෝඩර්
- 3.3 මෝටර් ග්‍රේඩර්
- 3.4 හයිඩ්‍රොලික් එක්ස්කැවේටර්
- 3.5 බැකෝ ලෝඩර්

4 විශේෂිත උපකරණ
- 4.1 මොබයිල් ක්‍රේන්
- 4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්
- 4.3 ෆෝක් ලිෆ්ට්

5 වෘත්තීය පරීක්ෂණ
- 5.1 ජාතික වෘත්තීය පරීක්ෂණ

6 පාරිභෝගික අවශ්‍යතා මත සකස් කළ පුහුණු වැඩ සටහන්

මෙම අංශයෙන් පවත්වනු ලබන සියලුම පාඨමාලා සඳහා ගාස්තු අයකරන අතර සමහර පාඨමාලා සඳහා පාසල් හැරගියවුන් හා රැකියා වියුක්ත තරුණයන් අතර වැඩි ඉල්ලුමක් පවතී.

7 සම්මන්ත්‍රණ/වැඩමුළු

OTC ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ ආයතනය මගින් ඉදිකිරීම් කර්මාන්තයේදී භාවිතා කරන උපකරණ කළමනාකරණය කිරීම සහ අධීක්ෂණ වැඩසටහන් හෝ ඉල්ලුම මත කුසළතා පරීක්ෂණ පවත්වනු ලබයි.

**2013** වර්ෂයේ ඉලක්කගත පුහුණුවන්නන් ගණන සහ සෑම පුහුණු වැඩ සටහනකම ප්‍රතිඵල පහත දැක්වේ.

| | පුහුණු වැඩසටහන | අපේක්ෂිත ප්‍රමාණය | | සහභාගි වූ ප්‍රමාණය | |
|---|---|---|---|---|---|
| | | වැඩසටහන් ගණන | සහභාගිවූ ගණන | වැඩසටහන් ගණන | සහභාගිවූ ගණන |
| **1.0** | **ප්‍රාථමික පුහුණුව** | | | | |
| | 1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තුව | 24 | 480 | 18 | 408 |
| **2.0** | **කුසළතා සංවර්ධනය** | | | | |
| | 2.1 සැහැල්ලු උපකරණ | 12 | 36 | 1 | 15 |
| | 2.2 ට්‍රැක්ටර් | 12 | 36 | 1 | 1 |
| | 2.3 ස්වයං ධාවන රෝලර් | 12 | 24 | 4 | 7 |
| | 2.4 ගොඩ ගසන ට්‍රක් රථ | 12 | 12 | 2 | 2 |
| **3.0** | **පස් ඉවත් කරන උපකරණ මූලික මොඩියුල (HEMOT)** | | | | |
| | 3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර් | 12 | 12 | 3 | 10 |
| | 3.2 වීල් ලෝඩර් | 12 | 12 | 2 | 15 |
| | 3.3 මෝටර් ග්‍රේඩර් | 12 | 60 | 7 | 44 |
| | 3.4 හයිඩ්‍රොලික් ස්කැවේටර් | 12 | 60 | 9 | 63 |
| | 3.5 බැකෝ ලෝඩර් | 12 | 180 | 13 | 183 |
| **4.0** | **විශේෂිත උපකරණ** | | | | |
| | 4.1 මොබයිල් ක්‍රේන් | 12 | 36 | 4 | 10 |
| | 4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර් | 12 | 24 | 8 | 24 |
| | 4.3 ෆෝක් ලිෆ්ට් ඔපරේටර් | 12 | 24 | 5 | 15 |
| | **එකතුව** | **168** | **996** | **77** | **797** |




**ඉදිකිරීම් උපකරණ කුළියට දීම**

**OTC**ක්‍රියාකරු පුහුණු කිරීමේ ආයතනය විසින් අමතර ආදායමක් ආයතනයට ලබා ගැනීම සඳහා අමතර සේවා සැපයුමක් ලෙස ඉදිකිරීම් උපකරණ කුළියට දෙනු ලැබේ.

**ඉදිකිරීම් ව්‍යාපෘති**

OTC ක්‍රියාකරු පුහුණු කිරීමේ ආයතනය යන්ත්‍රෝපකරණ ක්‍රියාකරවීම සහ අනෙකුත් කාර්යයන් කිරීමෙහි ලා අත්දැකීම් සහිත පළපුරුදු කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ. මෙනිසා ශිෂ්‍යයන්ට රැකියා පුහුණු අවස්ථා ලබාදීම, මානව සම්පත් සංවර්ධනය, ආදායම් ඉපයීම වැනි කරුණු සඳහා පිටිවහලක් වී ඇත. හැකි සෑම අවස්ථාවක් ලබාදීම තුළින් යන්ත්‍ර සූත්‍ර භාවිතයේදී විශාල පිරිමැස්මක් ලබාගත හැකි වන්නේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට යන්ත්‍ර සූත්‍ර භාවිතා කිරීමේදී කාලය ඉතුරු කර ගැනීමට හැකි වන නිසාය.

<u>රොටවැව ප්‍රතිසංස්කරණය කිරීම</u>

2013 වසරේදී බකමූණ ප්‍රදේශයේදී ක්‍රියාකරු පුහුණු කිරීමේ ආයතනය මඟින් සිදු කරන ලද ව්‍යාපෘතියකි. ව්‍යාපෘතියේ වටිනාකම රු. මිලියන 2.8 වන අතර මෙය අළුතින් අනුයුක්ත කරන ලද කාර්ය මණ්ඩලයට ව්‍යාපෘති ක්‍රියාත්මක කරන අයුරු පිළිබඳ මනා අත්දැකීමක් ගෙන දෙන්නක් විය.

**2013වසර තුළ ඉපැයූ ආදායම්**

| කාර්ය විස්තරය | ආදායම (රු.) |
|---|---|
| සම්මන්ත්‍රණ ශාලා | 2,009.00 |
| පුහුණු වැඩසටහන් | 12,040,562.00 |
| යන්ත්‍රෝපකරණ කුළියට දීම | 7,858,681.00 |
| වෘත්තීය පරීක්ෂණ | 55,750.00 |
| ක්‍රියාකරුවන්ගේ හැඳුනුම්පත් | 225,400.00 |
| ඉදිකිරීම් ව්‍යාපෘති (රොටවැව) | 2,312,488.00 |
| විවිධ | 77,439.00 |
| **එකතුව** | **22,572,329.00** |

**'මහාභිමානී 2013'**


ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍ය ගරු විමල් වීරවංශ මැතිතුමාගේ සංකල්පයකට අනුව ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (ICTAD) සහ ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමයේ එකතුවෙන් 'මහාභිමානී 2013' සංවිධානය කරන ලදී. CETRAC, ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ පැවති තරඟයක් මගින් හොඳම ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රිකයා සහ ක්‍රියාකරු පුහුණු ආයතනයේ හොඳම හයිඩ්‍රොලික් එක්ස්කැවේටර් ක්‍රියාකරුවා තෝරා ගන්නා ලදී.

සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී දෙසැම්බර් 05 වැනි දින පැවති උත්සවයකදී අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් සම්මාන පිරිනමන ලදී.

## 5.3.2 ඉදිකිරීම්උපකරණ නඩත්තු කිරීම පුහුණු කිරීමේ අංශය

ඉක්ටාඩ් ආයතනයේ යාන්ත්‍රික පුහුණු අංශය වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), බත්තරමුල්ල, පැලවත්තේ ඩී.පී. විජේවර්ධන මාවතේ අංක.17 දරණ ස්ථානයේ පිහිටුවා ඇත. නවීන ඉදිකිරීම් උපකරණ නඩත්තුව හා අලුත්වැඩියාව පිළිබඳ ඕනෑම පුහුණු පාඨමාලාවක්පැවැත්වීමට මෙම අංශය හොඳින් සම්පාදනය කර තිබේ. තවද යාන්ත්‍රික හා සිවිල් ඉංජිනේරුවන්/ව්‍යාපෘති කළමනාකරුවන් සඳහා මෙහි පුහුණු පාඨමාලා පැවැත්වේ.







### 5.3.2.1 CETRAC පුහුණු වැඩසටහන්

ඉදිකිරීම්උපකරණ නඩත්තු සඳහාවූ CETRAC පුහුණු වැඩසටහන් 1996ඔක්තෝබර් සිට2001සැප්තැම්බර් දක්වා පැවති තාක්ෂණ සහයෝගිතා කාලපරිච්ඡේදයේදී ජපාන විශේෂඥයන්ගේ සහායෙන් දියුණු කරන ලදී.මූලිකවම CETRAC හි ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන් ආරම්භකර සාර්ථකව පවත්වාගෙන යනු ලබයි. ඒවා නම් වායුසමීකරණ පද්ධති ගොඩනැගීම, ජල පහසුකම් සහ අපවහන පද්ධති සහ ගිනි ආරක්ෂණ පද්ධති යනාදියයි.

### 5.3.2.2 කර්මාන්තයට පිවිසෙන නවකයන් සඳහා පැවැත්වෙන පාඨමාලා

තරුණයින්ගේ රැකියා වියුක්තියට පිළියමක් වශයෙන් කලින් පාසල හැරයන්නවුන් සඳහා වැඩි වෘත්තිය පුහුණු පාඨමාලා ප්‍රමාණයක් පැවැත්වීමට හා වැඩිදියුණු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2012 වර්ෂයේදී පහත සඳහන් පාඨමාලාවන් පවත්වන ලදී.

**මූලික යාන්ත්‍රනික පුහුණු පාඨමාලාව (BM)**

### 5.3.2.3 ඉදිකිරීම් යාන්ත්‍රික පුහුණු පාඨමාලාව

මූලික යාන්ත්‍රික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු (NAITA) සහයෝගය ඇතිව පවත්වනු ලැබේ. එය CETRAC මාස 9 ක ආයතනික පුහුණුවක් හා මාස 27 ක කර්මාන්තය තුළ රැකියා පුහුණුවකින්ද සමන්විත අවුරුදු තුනක පාඨමාලාවකි. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් පසු පාසල් හැරයන්නවුන් මෙම පාඨමාලාව සඳහා සුදුසු වේ. මෙම පාඨමාලාව නවීන ඉදිකිරීම් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු පිළිබඳ සියළු කරුණු ආවරණය කරයි. මීට වාර්ෂිකව පුහුණුවන්නන් 60 ක් බඳවා ගනී. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු NAITA මගින් පවත්වනු ලබන ජාතික වෘත්තීය පරීක්ෂණය සඳහා පෙනී සිටීමට මෙම පුහුණුවන්නන් සුදුසුකම් ලබන අතර වසර 2 ක පුහුණුවකින් පසු කාර්මික II ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබයි.

පුහුණුවන්නන් සඳහා රු. 1,000/= ක මාසික දීමනාවක් පාඨමාලා කාලය අතරතුර NAITA ආයතනය මගින් ගෙවනු ලබන අතර නොමිලේ නවාතැන් පහසුකම්, පාඨමාලා ද්‍රව්‍ය, වැඩමුළු පහසුකම් නිල ඇඳුම්, ආරක්ෂක උපකරණ ද ලබා දෙනු ලැබේ. සෑම වසරකදීම විවිධ කාණ්ඩ වලට අයත් පුහුණු කරුවන් 100 කට ආසන්න ප්‍රමාණයක් CETRAC හි මෙම ආයතනික පුහුණුව ලබන අතර මේ සඳහා රු.මි. 10 ක් පමණ එහි සියලු බරපැන රජයට දැරීමට සිදුවේ.මෙම වැඩසටහනෙන් පුහුණුව ලැබුවන් සියල්ලම වාගේ දේශීයව හා විදේශීයව රැකියා අවස්ථා ලබාගෙන ඇත. ඇතැමුන් ඉදිකිරීම් උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු කිරීම සඳහා තමන්ගේ වැඩබිම් පිහිටුවා ගෙන ඇත.

### 5.3.2.4 සේවකයන්ගේ කුසලතා වර්ධනය සඳහා වන වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව, නඩත්තු කිරීම, කළමනාකරණය හා සම්බන්ධ කාර්මික ශිල්පීන්ගේ අධීක්ෂණයන්ගේ හා කළමනාකරුවන්ගේ තාක්ෂණික දැනුම ඉහළ දැමීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. සෑම පුහුණුවන්නෙකුටම අවධානය යොමු කිරීම සඳහා බඳවාගැනීම 12 කට සීමා කොට ඇත. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

### 5.3.2.5. කණිෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා වන පුහුණු වැඩසටහන (අදියර 2)

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කරන ස්ථාන වල සේවය කරන කණිෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා කුසලතාව වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවුරුදු දෙකත් පහත් අතර පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයන්ට ඔවුන්ගේ කාර්මික ශිල්පීන් ඕනෑම තෝරාගත් මොඩියුලයක් පුහුණුවීම සඳහා යෙදවීම පිණිස මෙම පුහුණු පාඨමාලාව මොඩියුල 9 කට බෙදා ඇත. හයිඩ්‍රොලික් (ද්‍රාව විද්‍යාව) මෙකැමොනින්ස් (යාන්ත්‍ර විද්‍යුත් විද්‍යාව) වැනි ඇතැම් මොඩියුල සඳහා ඉහළ ඉල්ලුමක් ඇති බැවින් මෙම මොඩියුල සඳහා ඇතැම් විට අමතර පාඨමාලා පැවැත්වීමට සිදුවේ.

### 5.3.2.6 ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (අධියර 3)

මෙම උසස් පුහුණු වැඩසටහන ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැණුම හා කුසළතා ඉහළ දැමීම හා ඔවුන්ගේ වැරදි පිළිබඳව නිශ්චිතව හඳුනා ගැනීමට හා ඒවා නිවැරදි කිරීමට සුදුසු පරිදි සැලසුම් කර තිබේ.




අවුරුදු පහකට වැඩි පලපුරුද්දක් ඇති කාර්මික ශිල්පීන් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. සේවා යෝජකයන්ට තම කාර්මික ශිල්පීන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව තෝරාගත් ඕනෑම පුහුණු වැඩසටහනක් සඳහා යෙදවීමට හැකිවන පරිදි සැකසූ විවිධ මොඩියුල 6 කින් මෙම පුහුණු වැඩසටහන් සමන්විත වේ. හයිඩ්‍රොලික් හා මෙකැට්‍රොලික් පාඨමාලා සඳහා කර්මාන්ත තුළ ඉහළ ඉල්ලුමක් ඇති බැවින් ඇතැම් විට මෙම මොඩියුල සඳහා අමතර පාඨමාලා පැවැත්වීමට ද සිදුවේ.

**5.3.2.7** අධීක්ෂණයන් සඳහා පුහුණු වැඩසටහන්


ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ වගකීම දරන වැඩබිම් අධීක්ෂකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම අධීක්ෂණ පුහුණු වැඩසටහන සැලසුම් කොට තිබේ. අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක පළපුරුද්දක් ඇති අධීක්ෂකයන් මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.


**5.3.2.8 ඉංජිනේරුවන් කළමනාකරුවන් සඳහා පුහුණු වැඩසටහන**

ඉදිකිරීම් උපකරණ භාවිතා කිරීමේ හා නඩත්තු කිරීමේ යෙදී සිටින ඉංජිනේරු, වැඩබිම් කළමනාකරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන් ආදීන්ගේ දැනුම වර්ධනය සඳහා මෙම පුහුණු වැඩසටහන සකසා ඇත.

ඉදිකිරීම් උපකරණ භාවිතය හා නඩත්තු කිරීම පිළිබඳව සිවිල් ඉංජිනේරුවන්ට හා ව්‍යාපෘති කළමනාකරුවන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම සඳහා **"ඉදිකිරීම් උපකරණ භාවිතය"** යන පුහුණු පාඨමාලාව සකසා ඇත. මෙම පාඨමාලාව සඳහා වසර දෙකක පළපුරුද්දක් ඇති ඉංජිනේරුවන් බඳවා ගනු ලැබේ.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීමේ වගකීමදරන යාන්ත්‍රික ඉංජිනේරුවන්ට හා ඉදිරිපෙල කළමනාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා **"ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම"** පිළිබඳ පුහුණු පාඨමාලාව සකස් කොට ඇත. ඊට සහභාගිවන්නන්ට වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.





**5.3.2.9** ගබඩාකරණ /සැපයුම් /සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තය තුළ සේවය කරන, ගබඩා / සැපයීම් / ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා ගැනීමට තිබෙන අවස්ථා සීමිතය. මෙමතත්ත්වය අලුත්වැඩියා මධ්‍යස්ථාන වල මනා ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන විවිධ ප්‍රායෝගික ගැටළු ඇති කරයි. මෙම පුහුණු වැඩසටහන පුහුණු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඇති කරන ලදී.

### 5.3.2.10 ගොඩනැගිලි සේවා ඉංජිනේරු වැඩසටහන්

ගොඩනැගිලි ඉංජිනේරු සේවා ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහා CETRAC විසින් බොහෝ පාඨමාලා පවත්වනු ලැබේ. වාණිජ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි සේවා ආවරණය කිරීමට වැඩසටහන් සුළු ප්‍රමාණයක් සකස් කොට තිබේ. ඒවා ගිනි ආරක්ෂක පද්ධති, ජල සම්පාදන හා අපවහන පද්ධති ආවරණය කරයි.

### 5.3.2.11 සේවාදායකයින්ගේ සේවා අවශ්‍යතා මත සකස් වූ පුහුණු වැඩසටහන්

CETRAC ආයතනය දීර්ඝකාලීනව ලබා ඇති පළපුරුද්ද සමඟින් රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි සේවාදායක අවශ්‍යතා මත ගොඩනැඟුණු පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම තුළින් විවිධ හා විශේෂිත පුහුණු ඉල්ලීම සාර්ථකව සපුරාදීමට සමත්ව ඇත.

**2013 වසරේ CETRAC කාර්යසාධනය පහත දැක්වේ :**

**වගුව 1 : 2013 වසරේ CETRAC කාර්ය සාධනය**

| | පුහුණු පාඨමාලා | ලියාපදිංචිය | | පුහුණුව අවසන් කළ | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන |
| 01 | පාසල් හැරගියවුන් (පළමු අධියර)<br>ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පුහුණු පාඨමාලාව (BM) | 6 | 156 | 2 | 41 |
| | පුහුණු පාඨමාලා | ඉලක්ක ගත නිමැවුම | | සැබෑ නිමැවුම | |
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන |
| 02 | ආධුනික ශිල්පීන් ( II වන අධියර) | | | | |
| | ඩීසල් එන්ජින් නඩත්තුව | 1 | 15 | 1 | 26 |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තුව - 13M22 | 1 | 15 | 2 | 38 |
| | ඩීසල් ජෙනරේටර්ස් නඩත්තුව - 13M25 | 1 | 15 | 3 | 107 |
| | සුක්කානම තිරිංග සහ ක්ලච් පද්ධති නඩත්තුව - 13M26 | 2 | 30 | 1 | 11 |
| | ව්‍යවර්ථ මාරු කිරීම හා විසුරුවාලීම් පද්ධතිය නඩත්තුව - 13M27 | 1 | 15 | -- | -- |
| | වතුර පොම්ප හා සම්පීඩන නඩත්තුව - 13MT | 2 | 30 | 1 | 18 |
| | ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික් පද්ධති නඩත්තුව - 13WPC | 1 | 15 | 2 | 43 |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තුව -13M24 | 1 | 15 | 1 | 15 |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තුව -13SCE | 2 | 30 | -- | -- |
| | හයිඩ්‍රොලික් පද්ධති නඩත්තුව සහ දෝෂ නිවැරදි කිරීම | 1 | 15 | -- | -- |
| 03 | ජොෂ්ඨ කාර්මිකයින් ( තෙවන අධියර III) | | | | |
| | හයිඩ්‍රොලික් හා මැකාට්‍රොනික් පද්ධති නඩත්තුව - 13M32 | 1 | 15 | 2 | 28 |
| | සවයංක්‍රීය ඉලෙක්ට්‍රොනික් පද්ධති -13M34 | 1 | 15 | 1 | 18 |
| 04 | ඉංජිනේරුවන් | | | | |
| | ඉදිකිරීම් උපකරණ භාවිතය – 13CPM | 1 | 15 | -- | -- |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තුව - 13CEM | 1 | 15 | -- | -- |
| 05 | අධීක්ෂණ | | | | |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තුව - හයිඩ්‍රොලික් සහ විමෝචන - 13SUP 1 | 1 | 15 | -- | -- |
| | ඉදිකිරීම් උපකරණ නඩත්තුව - එන්ජින් සහ මැකාට්‍රොනික්ස් - 13SUP 2 | 1 | 15 | -- | -- |
| 06 | සහාය කාර්ය මණ්ඩලය | | | | |
| | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාව | 1 | 15 | 2 | 36 |
| | ගබඩාකරණය පිළිබඳ සහතික පාඨමාලාව | 1 | 15 | 1 | 31 |
| | ගබඩාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | 1 | 15 | 1 | 21 |

| | පුහුණු පාඨමාලා | ඉලක්ක ගත නිමැවුම | | සැබෑ නිමැවුම | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන | පාඨමාලා සංඛ්‍යාව | සහභාගිවන්නන් ගණන |
| 07 | **පාරිභෝගික අවශ්‍යතා මත ඇතිකල පාඨමාලා (CETRAC)** | | | | |
| | මොබයිල් ක්‍රේන් ක්‍රියාකරවීම | 1 | 10 | 2 | 8 |
| | ෆෝර්ක් ලිෆ්ට් ට්‍රක් ක්‍රියාකරවීම | 1 | 10 | -- | -- |
| | ෆෝර්ක් ලිෆ්ට් ට්‍රක් ක්‍රියාකරවීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් | 1 | 10 | 11 | 44 |
| | ජෙනරේටර්ස් සහ මෝටර්ස් | 1 | 10 | -- | -- |
| | බර වාහන නඩත්තුව | 1 | 10 | -- | -- |
| 08 | **පාරිභෝගික අවශ්‍යතා මත ඇතිකළ පාඨමාලා (BSE)** | | | | |
| | පිරිවිතර සහ මාර්ග ඉදිකිරීම් ක්‍රම | 1 | 20 | 1 | 24 |
| | ගොඩනැගිලි වායු සමීකරණ පද්ධති නඩත්තුව | 1 | 20 | 1 | 34 |
| | නාන තටාක නඩත්තුව | 1 | 20 | 1 | 35 |
| | විද්‍යුත් ස්ථාපන නඩත්තුව | 1 | 20 | 1 | 41 |
| 09 | **සම්මන්ත්‍රණ** | | | | |
| | ද්‍රව්‍ය, ගබඩා කළමනාකරණය සහ සැපයුම් චක්‍ර කළමනාකරණය | 1 | 100 | 2 | 166 |
| | හයිබ්‍රිඩ් (දෙමුහුන්) වාහන තාක්ෂණය | 1 | 100 | 1 | 98 |
| | සේවක කළමනාකරණය සහ කම්කරු රෙගුලාසි | 1 | 100 | 1 | 64 |
| | සුරක්ෂිත වාහන ධාවනය සහ රියැදුරු හැසිරීම් රටා | 1 | 100 | 1 | 30 |
| | විද්‍යාත්මක, ආරක්ෂිත සහ සකසුරුවම් මෝටර් රථ ධාවනය | 1 | 100 | 4 | 296 |
| | ජෙනරේටර්ස් ක්‍රියාකරවීම සහ නඩත්තුව | 1 | 100 | 2 | 176 |
| | සැපයුම් හා සේවා සංවිධානය සහ ඵලදායී මිලදී ගැනීම් කටයුතු | 1 | 100 | 2 | 152 |
| | **එකතුව** | | **1331** | | **1560** |

## 2013 වසර තුළ ඉපයූ ආදායම්

| කාර්ය ප්‍රභේදය | ආදායම (රු. මිලියන) |
|---|---|
| පුහුණු වැඩසටහන්, වැඩමුළු හා සම්මන්ත්‍රණ | 12.95 |
| වැඩමුළු අළුත්වැඩියා කිරීමේ ඊකියාවන් සහ අනෙකුත් වැඩමුළු සේවාවන් | 1.82 |
| පහසුකම් කුළියට දීම | 9.19 |
| **එකතුව** | 23.96 |

## 5:4 පුහුණු අංශය

වසර 30 ක් පුරාවට පැවති දීර්ඝකාලීන ජාතිවාදී අරගලය නිමාවට පත්කිරීමෙන් අනතුරුව ඉදිකිරීම් කර්මාන්තය පෙර නොවූ විරූ අසම සම ලෙස ළඟාකරගත් වර්ධන ගම්‍යතාවය පවත්වාගෙන යාමට හැකිවන ලෙසට පුහුණු මානව සම්පත් තිබෙන බව සහතික කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ නියැලි පාර්ශවකරුවන්ගේ ශක්තිය, හැකියාව වර්ධනය කිරීම පුහුණු අංශයේ ප්‍රධාන තම අරමුණ වේ.

වර්තමානයේ ඉදිකිරීම් කර්මාන්තය මුහුණ පා සිටින පුහුණු කම්කරුවන්ගේ හිඟය මඟින් මෙමනැගීගෙන එමින් තිබෙන විශාල වර්ධනය කෙරෙහි නිශේදනාත්මක බලපෑමක් ඇති කරනු ලබයි.

කිසිදු විශේෂ කුසලතාවයන් හෝ වෘත්තිමය පුහුණුවක් අවශ්‍ය නොවන්නාවූ ත්‍රීවිලර් රථ රියදුරන්, ආරක්ෂක නිළධාරීන් වැනි රැකියා කෙරෙහි තරුණ පරපුර යොමු වීම හේතුකොට ගෙන පසුගිය වසර කිහිපය තුළ 42 තරුණයින් මෙම ඉදිකිරීම් කර්මාන්තයට යොමුවීමේ දැඩි පසුබෑම් ස්වරූපයක් දක්නට තිබේ. මෙනිසා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනය සහ පැවැත්ම උදෙසා සියළු අයුරින් දායක වන රාජ්‍ය හා පෞද්ගලික ආයතන මෙන්ම පුද්ගලයන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සාර්ථකව සම්පූර්ණ කර ගැනීමේ අදිටනින් වාර්ෂිකව පුහුණු ක්‍රියාකාරකම් පුහුණු අංශය මඟින් සැළසුම් කරනු ලැබේ. කළමනාකරණ, අධීක්ෂණ සහ ශිල්පීය යන තුන් ආකාරයේ මානව සම්පත් මට්ටම් සඳහා ප්‍රධාන වශයෙන් පුහුණු ක්‍රියාකාරකම් සංවිධානය කර ඇත.

### 2013 වසරේ පැවැත්වූ පුහුණු වැඩසටහන්සහ වැඩමුළු

- ඉක්ටාඩ් විසින් වාර්ෂිකව නව මසක පුහුණු වැඩසටහනක් වන "ගිවිසුම් කළමනාකරණය සහ ප්‍රසම්පාදන කළමනාකරණය" රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනයන්හි ගිවිසුම් සහ ප්‍රසම්පාදන කළමනාකරණ කටයුතු වල නියැලී සිටින කුඩා සහ මධ්‍යම පරිමාන කළමනාකරුවන්ගේ කළමනාකරණය පිළිබඳ දැනුම වර්ධනය කිරීම සහ යාවත්කාලීන කිරීම අරමුණුකොට ගෙන සංවිධානය කරන ලදී. මෙම පාඨමාලාව 2013 වසරෙහි පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා පවත්වන ලදී. මේ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ගිවිසුම් සහ ප්‍රසම්පාදන කටයුතු වල නිරත පුද්ගලයින් 46 ක් පමණ සහභාගී විය.

- සුළු හා මධ්‍යම පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා ටෙන්ඩර් පටිපාටි සහ වැඩබිම් මිණුම් හා බිල්පත් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් පුහුණු අංශය මඟින් වර්ෂිකව පවත්වනු ලබයි. මෙම වැඩ සටහන සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන්ම පවත්වනු ලැබේ. 2013 වසරෙහි භාෂා ද්විත්වයෙන්ම මෙම පුහුණු වැඩසටහන් 18 ක් පැවැත්වූ අතර පුහුණු කටයුතු සඳහා කොන්ත්රාත්කරුවන් 457 දෙනෙකු සහභාගී වී ඇත.

- පුහුණු අව්‍යශතාවයන් සපුරාලීම සඳහා ඉදිකිරීම් ආයතනයන් ඉල්ලා ඇති පරිදි ඔවුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම අරමුණු කොට විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන ආකාරයෙන් කෙටි කාලීන පුහුණු පාඨමාලා 3 ක්, පුහුණු අංශය මගින් හඳුන්වා දී ඇත. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කළමනාකාර මට්ටමේ පුද්ගලයින් 115 දෙනෙකු මෙම පුහුණු වැඩසටහන් සඳහා ඉදිරිපත් වී ඇත.

- "ටෙන්ඩර් පටිපාටිය ඇගයීමේ ප්‍රායෝගික අංශයන්" සහ ඉක්ටාඩ් මිල උච්ඡාවචනය සූත්‍රය සහ එහි අදාලත්වය" යන මාතෘකා සම්බන්ධයෙන් සම්මන්ත්‍රණ මාලා දෙකක් මාර්තු සහ අගෝස්තු යන මාසයන්හි පවත්වා ඇත. කර්මාන්ත අංශයේ නියැළි පුද්ගලයින් 325 දෙනෙකු මේ සඳහා සහභාගී වී ඇත

- ❖ ඉදිකිරීම් කර්මාන්තයේ නියැළි අත්කම් ශිල්පීන්ට ඇති ඉල්ලුම අවම කිරීම සහ ඔවුන්ට අත්කම් ශිල්පය පිළිබඳව විවිධ කුසළතාවයන්ගේ නිපුණත්වයන් අත්පත් කර ගැනීමෙන් ඇතිවන වාසි ප්‍රවර්ධනය කිරීම අරභයා අම්පාර දිස්ත්‍රික්කයේ වඩුකාර්මිකයින් සහ පෙදරේරුවන්ගේ යහපත තකා දින 4 ක පුහුණු වැඩසටහනක් පුහුණු අංශය මගින් පවත්වා ඇත.

- ❖ කුරුණෑගල දිස්ත්‍රික්කය සහ මොරටුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශය තුළ ජාතික වෘත්තිය සුදුසුකම පිළිබඳ සහතිකය ලබා ගැනීම දිරිමත් කිරීම සඳහා සහ නිපුණතාවයන්ගෙන් හෙබි පුහුණු ශිල්පියෙකු බවට පත්වීම සඳහා වැඩසටහන් 3 ක් පවත්වා ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පෙදරේරුවන්, වඩුකාර්මිකයන් සහ ජලනල එලන්නන් ඇතුළුව 750 දෙනෙකුගෙන් සමන්විත ශිල්පීන් සහභාගි වී ඇත.

- ❖ උතුරු සහ නැගෙනහිර පළාත්හි රාජ්‍ය සහ පුද්ගලික අංශයට අයත් ඉන්ජිනේරුවන් සහ කාර්මික ශිල්පීන්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් මාලාවක් සංවිධානය කර ඇත. ඉදිකිරීම් තාක්ෂණය, ඉදිකිරීම් ද්‍රව්‍ය සහ සම්පූර්ණ ස්ථානයට යොදා ගනිමින් සිදුකරන ප්‍රායෝගික මැනුම් පිළිබඳ දෙමළ මාධ්‍යයෙන් පුහුණු වැඩසටහන් 5 ක් පවත්තවා ඇත. වැඩසටහන් 3 ක් යාපනය සහ වවුනියාවේ පවත්වා ඇති අතර, තවත් වැඩසටහන් 2 ක් කල්මුනේදී පවත්වා ඇත. මෙම පුහුණු වැඩසටහන් සඳහා තාක්ෂණ ශිල්පීන් සහ ඉන්ජිනේරුවන් 209 දෙනෙක් සහභාගි වී ඇත.

**මහාභිමානී – 2013**

ඉදිකිරීම් කර්මාන්තයේ එක් එක් අදාළ අංශයන්ගේ විශිෂ්ට දක්ෂතාවයන් දැක්වූ ශිල්පීන් හඳුනාගෙන ඔවුන්ට ත්‍යාගප්‍රධානය කිරීම සඳහා ප්‍රථම වරට 2013' අරඹූ වැඩසටහනකි මහාභිමානී සම්මාන උළෙල 2013.










තාක්ෂණය පිළිබඳව DTET – පියයන්හි පැවත්වෙනප්‍රාදේශීය පියයන්හි පැවත්වෙන ප්‍රාදේශීය ශිල්පීන්ගේ තරඟාවලියට ඒ ඒ අදාළ අංශයන්හි නිරත ශිල්පීනට අයදුම්පත් යොමු කරන ලෙස ඉල්ලීමක් කර ඇත. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකින් සහ මුහුණට මුහුණ සාකච්ඡාවක් මගින් තෝරාගනු ලැබේ. ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් විසි දෙනෙකු පැය 6 ක ප්‍රායෝගික පරීක්ෂණයකට යොමුකර වරළත් ඇගයුම් පරීක්ෂකයින් විසින් තනි තනිව පරීක්ෂාවට, ඇගයීමට ලක්කරනු ලබයි. පෙදරේරු කර්මාන්තය, වඩුවැඩ, ජලනල එලීම, විදුලි රැහැන් ඇදීම සහ ටයිල් ඇතිරීම පිළිබඳ ප්‍රාදේශීය තරඟ

ප්‍රාදේශීය ඇගයීම් මධ්‍යස්ථාන 45 ක් (COT) වල පවත්වනු ලබන අතර යකඩ සවි කිරීම සහ දඬු නැවීම සහ පින්තාරු කිරීම යන අංශයන්ට අදාළ තරඟ කොළඹ දී පැවැත්විනි.
“මහාභිමානී” ජාතික තරඟයේ අරමුණ දිවයින පුරා විහිදී සිටින ශිල්පී ප්‍රජාවේ ඉදිකිරීම් හා සම්බන්ධ හැකියාවන් සහ නිපුණතාවයන් ඉහළ නැංවීම  ඇගයුමට ලක්කිරීම සඳහා ඉදිකිරීම්, ඉන්ජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍ය විමල් වීරවංශ මහතා විසින් හඳුන්වා දී ඇති සංකල්පයකි.
අවසන් තරඟය කොළඹදී පැවැත්වූ අතර එක් එක් කර්මාන්තය වෙනුවෙන් තොරාගත් ‘‘හොඳම ශිල්පියාට’’ අතිගරු ජනාධිපතිතුමා විසින් 2013 දෙසැම්බර් මස සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගණයේ පැවත්වූ උත්සවයකදී සම්මාන ප්‍රදානය කරන ලදී.

## 5.4.1 ජනාවාසසැලසුම් හාසංවර්ධනමධ්‍යස්ථානය (CHPD)

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ කළමනාකරණ බල අධිකාරිය යටතට වැටෙන විවිධ අංශයන්ගෙන් සැදි ආයතනයකි.  ජනාවාස සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා වූ මධ්‍යස්ථානය (CHPD)  CHPD නො. 33, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල යන මධ්‍යස්ථානයෙහි පිහිටා ඇත.තාක්ෂණවේදින්ගේ සහ වෘත්තිකයන්ගේ සහ වෘත්තිය සංවර්ධනය අරමුණු කරගත් පාඨමාලා පැවැත්වීමට ප්‍රචලිත ලෙස ලැබෙන ප්‍රතිචාරයන් මගින් CHPD ආයතනය විසින් ඉතා වැදගත් පාඨමාලාවක් වෘත්තිමය අයුරින් පැවැත්වීමට දායකවීම පිළිබඳව ප්‍රබල සාක්ෂි සපයයි.





ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමාව



CHPD ආයතනය විසින් ඉතා වැදගත් පාඨමාලාවක් වෘත්තිමය අයුරින් පැවැත්වීමට දායකවීම පිළිබඳව ප්‍රබල සාක්ෂි සපයයි. (DACM) යනුවෙන් ඉදිකිරීම් කළමනාකරණයට අදාළ පාඨමාලා නිශ්චිතව හඳුනාගෙන ඇත.  DACM ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳවඋසස් ඩිප්ලෝමාව සඳහා ඉලක්කගත කණ්ඩායම  වන්නේ, විධායක නිලධාරීන් ඉන්ජිනේරුවන්, ව්‍යවසායකයින් සහ කර්මාන්තයේ නියැළී සිටින ඉදිකිරීම් කළමනාකරුවන්ය.  වැඩ අධීක්ෂකයින් වශයෙන් ඉදිකිරීම් කර්මාන්තයේ නියැළි අධීක්ෂකයින් වශයෙන් ඉදිරීම් කර්මාන්තයේ නියැළෙන්නන්ට කැමැත්තක් දක්වන පාසල් හැරගිය උද්යෝගී තරුණ කැළ සඳහා CWM පූර්ණ කළීන පාඨමාලාව සකස් කර ඇත.

දැනට ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින ඉදිකිරීම් අධීක්ෂකයින් සහ එසේ වීමට උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා දැනුම නොමැතිව වුවද ප්‍රගුණ කළ හැකි පාඨමාලාවක් වශයෙන් මෙය හඳුන්වා දී ඇත.  ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව, සහතික පත්‍ර, ඩිප්ලෝමාව සහ උසස් ඩිප්ලෝමාව යනුවෙන් කොටස් 3 කට වෙන් කර ඇත.  මෙහි ඉලක්කගත කණ්ඩායම වන්නේ ඉදිකිරීම්

කම්කරුවන්, තාක්ෂණ නිළධාරීන්, ප්‍රමාණ සමීක්ෂණ සහායකයින් සහ සුදුසුකම් ලක් උනන්දුවක් දක්වන්නන් යන පාර්ශවයන්ය. ඉහත අංශයන් දෙකම ජාතික වෘත්තිය සුදුසුකම (NVQ) විෂය ධාරාව මගින් මෙහෙයවනු ලබයි.

### 5.4.1.2 කර්මාන්තයේ නවක ප්‍රවේශකයින් සඳහා පාඨමාලාව

අධීක්ෂණ මට්ටමේ සේවකයින් සඳහා මෙම කර්මාන්තය තුළ විශාල ඉල්ලුමක් පවතී. විදේශ වෙළඳ පොලෙයි අධීක්ෂකයින් සඳහා පවතින ඉල්ලුම හේතු කොට ගෙන බොහෝ දක්ෂ අධීක්ෂකයින් මෙරට නොරැඳේ. එලෙසම නවකයින් හට කර්මාන්තයට පිවිසිය හැකි මාර්ග සහ අවස්ථාවන්ද ප්‍රමාණවත් නොවේ. තරුණ විරැකියා ප්‍රශ්නයට පිළියමක් වශයෙන් කලින් පාසල් හැරගියවුන් සඳහා යෝග්‍ය පුහුණු පාඨමාලාවන් සංවර්ධනය කිරීම සහ ඔවුන්ට මෙම නැගී එන සාර්ථක කර්මාන්තයට අවතීර්ණ වීමට අතහිත දීමටද තීරණයක් ගෙන ඇත. මෙම ක්ෂේත්‍රයේ දැඩිව පවතින ඉල්ලුම සපුරාලීම සඳහා ඉදිකිරීම් වැඩ කළමනාකරණය/පූර්ව කාළීන පාඨමාලාව(CWM)මහඟු පිටුවහලක් වේ.

### 5.4.1.3 ඉදිකිරීම් වැඩ කළමනාකරණ පුහුණු පාඨමාලාව

**පූර්ණ කාලීනව**

ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවතීර්ණ වීමට කැමැත්තක් දක්වන පාසල් හැරගියවුන් සහ මධ්‍යම සහ පහල මට්ටමේ පුද්ගලයින් සහ මෙම කර්මාන්තයේ නියැලී ඇති අනෙකුත් පුද්ගලයින් ගේ ඵලප්‍රයෝජනය සඳහා මෙම පාඨමාලාව සැළසුම් කර ඇත. එය CHPDහි මාස 5 අයතනික පුහුණුව සහ 7 මසක නේවාසික පුහුණුව ඇතුලත් වසරක පාඨමාලාවකි. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අ.පො.ස.(සා.පෙළ) ගණිතය සහ විද්‍යාවට සම්මාන සාමාර්ථද ඉංග්‍රීසි ඇතුළු අනෙක් විෂයයන් 6 සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව පාසල් හැරගියවුන්ට මෙම පාඨමාලාව ප්‍රගුණ කළ හැක. නූතන ගොඩනැගිලි කර්මාන්තයේ සියළුම අංශයන්හි NVQ මට්ටමේ 4 වන අදියර දක්වා ආවරණය කර ඇත. මෙහි වාර්ෂික බඳවා ගන්නන් පුහුණුකරුවන් 30 න් යුත්තය.

පාඨමාලා අන්තර්ගතය, ඉදිකිරීම් ගණිතය, ඉදිකිරීම් කළමනාකරණය, ඉදිකිරීම් තාක්ෂණය, ජල සැපයුම සහ ජලාපවහන හා අපද්‍රව්‍ය, මැනුම් හා වට්ටම් කිරීම.

ඉන්ජිනේරු ද්‍රව්‍ය, පිරිවැය කළමනාකරණය, ඉදිකිරීම් සැපුම්, මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව, ඉදිකිරීම් උපකරණ කළමනාකරණය, තත්ත්ව සහතිකය, **BOQ** - මිණුම් සහ මිල, කර්මාන්ත ආරක්ෂණය, සෞඛ්‍ය හා පරිසරය, සැලසුම් වැඩ සහ සම්පත්, ඉදිකිරීම් හා අදාළ වන ඉංග්‍රීසි.

පාඨමාලා මගින් සැලසෙන වාසි**: ICTAD** ලියාපදිංචිය මගින් ව්‍යවසාය, ප්‍රමාණ සැළසුම් ඩිප්ලෝමාවට ඇතුලත්වීම සඳහා සුදුසුකම, දේශීය සහ විදේශීය රැකියා සඳහා අවස්ථාවන්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දක්ෂ ඉදිකිරීම් අධීක්ෂකවරයෙකු වීමට ඇති හැකියාව.

### 5.4.1.4 සේවකයින්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලාවන්

ඉදිකිරීම් අංශයේ සේවකයින්, අධීක්ෂකයින්, කාර්මික නිලධාරීන්, ඉන්ජිනේරුවන්, විධායක නිලධාරීන් සහ ව්‍යවසායකයින්ගේ කුසළතාවයන් වර්ධනය කිරීම අරමුණු කොට මෙම වැඩිදුර පාඨමාලා සකස් කර ඇත. පළපුරුද්ද සහ අවශ්‍ය කරන සුදුසුකම් මෙම පාඨමාලාවන් හැදෑරීමට අවශ්‍ය සුදුසුකම් වේ.

**අ. ප්‍රමාණ සැලසුම් සහතික පත්‍ර පාඨමාලාව**

මෙම පුහුණු වැඩසටහන ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින කාර්මික නිලධාරින්, සැලසුම් ශිල්පීන්, අධීක්ෂකයින්, මධ්‍ය සහ පහල මට්ටමේ පුද්ගලයින්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කර ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වසර දෙකක පලපුරුද්ද සහ පිළිගත් කාර්මික දැනුම පිළිබඳ සුදුසුකම් මෙම පාඨමාලාව

හැදෑරීම සඳහා අවශ්‍ය වේ. මෙම පාඨමාලාවේ කාලසීමාව මාස 6ක් වේ. (සතියට එක් දිනක් බැගින්, එකතුව දින 24)

**පාඨමාලාවේ අන්තර්ගතය:**

කුඩා සහ මධ්‍යම ඉදිකිරීම් සඳහා BOQ පිළියෙල කිරීම, ටෙන්ඩර් ඇස්තමේන්තු සහ පිරිවැය කාර්යාලයේ තොරතුරු සහ සන්නිවේදන කටයුතු කළමනාකරණය යන විෂයන්ගෙන් සමන්විත වන අතර NVQ ජාතික වෘත්තීය පුහුණුවේ 4 වන අදියර දක්වා විෂය නිර්දේශය මෙම පුහුණු පාඨමාලාවෙන් ආවරණය කර ඇත.

**ආ. ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව**

ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කාර්මික නිලධාරින්, සැළසුම් ශිල්පීන්, අධීක්ෂකයින්, මධ්‍යම හා පහල මට්ටමේ පුද්ගලයින් සහ අනෙකුත් සියල්ලන්ගේම ප්‍රයෝජනය තකා මෙම පුහුණු පාඨමාලාව සකස් කර ඇත. CHPD (ජනාවාස සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීමමධ්‍යස්ථානය) සම්පූර්ණ කරන ලද සහතික පත්‍ර පාඨමාලාව (CHPD),ගොඩනැගිලි ප්‍රමාණ ඇස්තමේන්තුව (BOQ) සහ NCT QS (ප්‍රමාණ සමීක්ෂණ ශිල්පය පිළිබඳව ජාතික කාර්මික සහතික පත්‍ර පාඨමාලාව) NT QS, NVQ අදියර 4 හා සමාන සුදුසුකම් මෙම පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය වේ. පාඨමාලා කාලය මාස දහයකි. (සතියට 1ක් දිනක්, සම්පූර්ණ දින 40) CHPD සහතික පත්‍ර ලාභීන් හැර අනෙකුත් අය සඳහා ඇතුලත්වීමේ පරීක්ෂණයන් පැවැත්වේ.

**පාඨමාලාවේ අන්තර්ගතය:**

විශාල ඉදිකිරීම් සහ සිවිල් වැඩ සඳහා ගොඩනැගිලි ප්‍රමාණ ඇස්තමේන්තු (BOQ) පිළියෙල කිරීම, ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම, ප්‍රසම්පාදන ක්‍රමවේදයන්, අන්තර් තක්සේරුව, කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන කළමනාකරණය, සැලසුම් කරන කාර්යාලයීය කාර්යයන් ඉටුකිරීම, වැඩ කණ්ඩායම්වලට නායකත්වය හා පහසුකම් සැපයීම,NVQ අදියර 5 දක්වා විෂය සීමාව මෙම පුහුණු පාඨමාලාවෙන් ආවරණය කෙරේ.

**ඇ. ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

ඉදිකිරීම් කර්මාන්තයේ නැයැලී සිටින කාර්මික නිලධාරින්, ප්‍රමාණ සමීක්ෂණ සහකාරවරුන් සහ අනෙකුත් මධ්‍යම සහ පහළ මට්ටමේ පුද්ගලයින් සඳහා මෙම පුහුණු පාඨමාලාව සකස් කර ඇත. මෙය හැදෑරීම සඳහා අවසන් කළ CHPD ඩිප්ලෝමා පාඨමාලාව, පූර්ව හා අපර CHPD කොන්ත්‍රාත්තුව, ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමාවේ කාලසීමාව වසරක කාලයකි. (සතියට දිනක් වශයෙන් සම්පූර්ණ දින 60 ක එකතුවකි).

**පාඨමාලාවේ අන්තර්ගතය:**

ගිවිසුම් නීතිය, ඉදිකිරීම් ආර්ථික විද්‍යාව, කළමනාකරණ මූලධර්ම, ව්‍යාපෘති පිරිවැය කළමනාකරණය, ටෙන්ඩර් ඉදිරිපත් කිරීම, කොන්ත්‍රාත්කරුවන් තෝරාගැනීම, තක්සේරුකරණය, විචලනය, උසස් මිනුම්, ප්‍රසම්පාදනය සහ ටෙන්ඩර් තක්සේරුව, උප කොන්ත්‍රාත් කළමනාකරණය, ඉල්ලීම් මූල්‍ය ගිණුම්, පරිගණක, සේවා ස්ථානය තුල ඉගෙනගැනීමේ සංස්කෘතිය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම, ගැටළුකාරී තීරණයන් විසඳීම, ඉදිකිරීම් සැලසුම් ශිල්ප ක්‍රම, ව්‍යාපෘතිය. මෙම පුහුණු පාඨමාලාවේ විෂය නිර්දේශය NVQ අදියර 6 ට අයත් විෂයන් ආවරණය කරයි.



**d. අධීක්ෂකයින් සඳහා පුහුණු වැඩ සටහන**

**ඉදිකිරීම් වැඩ කළමනාකරණය - අර්ධ කාලීන**

දැනටමත් ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින සහ ඉදිකිරීම් කටයුතු සිදුකරන පුද්ගලයින් සඳහා මෙම පාඨමාලාව සකස් කර ඇත.

එක් අවුරුදු පාඨමාලාවන් හැදෑරීමේදී ලැබෙන්නේ එක් අවුරුද්දක ආයතනික පුහුණුවක් පමණි. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා තුන් අවුරුදු අදාළ වෘත්තීය අත්දැකීම් සහ අ.පො.ස. (උ.පෙළ) දක්වා අධ්‍යාපනය ලබා තිබීම සුදුසුකමක් වේ. සියළුම නූතන ඉදිකිරීම් කර්මාන්තයේ දැනුම හා අදාළ සියළුම අංශයන් NVQ අදියර 4 මට්ටම දක්වා ආවරණය කරනු ඇත.

**පාඨමාලාවේ අන්තර්ගතය:**

ඉදිකිරීම් ගණිතය, ඉදිකිරීම් කළමනාකරණය, ඉදිකිරීම් තාක්ෂණය, ජල සැපයුම සහ මලාපවහනය, මිණුම් සහ මට්ටම් කිරීම ආදිය වේ.

ඉංජිනේරු ද්‍රව්‍ය, පිරිවැය කළමනාකරණය, ඉදිකිරීම් සැලසුම්, මාර්ග ඉදිකිරීම් සහ නඩත්තුව, ඉදිකිරීම් උපකරණ කළමනාකරණය, තත්ත්ව සහතිකය, ගොඩනැගිලි ප්‍රමාණ ඇස්තමේන්තුව - මිනුම් සහ මිල, කර්මාන්ත ආරක්ෂණය, සෞඛ්‍ය හා පරිසරය, සැලසුම් කාර්යයන් හා සම්පත්, ඉදිකිරීම්වලට අදාළ ඉංග්‍රීසි භාෂාව.

**පාඨමාලාවේ ප්‍රයෝජනය:**

ICTAD ලියාපදිංචිය තුලින් ව්‍යවසායකත්වය, ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව සඳහා ඇතුලත්වීමේ සුදුසුකම්, දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන්, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණතාවයෙන් හෙබි සේවාදායකයෙකු බවට පත්වීම.

**ඇ. විධායක ගණයේ නිලධරයන් සඳහා පුහුණු වැඩසටහන**

**ඉදිකිරීම් කළමනාකරණය පිළිබඳව උසස් ඩිප්ලෝමා පාඨමාලාව**

මෙම පාඨමාලාව විධායක නිලධාරීන්, ව්‍යාපෘති කළමනාකරුවන් ඉංජිනේරුවන්, වාස්තු විද්‍යාඥයින්, ප්‍රමාණ සැලසුම් ශිල්පීන් සහ වෙනත් උසස් ඉදිකිරීම් කටයුතුවල නියැලී සිටින වෘත්තිකයින් සඳහා සකස් කර ඇත.

**පාඨමාලා අන්තර්ගතය:**

වෘත්තීය ආරක්ෂාව, සේවා ස්ථානයේ සිදුවන හදිසි අනතුරු වැළැක්වීම, ඉංජිනේරු සහ ඉදිකිරීම් ආර්ථිකය ඇගයීම, ඉදිකිරීම් කර්මාන්තය සඳහා රක්ෂණය, ආරවුල් සහ නිරාකරණය, කණ්ඩායම් ගොඩනැගීම සහ නායකත්ව සංවර්ධනය, යටහත් සේවක ගණයන්හි පුහුණුව සහ සංවර්ධනය, ඉදිකිරීම් උපකරණ කළමනාකරණය, පාරිසරික කළමනාකරණය, අවධානම් කළමනාකරණය, කළමනාකරණ සංකල්පය සහ කම්කරු කළමනාකරණයේ පදනම (පූර්ව සහ අපර), ටෙන්ඩර් පටිපාටිය, උප කොන්ත්‍රාත්කරු කළමනාකරණය, ගිවිසුම් පරිපාලන කොන්දේසි, කොන්ත්‍රාත් නීතිය, ඉදිකිරීම් සැලසුම්, ජාල විශ්ලේෂණය, සම්පත් සැලසුම්, මූල්‍ය සැලසුම්, ඉදිකිරීම් සැලසුම් සඳහා පරිගණක යෙදවීම, ප්‍රගති පාලනය, තත්ත්ව පාලනය, නැනෝ තාක්ෂණය සහ ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතය.

**ඉ. ඔටෝ කැඩ් 2d සහ 3d රූපකරණය සඳහා පුහුණු**

ඉදිකිරීම් සැලසුම් කාර්යයන් සඳහා පරිගණකාශ්‍රිත සැලසුම් ක්‍රමවේදයන් භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳව ප්‍රායෝගික දැනුම සම්පූර්ණ කර ගැනීම අරමුණු කොට මෙම පාඨමාලාව සැලසුම්ගත කර ඇත.

**පාඨමාලාවේ වාසි:**

හැකියාවන් වර්ධනය, කෙටි කාලසීමාව, සීමිත කණ්ඩායම් සහ පෞද්ගලික අවධානය, පරිගණක දැනුම ලබාගැනීම සඳහා අවස්ථාව, ආරවුල් සහ නිරාකරණය, වටිනා සහතිකයක් පිරිනමනු ලැබේ.

**පාඨමාලාවේ අන්තර්ගතය:**

CADහඳුන්වාදීම, AutoCAD හඳුන්වාදීම, ජ්‍යාමිතික රටා, සංස්කරණ මෙවලම්, ස්තර, AutoCAD සමග 3D රූපකරණය (මතුපිට, ත්‍රිමාණ) AutoCAD හා සම්බන්ධ අන්තර්ගත දත්ත හා ආක්‍රමණයන් විවරණය, ආකෘති සහ සැලසුම් කේන්ද්‍රය, උසස් සැලසුම් (පසුතලය, දර්ශන විවර), කාර්යාල ප්‍රමිතීන්, මිනුම්, පරිමාණ ඒකකයන්/කෙටුම්පත් සංකේත / උප ලක්ෂණයන් / දත්ත උකහාගැනීම, 3ds Max සමග 3D ආකෘති නිරූපණය, මුද්‍රණය.

**ඊ. මයික්‍රොසොෆ්ට් ඔෆිස් 2007/2010 ව්‍යාපෘති සඳහා පුහුණු පාඨමාලාවන්**

ව්‍යාපෘති කාර්යයන් සඳහා නියැලී සිටින සහ ඒ සඳහා අවතීර්ණවීමට අපේක්ෂා කරන්නන් උදෙසා න්‍යායාත්මක ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම අරමුණු කොට ගෙන මෙම පාඨමාලාව සකස් කර ඇත.

**පාඨමාලාවේ වාසි:**

හැකියාවන් වර්ධනය, කෙටිකාලීන, සීමිත කණ්ඩායම් සහ පෞද්ගලික අවධානය, පරිගණක දැනුම ලබා ගැනීම සඳහා අවස්ථාව, ආරවුල් සහ නිරාකරණය, වටිනා සහතිකයක් පිරිනමනු ලැබේ.

**පාඨමාලාවේ අන්තර්ගතය:**

හැඳින්වීම, ව්‍යාපෘති ගොනු සකස් කිරීම, කාර්යයන් සැකසීම, සම්පත් සැකසීම, සම්පත් සඳහා කාර්යයන් පැවරීම, දර්ශනයන් සමග වැඩ කිරීම, ව්‍යාපෘති උපලේඛන සියුම්ව සකස් කිරීම, ව්‍යාපෘති කළමනාකරණය සහ සළකුණු, ව්‍යාපෘති තොරතුරු පිරික්සීම සහ බෙදා ගැනීම.

**උ. ඉල්ලුමට සරිලන පුහුණු වැඩ සටහන් නිර්මාණය**

ඉදිකිරීම් කර්මාන්තයේ වෙනස් වන ඉල්ලුමට සපුරාලිය හැකි පරිදි ඉල්ලුමට සරිලන පුහුණු වැඩ සටහන් වර්ධනය කිරීම මගින් නිශ්චිත ඉල්ලුමක් සහිත විවිධ පුහුණු පාඨමාලාවන් සඳහා ඉල්ලුමට සරිලන පුහුණු වැඩ සටහන් සාර්ථකව ඉදිරිපත් කිරීමට CHPD (වාසස්ථාන සැළසුම් සහ සංවර්ධන මධ්‍යස්ථානයට) හැකි වී ඇත.

**ඌ. සම්මන්ත්‍රණ සහ වැඩමුළු**

ඉදිකිරීම් කර්මාන්තයේ විවිධ අංශ සඳහා න්‍යායාත්මක සහ ප්‍රායෝගික අවතීර්ණය පුළුල් කිරීම සඳහා සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වනු ලැබේ. අදාළ මාතෘකාවන්හි ප්‍රධාන තේමාවන් දෝෂ නිරාකරණ පරිචයන්, ප්‍රශ්න සහ පිළිතුරු සැසිවාරයන්ගේ ආවරණය කර ඇත.

2013 වසරෙහි CHPD කාර්ය සාධනය පහත ආකාරයෙන් දැක්වේ.

CHPD කාර්ය සාධනය 2013

| අංකය | පුහුණු වැඩ සටහන් | ඉලක්කගත නිමැවුම | | සැබෑ නිමැවුම | |
|---|---|---|---|---|---|
| | | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව | පාඨමාලා සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව |
| 01 | ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා | | | | |
| | ❖ සහතික පත්‍ර පාඨමාලා | 04 | 100 | 04 | 125 |
| | ❖ ඩිප්ලෝමා පාඨමාලා | 04 | 100 | 04 | 159 |
| | ❖ උසස් ඩිප්ලෝමා පාඨමාලා | 01 | 30 | 01 | 24 |
| | ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා - කුරුණෑගල | | | | |
| | ❖ සහතික පත්‍ර පාඨමාලාව | 01 | - | 01 | 10 |
| | ❖ ඩිප්ලෝමා පාඨමාලාව | 01 | - | 01 | 32 |
| 02 | ඉදිකිරීම් වැඩ කළමනාකරණ පාඨමාලාව | | | | |
| | ❖ පූර්ණ කාලීන | 01 | 25 | 01 | 17 |
| | ❖ සති අන්ත | 01 | 25 | 01 | 25 |
| 03 | උසස් ඉදිකිරීම් කළමනාකරළණ පාඨමාලාව | 01 | 25 | - | - |
| 04 | පරිගණක පාඨමාලා | | | | |
| | ❖ MS ව්‍යාපෘති | 06 | 72 | 02 | 21 |
| | ❖ Auto cad | 06 | 72 | 01 | 07 |
| 05 | සම්මන්ත්‍රණ | 06 | 360 | 05 | 584 |
| 06 | ඉල්ලුමට සරිලන පාඨමාලා | - | - | 05 | 166 |

**<u>2013 වසරේ උපයාගත් ආදායම</u>**

| ක්‍රියා වර්ගය | ආදායම (මිලියන) |
|---|---|
| පුහුණු වැඩ සටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ | 18,501,288.00 |
| පහසුකම් සැපයීම සහ විවිධ | 1,502,563.00 |
| එකතුව | 20,003,851.00 |

## 5.3 මානව සම්පත් සහ පාලන අංශය

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ (ICTAD) මානව සම්පත් සහ පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ආයතනයේ මානව සම්පත් සංවර්ධනය සහ පරිපාලනය පිළිබඳ කටයුතු පවරා ඇත. මෙම සංවිධානයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කාර්යයන් වන්නේ, මානව සම්පත් සැළසුම් කිරීම, මානව සම්පත සංවර්ධනය, සම්පත් භාවිතය / රඳවා ගැනීම / තෘප්තිමත්භාවය / පුහුණු සහ සංවර්ධනය, මානව හැකියාව කළමනාකරණය, මානව සම්පත් කළමනාකරණය ආදිය සම්බන්ධ උපක්‍රම නිරවුල්ව පැහැදිලි කිරීමයි. සංවිධානයේ මානව සම්පත සහ පරිපාලන කටයුතුවල මනා ක්‍රියාකාරිත්වය මගින් උපක්‍රමශීලීව ව්‍යාපාරික සහ මෙහෙයුම් පිළිබඳව තීරණයන් ගැනීමට සංවිධානයට හැකි වී තිබේ.

මෙම ආයතනයේ සම්පූර්ණ කාර්ය මණ්ඩලය ස්ථිර සේවක මණ්ඩලයෙහි (සභාපති සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළුව) 264 සහ පැවරුම් පදනම මත තාවකාලික සේවයෙහි 8 දෙනෙකු ද ඇතුළුව 272 ක

ගෙන් සමන්විතය. 2013.01.01 සිට 2013.12.31 කාල පරිච්ඡේදය තුල සේවකයින් 8 දෙනෙකු විශ්‍රාම ගන්වා ඇති අතර 14 දෙනෙකු ආයතනයෙන් ඉල්ලා අස් වී ඇත.

කාර්යමණ්ඩලයට පවරා ඇති රාජකාරී ඉටුකිරීම් සඳහා ඔවුන්ගේ දැනුම සහ හැකියාව සම්බන්ධයෙන් වූ පරතරයන් හඳුනාගනිමින් විදේශ පුහුණු වැඩ සටහන් සැළසුම් කර ඇති අතර 2013 වසරේදී ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කොට ඒවා ක්‍රියාත්මක කර ඇත. මෙහි විස්තරාත්මක තොරතුරු ඇමුණුමෙහි ඉදිරිපත් කර ඇත.

NAITA ආයතනයේ ඉගෙනුම ලැබූ තාක්ෂණික ශිල්පීන්, පරිගණක යෙදවුම් සහායකයින් සහ පිළිගැනීමේ නිලධාරින් ආයතනයේ සාමූහික වගකීමක් ලෙස සළකා ආධුනික පුහුණුකරුවන් වශයෙන් පුහුණුවක් ලබාදීමට ICTAD ආයතනයට හැකි වී ඇත.

ICTAD ආයතනය සතු ශ්‍රවනාගාරය කුළියට දීමෙන් සහ මනා කළමනාකරණය, සම්මන්ත්‍රණ ශාලා, සාකච්ඡා කාමර සහ කතරගම නිල නිවාසය කුලියට දීමෙන් ද රු. 2,057,582 ක මුදලක් උපයා ගැනීමට හැකි වී ඇත.

**2013 වසරේ කාර්ය මණ්ඩලය සංවර්ධනය**

| | වැඩ සටහන | නම | තනතුර | අංශය | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|---|---|---|
| 01 | GBCSL ඇසෝසියේට් වෘත්තීය පුහුණු පාඨමාලාව | • සී.එස්.කරුණාරත්න මිය<br>• ඩී.ඩී.සමරවීර මිය | • නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>• සහකාර උපදේශිකා උපදේශක සේවා | සංවර්ධන<br>උපදේශක සේවා | GBCSL ලේකම් කාර්යාලය | 11.12.18.19/01/ 2013<br>8/02/2013 |
| 02 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් | • බී.එස්.එස්. හේවගේ මහතා | නියෝජ්‍ය අධ්‍යක්ෂ | මූල්‍ය | ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය පිළිබඳ ගණකාධිකාරී ආයතනය | 30/01/2013 |
| 03 | ශ්‍රී ලංකාවේ තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදනය පිළිබඳ වන වටයේ සාකච්ඡාව | • එස්.කේ.එස්. අමරසේකර මහතා | අධ්‍යක්ෂ | සංවර්ධන | ශ්‍රී ලංකාවේ ජාතික පාරිශුද්ධ නිෂ්පාදන මධ්‍යස්ථානය | 21,22/02/2013 |

| | වැඩ සටහන | නම | තනතුර | අංශය | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|---|---|---|
| 04 | ඵලදායි අභ්‍යන්තර විගණනය පිළිබඳ එක් දින වැඩමුළුව | • අයි.එම්. ගුණසේකර මිය | අභ්‍යන්තර විගණන නිලධාරි | අභ්‍යන්තර විගණන අංශය | SDFL | 07/03/2013 |
| 05 | කථන ඉංග්‍රීසි පාඨමාලාව | • කේ.ජී.එන්. චන්ද්‍රිකා මිය | කළමනාකරණ සහකාර | CETRAC | බ්‍රිතාන්‍ය කවුන්සිලය | 19/04/2013 to 03/07/2013 |
| 06 | CLOB 2 වන ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රණය-2013 | • එස්.කේ.එස්. අමරසේකර මහතා | අධ්‍යක්ෂ | සංවර්ධන | ශ්‍රී ලංකා ඉදිකරන්නන්ගේ ආයතනය | 14,15/06/2013 |
| 07 | නිසි විනය කළමනාකරණය මානව සම්පත් සංවර්ධනය | • කේ.ඩී.සී.පී. අබේසිංහ මිය<br>• වී.පී. ගුණසේකර මහතා | • සහකාර අධ්‍යක්ෂ<br>• පරිපාලන නිලධාරි | පරිපාලන<br>CETRAC | විනය කළමනාකරණය අධ්‍යනය පිළිබඳ මධ්‍යස්ථානය | 28,29/06/2013 |
| 08 | තොරතුරු කළමනාකරණය | • ඩබ්ලිව්.කේ.වී. ජයතිස්ස මිය | පුස්තකාලයාධිපති | පරිපාලන | පුස්තකාල හා තොරතුරු | 15/05/2013 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | | | | අධ්‍යයනය පිළිබඳ ජාතික ආයතනය | |
| 09 | විනය කළමනාකරණය පිළිබඳ වැඩමුළුව | • ඩබ්.ඒ.ඒ.විජේසිංහ මයා<br>• වී.පී. ගුණසිරි මයා | • පරිපාලන නිලධාරි<br>• පරිපාලන නිලධාරි | පරිපාලන<br>CETRAC | අමාත්‍යාංශය | 29,30/08/2013 |
| 10 | ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිතීන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන | • කේ.කේ.චන්ද්‍ර කාන්ති මිය<br>• පී.ඩී. පෙරේරා මිය | • කළමනාකරණ සහකාර<br>• කළමනාකරණ සහකාර | මූල්‍ය | ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී සංගමය | 04,05/09/2013 |
| 11 | විදුලි කාර්මිකයන් සහ තාක්ෂණ ශිල්පීන් සඳහා වැඩමුළුව | • එස්.එන්.වන්නි ආරච්චි මහතා | විදුලි කාර්මිකයින් | පරිපාලන | CHPD | 16/09/2013 |
| 12 | සේවා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ වැඩමුළුව | • එච්.එම්.සෝමර ත්න මහතා | දේශන | CETRAC | CHPD | 31/10/2013 |
| 13 | ද්‍රාව පද්ධති නඩත්තුව | • එම්.එම්.කේ.පී. මොරවැව මයා | පුහුණු නිලධාරි | OTC | CETRAC | 14/12/2013 |
| 14 | FARU ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය 2013 | • සී.එස්.කරුණාර ත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ | උපදේශන සේවා | මොරටුව විශ්ව විද්‍යාලය | 14/12/2013 |

**2013 වසරේ කාර්ය මණ්ඩලය සංවර්ධනය**
**විදේශ පුහුණුව**

| | වැඩ සටහන | නම | තනතුර | අංශය | ආයතනය | කාල සීමාව |
|---|---|---|---|---|---|---|
| 01 | එක්ස්කොන් ප්‍රදර්ශනය | පී.ඒ.පී. වීරසේකර මයා<br>ඩබ්.එන්.ඊ.කෲස් මයා | නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>සහකාර අධ්‍යක්ෂ | CETRAC<br>OTC | ඉන්දියාව<br>ඉන්දියාව | 20-24.11.2013 |

## 5.6 මූල්‍ය අංශය

### 5.6.1 මූල්‍ය වසර

2013 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දින දක්වා මූල්‍ය වසර

### 5.6.2 ශුද්ධ අදායම

පුහුණු කටයුතු සඳහා දරන වියදමෙන් කොටසක් පියවීම සඳහා අවශ්‍ය ආදායම ඉක්ටාඩ් විසින් උපයා ගනු ලැබේ. මේ සඳහා විවිධාකාර වූ ක්‍රියාදාමයන් යොදා ගනු ලබයි. නිද: යන්ත්‍රෝපකරණ කුළියට දීම, කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය, සම්මාදම් මාර්ග, 2013 වසර තුල ප්‍රකාශනයන් අලෙවි කිරීම ආදිය.

මෙමගින් රු. 184,881,382.59 මුදලක් උපයාගෙන ඇත.

### 5.6.3 වියදම

2013 වසර තුල මුළු පිරිවැය වූ රු. 316,153,574.01 මුදලින් රු. 44,992,562.88 ක මුදලක් අවප්‍රමාණය වී ඇත.

### 5.6.4 ශ්‍රී ලංකා රජයේ දායකත්වය (ICTAD)

ඒකාබද්ධ අරමුදලෙන් රජය විසින් සිදු කරන ලද දායකත්වය
රු. 27,500,000/=(පුනරාවර්තන)
රු. 88,150,000/=(ප්‍රාග්ධන)

## මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

### 1. ඒකාබද්ධ තොරතුරු

**1.1** විස්තරාත්මක වාර්තාව

ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය (ICTAD) 1957 රාජ්‍ය කර්මාන්ත පනත යටතේ 1992 ජූනි මස අංක 718/5 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත පරිදි රාජ්‍ය සමාගමක් වශයෙන් ස්ථාපිත කර ඇත. ICTAD ආයතනය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන අතර ලියාපදිංචි ICTAD ආයතන, නො.123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි පිහිටා ඇත.

### 1.2 මූලික ක්‍රියාවන් සහ මෙහෙයුම්වල ස්වභාවය

රෙගුලාසි පැනවීම සහ පහසුකම් සැපයීම හරහා ක්‍රියාශීලී වෘත්තීය සහ විශ්වාසනීය, වටිනාකම් එකතු වූ සේවාවන් තහවුරු කිරීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සම්පත් සංවර්ධනය සහ ගුණාත්ව සම්මතයන් ඉහළ දැමීම තුළින් දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට මුහුණදිය හැකි ස්ථිරසාර ජාතිකසංවර්ධනයන් ඇති කිරීම ICTAD ආයතනයේ මෙහෙවර වශයෙන් හැදින්විය හැක.

**1.3** සේවක සංඛ්‍යාව

2013 වසරෙහි දෙසැම්බර් 31 දිනට ICTAD ආයතනයේ සේවක සංඛ්‍යාව 262 වේ. 2012 වසරෙහි සාපේක්ෂ සංඛ්‍යාව 260 වේ.

**1.4** මූල්‍ය වසර

ICTAD ආයතනයේ මූල්‍ය වසර 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මාස 12 ක කාලයක් වේ.

### වැදගත් මූල්‍ය ප්‍රතිපත්ති

**2.1** මූල්‍ය ප්‍රකාශනපිළියෙල කිරීමේ පදනම

ICTAD ආයතනයේ මූල්‍ය ප්‍රකාශණය ඓතිහාසික පිරිවැය පදනම්ව ශ්‍රී ලංකා රුපියල් අගය මත සකසා ඇති අතර එය ශ්‍රී ලංකා රුපියල් අගයෙන් ඉදිරිපත් කර ඇත.

### 2.2 ඒකගත්ව ප්‍රකාශනය

ICTAD ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව සකස් කර ඇත.(SLPSAS).

### 2.3 වත්කම් සහ තක්සේරුකරණයේ පදනම

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ මූල්‍ය ප්‍රකාශනයෙහි හීන වන පිරිවැය මත වාර්තා කර ඇත.

දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ වැඩි අගයකින් හෝ මිලදී ගැනීම් අමතර වියදමක් ලෙස ද හෝ ගණනය කරයි.

**2.3.2** සියළුම දේපළ, යන්ත්‍රෝපකරණ සහ උපකරණ සඳහා යොදන පිරිවැය මත සෘජු රේඛා ක්‍රමය භාවිතයෙන් ඒවායෙහි ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදනයන් ගණනය කරනු ලබන්නේ, ඒවායෙහි පහත සඳහන් ඇස්තමේන්තුගත සඵල අගයෙන් සමාන වාරික මගින් එම ක්ෂයවීම ඵල අගය අඩු කර ගැනීම සඳහා වේ. 2013 වසර සඳහා බලපවත්නා අනුපාතයන් වන්නේ;

| විස්තරය | ආයු කාලය | අනුපාතය (%) |
|---|---|---|
| භූමිය | | 0.0 |
| ගොඩනැගිලි හා ඒවා නගා සිටුවීම | 40 | 2.5 |
| ලී බඩු සවිකිරීම්, කාර්යාල උපකරණ | 5 | 20.0 |
| යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 8 | 12.5 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ | 4 | 25.0 |
| මෙවලම් සහ උපකරණ | 5 | 20.0 |
| මෝටර් රථ | 8 | 12.5 |

**2.4 භාණ්ඩ ලේඛනය**

භාණ්ඩ ලේඛනයන්හි අමතර කොටස්, නඩත්තු ද්‍රව්‍යය, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය සහ ලිපිද්‍රව්‍ය තොග සාමාන්‍ය පිරිවැය පදනම මත භාණ්ඩ ලේඛනයන්හි ප්‍රකාශයට පත් කර ඇත.

**2.5** බදු ගත් ඉඩම්වල බදු වාරික එම බදු කාලයට අදාළ වූ සමාන වාරික ප්‍රමාණයකින් අඩු කරනු ලබයි.

**2.6** 2010 වසර තුල CHPD ගොඩනැගිල්ලට අයත් වත්කම් අමාත්‍යාංශය මගින් පවරාගෙන ඇත. 2013 වසර තුල මෙම වත්කම්වලට අදාළ වටිනාකම් ගණනය කර ඇත.

**2.7** 2013 වසර තුල GIZහි වත්කම් අමාත්‍යාංශය විසින් පවරාගෙන ඇත. මෙම වත්කම්වල වටිනාකම් 2013 වසර තුල ගණනය කර ඇත.

**2.8 අයවිය යුතු ලාභය**

ඇස්තමේන්තුගත ලැබිය යුතු ලාභය හා සමාන වටිනාකමකින් යුත් බොල් හා අඩමාන ණය සඳහා යොදන ලද ශුද්ධ ප්‍රතිපාදනයන්ගේ වටිනාකම හා සමාන ප්‍රමාණයන් අයවිය යුතු ලාභයෙහි ප්‍රකාශිතව ඇත.

2010.12.31 දිනට ණය ගැතියන් නිශ්කාෂණය සඳහා නිශ්කාෂණ ගිණුමට මාරු කර ඇත.

**2.9 බොල් හා අඩමාණ**

බොල් හා අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන ගණනය කර පහත සඳහන් ආකාරයට ගිණුම් ගත කර ඇත.: -

**2.10**

| නොගෙවන ලද කාලය | සැපයූ ප්‍රතිපාදන |
|---|---|
| මාස 12 ට අඩු | - |
| අවු. 1 සිට 2 | 5% |
| අවු. 2 සිට 3 | |
| අවු. 3 සිට 4 | |
| අවු. 4 සිට 5 | |
| අවු. 5 ට වැඩි | 100% |

**2.11 මුදල් හා මුදල් සාම්‍යයන්**

මුදල් හා මුදල් සාම්‍යයන්හි අන්තර්ගත වී ඇත්තේ ආයෝජන බැංකුවේ සහ අතේ ඇති මුදල් ප්‍රමාණයන්ය.

## 2.12 විලම්භිත ආදායම

ප්‍රාග්ධන වියදම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රධාන විලම්භිත ආදායමෙහි අන්තර්ගත වී ඇත.
ප්‍රාග්ධන දීමනාව සහ ණය හිලව් වලින් සමන්විත විලම්භිත ආදායම ප්‍රාග්ධන මිලදී ගැනීම් සඳහා යොදා ගන්නා විට වත්කමෙහි සඵල ආයුකාලය පුරා ක්‍රමාණුකූල සහ තර්කාණුකූල පදනම මත උපයා ගැනෙන ආදායමක් වශයෙන් විලම්භිත ආදායම හැඳින්වේ.

## 2.13 විශ්‍රාමික පාරිතෝෂිකය

සෑම සේවාදායෙකුගේම පළමුවන සේවා වසරෙහි සිට සම්පූර්ණ කරන ලද එක් එක් වර්ෂයන්හි අවසන් මූල්‍ය වසරෙහි අවසන් වරට උපයා ගන්නා ලද අඩ මාසික වැටුපට පදනම්ව ගණනය කරන ලද වටිනාකමට සමාන ප්‍රමාණයකින් විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශණයෙන් ඉදිරිපත් කර ඇත. කෙසේ වෙතත් 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පනත යටතේ නොතැබුණු අවුරුදු පනත සේවා කාලයෙන් සම්පූර්ණ කළ සේවකයෙකු පමණක් සඳහා හිමිකම් ලබයි.

## 2.14 රජයේ ප්‍රතිපාදන

### 2.14.1 පුනරාවර්තන දීමනා

ICTAD ආයතනයේ ආදායම් මාර්ගයන් වශයෙන් රජයෙන් ලබාදෙන පුනරාවර්තන වියදම් ආදායම් ප්‍රකාශයෙහි පෙන්නුම් කර ඇත.

### 2.14.2 ප්‍රාග්ධන දීමනා

රජයෙන් මුදල් වශයෙන් පරිනමනු ලබන ප්‍රාග්ධන දීමනාවන් යම් වත්කමක එහි සඵල ආයු කාලය පුරාවට ක්‍රමාණුකූල සහ තර්කානුකූල පදනම මත උපයන විලම්භිත ආදායමක් වශයෙන් පෙන්නුම් කර ඇත.

## 2.15 ආදායම හඳුනාගැනීම

පහත දක්වා ඇති විවිධ මාර්ගයන්ගෙන් ආයතනය ආදායම උපයන අතර එම ආදායම ගිණුම්කරණ කාර්යයන් සඳහා උපචිත පදනම යටතේ හඳුනාගෙන ඇත.

(a) යන්ත්‍රෝපකරණ කුළියට දීම
(b) පාඨමාලා ගාස්තු
(c) ප්‍රකාශන අලෙවිය
(d) සම්මන්ත්‍රණ ශාලා - සම්මන්ත්‍රණ, වැඩමුළු ශාලා සහ ශ්‍රවනාගාරය කුළියට දීම
(e) සම්මන්ත්‍රණ සහ වැඩමුළු - සියළුම වියදම් උපචිත පදනම මත සැළකිල්ලට ගෙන ඇත.

## 2.16 වියදම්

සියළුම වියදම් උපචිත පදනම මත සැළකිල්ලට ගෙන ඇත.

## 2.17 සමුච්චිත වියදම සඳහා ගැලපීම්

සමුච්චිත වියදම් ගිණුම සඳහා කරන ලද ගැලපුම් රු.85,198,127.06 ක ගැලපීමක් සම්චුචිත වියදම් ගිණුම සඳහා සිදු කර ඇත.

## 2.18 නෛතික ගැටළු

2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිකයන්ට අදාළ ගැටළු පිළිබඳව උසාවි, කම්කරු විනිශ්චය සභා සහ කම්කරු දෙපාර්තමේන්තුවේ නොවිසිඳී ඇති නෛතික කර්තව්‍යයන්.

## 2.19 ගිණුම්කරණ ප්‍රතිපත්තින්හි වෙනස්කම් පිළිබඳව ප්‍රත්‍යක්ෂණ භාවිතය

2012 වසරේ සිටමහා භාණ්ඩාගාරය විසින් දෙන ලද ප්‍රාග්ධන ප්‍රදානයන් වෙත සිදු කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වී ඇත. ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදානයන් ICTAD විසින්ප්‍රදාන ගිණුමට බැර කර ඇත.ICTAD විසින් වර්තමානයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අදාළව ප්‍රාග්ධන ප්‍රදානයන් විලම්භිත ආදායම ලෙස සැළකීමටත්, පුනරාවර්තන ප්‍රදානයන් අනෙකුත් ආදායම ලෙස සැළකීමටත් තීරණය කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්වීම ප්‍රත්‍යක්ෂණාත්මකව ගණනය කර 2012 වසරට අදාළ සාපේක්ෂ ප්‍රකාශය නැවතත් ප්‍රකාශයට පත් කර ඇත. 2012 වසරෙහි වෙනස්වීමේ බලපෑම පහත ආකාරයට වගු ගත කර ඇත.

| විස්තරය | | 2012 වසරට එල්ල වී ඇති බලපෑම් |
|---|---|---|
| විලම්භිත ආදායමේ ඉහල යාම | 1,440,068,039.84 | |
| අනෙකුත් ආදායම්වල ඉහල යාම | 764,440,796.46 | |
| අතිරික්තයේ ඉහල යාම | | 2,204,508,836.30 |
| ප්‍රදාන ගිණුමේ පහල යාම | (2,204,508,836.30) | |
| ප්‍රදාන ගිණුමේ පහල යාම | (282,241,548.88) | (2,486,750,385.18) |
| විලම්භිත ආදායමේ ඉහල යාම | | 282,241,548.88 |

## 2.20 JBIC ව්‍යාපෘතිය

JBIC ව්‍යාපෘතිය නිම කර ඇති අතර එහි වත්කම් හා වගකීම් 2013 වසරෙහි ICTAD ගිණුමෙහි අවධානයට යොමු කර ඇත.

# ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය

## අවසන් ගිණුම - 2013

## අන්තර්ගතය

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය

ශුද්ධ වත්කම්හි වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශනයන් සඳහා සටහන්

**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**
**2013.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**
**2013.12.31 දිනට**

| විස්තරය | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| බැංකු හා අත ඉතිරිය | 1 | 5,837,816.16 | 15,292,433.50 |
| ආයෝජන - භාණ්ඩාගාර බිල්පත් (හීනවන සංචිත) | 2 | 15,707,803.20 | 15,707,803.20 |
| වෙළඳාම් සහ අනෙකුත් ලැබීම | 3 | 37,850,124.96 | 23,873,491.41 |
| තොග | 4 | 147,851,060.57 | 194,121,234.96 |
| පෙරගෙවීම් | | 1,038,991.63 | 1,004,193.67 |
| | | **208,285,796.52** | **249,999,156.74** |
| ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කාර්යය (තේමා උද්‍යාන) | | 33,196,408.61 | 22,163,160.50 |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල යන්ත්‍ර සහ උපකරණ | 5 | 620,369,481.47 | 455,320,170.94 |
| **මුළු වත්කම්වල එකතුව** | | **861,851,686.60** | **727,482,488.18** |
| **වගකීම්** | | | |
| **ජංගම වගකීම්** | | | |
| ණයගැතියන් සහ ණයහිමියන් | 6 | 70,058,967.21 | 70,025,612.22 |
| | | **70,058,967.21** | **70,025,612.22** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| පාරිතෝෂිත ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 7 | 58,306,766.50 | 55,682,361.50 |
| නැවත ගෙවිය යුතු විදේශාධාර | | 2,663,658.98 | 2,663,658.98 |
| | | **60,970,425.48** | **58,346,020.48** |
| **මුළු වගකීම්** | | **131,029,392.69** | **128,371,632.70** |
| **ශුද්ධ වත්කම්** | | **730,822,293.91** | **599,110,855.48** |
| **ශුද්ධ වත්කම් / වටිනාකම** | | | |
| විලම්භිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන | 8 | 371,215,686.51 | 366,716,260.75 |
| ප්‍රදානයන් | 9 | 271,556,720.38 | 224,604,675.82 |
| ප්‍රතිතක්සේරුකරණය - ස්ථාවර වත්කම | | 259,369,929.03 | 78,295,000.00 |
| සමුච්චිත අතිරික්ත (හිඟ) | | (171,320,042.01) | (70,505,081.09) |
| **මුළු ශුද්ධ වත්කම් / වටිනාකම** | | **730,822,293.91** | **599,110,855.48** |

පිටු අංක 6 සිට 21 දක්වා සඳහන් විශේෂිත මූල්‍ය ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනයන්ගේ වැදගත් අංගයකි.

**සහතිකය**

2013.12.31 දක්වා සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සහ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂයට අතිරික්තය / (හිඟය) පිළිබඳව සත්‍ය සහ සාධාරණ විනිශ්චයක් ඉහත මූල්‍ය ප්‍රකාශනයන් මගින් ඉදිරිපත් කර ඇති බවට සහතික වෙමි.

**බී.එස්.එස්.හේවගේ**
**වැඩබලන අධ්‍යක්ෂ (මුදල්)**

**වාස්තු විද්‍යාඥ එච්.කේ.බාලචන්ද්‍ර**
**අධ්‍යක්ෂ ජනරාල්**

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම කළමනාකරණ මණ්ඩලය සතුය.
කළමනාකරණ මණ්ඩලය මගින් මූල්‍ය ප්‍රකාශණ අනුමත කර ඇති අතර ඒ වෙනුවෙන් අත්සන් කර ඇත්තේ

**වාස්තු විද්‍යාඥ අනුර දසනායක**
**සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

**එච්.ආර්.වී.පී. විජේවර්ධන**
**අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික**

**2014 දෙසැම්බර් 08**

**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**

**2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශය**

ප්‍රතිප්‍රකාශිත

| විස්තරය | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| ආදායම | 11 | 174,419,915.46 | 153,368,156.87 |
| අඩු කළා | | | |
| ආදායම් උපයන ක්‍රියාකාරකම් සඳහා වියදම් | 12 | 195,288,458.05 | 168,543,782.04 |
| **ලාභය/අලාභය ආදායම් ඉපයීම** | | (20,868,542.59) | (15,175,625.17) |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් - CETRAC | | 17,900,000.00 | 10,800,000.00 |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් - OTC | | 6,900,000.00 | 1,800,000.00 |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් - නඩත්තු | | 23,340,000.00 | 8,100,000.00 |
| | | 27,271,457.41 | 5,524,374.83 |
| භාණ්ඩාගාරයෙන් ලැබීම් - පුනරාවර්තන | | 27,500,000.00 | 26,450,000.00 |
| අනෙකුත් ආදායම් | 13 | 46,369,011.37 | 11,965,431.20 |
| අඩු කළා | | | |
| පරිපාලන වියදම් | 14 | 48,856,149.00 | 41,601,997.89 |
| අනෙකුත් වියදම් | 15 | 29,007,082.32 | 23,099,208.84 |
| මූල්‍යමය පිරිවැය | | 111,770.01 | 99,492.82 |
| **ලාභ/(අලාභ) ක්ෂය වෙන්කිරීමට පෙර** | | 23,165,467.45 | (20,860,893.52) |
| අඩු කළා: | | | |
| ක්ෂයවීම් | | 44,992,562.88 | 66,092,204.45 |
| ලාභ අලාභ අවදානම් හා බොල්ණය ප්‍රතිපාදන වෙන්කිරීමට පෙර | | (21,827,095.43) | (86,953,097.97) |
| අඩුකළ | | | |
| අවදානම් හා බොල්ණය සඳහා ප්‍රතිපාදන | | (2,102,448.25) | (8,194,952.54) |
| කාල සීමාව සඳහා ශුද්ධ ලාභ / (අලාභ) | | (19,724,647.18) | (78,758,145.43) |

## ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය

## 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම් / වටිනාකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

ප්‍රතිප්‍රකාශිත

| | සමුච්චිත අතිරික්තය/හිගය රු. | ස්ථාවර වත්කම් නැවත ඇගයීම රු. | ප්‍රදාන රු. | මුළු එකතුව රු. |
|---|---|---|---|---|
| 2011.12.31 දිනට ශේෂය | (2,196,255,771.96) | | 2,758,464,150.97 | 562,208,379.01 |
| ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් | | | | |
| ප්‍රතිප්‍රකාශිත ශේෂය | (2,196,255,771.96) | | 2,758,464,150.97 | 562,208,379.01 |
| **2012 වසර සඳහා ශුද්ධ වත්කම් වටිනාකම්වල වෙනස්වීම්** | | | | |
| ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්වීම් | 2,204,508,836.30 | | (2,204,508,836.30) | |
| ප්‍රති තක්සේරුකරණය | | 78,295,000.00 | | 78,295,000.00 |
| | 8,253,064.34 | 78,295,000.00 | 553,955,314.67 | 640,503,397.01 |
| කාලය සඳහා අතිරික්තය / (හිගය) | (78,758,145.43) | | | (78,758,145.43) |
| විලම්භිත ආදායම | | | 37,365,621.90 | 37,365,621.90 |
| **2012.12.31 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය** | **(70,505,081.09)** | **78,295,000.00** | **591,320,936.57** | **599,110,855.48** |
| ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් | (81,090,313.74) | | | (81,090,313.74) |
| | (151,595,394.83) | 78,295,000.00 | 591,320,936.57 | 518,020,541.74 |
| කාල වකවානුව සඳහා අතිරික්තය / (හිගය) | (19,724,647.18) | | | (19,724,647.18) |
| ප්‍රදාන | | | 46,952,044.56 | 46,952,044.56 |
| විලම්භිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන | | | 4,499,425.76 | 4,499,425.76 |
| ප්‍රති තක්සේරුකරණය | | 181,074,929.03 | | 181,074,929.03 |
| **2012.12.31 දිනට ඉදිරියට ගෙනා ශේෂය** | **(171,320,042.01)** | **259,369,929.03** | **642,772,406.89** | **730,822,293.91** |

**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**

**2013.12.31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වක්‍ර මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

ප්‍රතිප්‍රකාශිත

| විස්තරය | 2012<br>රු. | 2011<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් මුදල් ප්‍රවාහය** | | |
| සාමන්‍ය කටයුතුවලින් අතිරික්තය /(ඌණතාවය) | (19,724,647.18) | (78,758,145.43) |
| **ගැලපුම්** | | |
| ක්ෂයවීම් | 44,759,949.24 | 66,092,204.45 |
| බදුකුලිය | 232,613.64 | |
| පාරිතෝෂිත වෙන්කිරීම් | 5,602,988.75 | 4,460,705.75 |
| පොලී ආදායම් - භාණ්ඩාගාර බිල්පත් | (1,593,439.69) | (1,675,520.73) |
| දේපල යන්ත්‍ර සහ උපකරණ විකිණීමෙන් ලාභය / අලාභය | | (3,143,281.31) |
| බොල් ණය සඳහා වෙන්කිරීම් | (2,102,448.25) | (8,194,952.54) |
| විලම්භිත ආදායම | (35,510,574.24) | (2,484,378.10) |
| පෙර වර්ෂයේ ගැලපුම් | (250,467.35) | |
| **ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් කටයුතුවලින් ලැබූ මුළු මුදල් ප්‍රමාණය** | **(8,586,025.08)** | **(23,703,367.91)** |
| ගෙවිය යුතු වැඩිවීම් / අඩුවීම් | 9,346,610.78 | 38,062,996.01 |
| අනෙකුත් ජංගම වත්කම්වල වැඩිවීම් අඩුවීම් | (5,327,423.97) | 10,782,634.06 |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබූ මුදල් ප්‍රවාහය** | **(4,566,838.27)** | **25,142,262.16** |
| ගෙවන ලද පාරිතෝෂිතය | (2,978,583.75) | (3,979,422.00) |
| **මෙහෙයුම් කටයුතුවලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **(7,545,422.02)** | **21,162,840.16** |
| **මූල්‍ය ප්‍රවාහය ආයෝජන කටයුතු මගින්** | | |
| යන්ත්‍ර සහ උපකරණ මිලට ගැනීම් | (40,000,192.49) | (66,272,252.11) |
| යන්ත්‍ර සහ උපකරණ විකිණීමෙන් උත්පාදන | | 3,143,281.31 |
| පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 1,624,108.50 | 1,589,745.15 |
| **අයෝජන කටයුතුවලින් ලැබූ මුළු මුදල් ප්‍රවාහය** | **(38,376,083.99)** | **(61,539,225.65)** |
| **මූල්‍ය කටයුතුවලින් ලැබූ මුළු මුදල් ප්‍රවාහනය** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | 40,010,000.00 | 39,850,000.00 |
| මූල්‍ය කටයුතුවලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය | **40,010,000.00** | **39,850,000.00** |
| මුදල් හා එවැනි ද්‍රවශීල වත්කම්වල ශුද්ධ මූල්‍ය වැඩිවීම | (5,911,506.01) | (526,385.49) |
| කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා එවැනි ද්‍රවශීල වත්කම් | 11,749,322.17 | 12,275,707.66 |
| කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා එවැනි ද්‍රවශීල වත්කම් | **5,837,816.16** | **11,749,322.17** |

# ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය
# මූල්‍ය ප්‍රකාශනය සඳහා සටහන්

## 01 සාමූහික තොරතුරු

### 1.1 ව්‍යවස්ථාමය ස්වභාවය

1992 ජුනි මස අංක 718/5 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත 1957 අංක 49 දරණ රාජ්‍ය කර්මාන්ත සංස්ථා පනත යටතේ පිහිටුවන ලද සංවිධානයක් වන ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ඉක්ටෑඩ්) වර්තමානයේදී ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචි කාර්යලය අංක 123, විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි ස්ථාපිත කර ඇත.

### 1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම් ස්වභාවය

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මෙහෙවර ලෙස සඳහන් වන්නේ රෙගුලාසි පැනවීම සහ පහසුකම් සැපයීම හරහා ක්‍රියාශීලී වෘත්තිමය සහ විශ්වාසනීය, වටිනාකම් එකතු වූ සේවාවන් තහවුරු කිරීම, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සම්පත් සංවර්ධනය සහ ගුණාත්මක සම්මතයන් ඉහළ දැමීම තුලින් දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවයන්ට මුහුණදිය හැකි ස්ථිරසාර ජාතික සංවර්ධනයක් ඇති කිරීමයි.

### 1.3 සේවක සංඛ්‍යාව

2013 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ සේවක සංඛ්‍යාව 262ක් පමණ වේ. ඊට සාපේක්ෂව 2012 වසරෙහි සේවක සංඛ්‍යාව 260ක් වේ.

### 1.4 මූල්‍ය වසර

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මූල්‍ය වසර 2013 දෙසැම්බර් 31 දිනට අවසන් මාස 12 ක කාලයකින් අවසන් වේ.

### 1.5 නිල වශයෙන් නිකුත් කිරීම සඳහා අනුමත දිනය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා දෙසැම්බර් මස 05 වැනි දිනට අනුමැතිය ලබා දී ඇත.

## 02 විශේෂ ගිණුම් ප්‍රතිපත්ති

### 2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම



43

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මූල්‍ය ප්‍රකාශය ඓතිහාසික පිරිවැය පදනම මත ශ්‍රී ලංකා රුපියල්වලින් පිළියෙල කර ඇති අතර, එය ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

2.2 ප්‍රකාශයේ අනුකූලතාවය

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය සේවා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. (SLPASAS)

2.3 වත්කම් සහ තක්සේරුකරණයේ පදනම

2.3.1 මූල්‍ය ප්‍රකාශනයෙහි දේපළ, යන්ත්‍ර, උපකරණ අඩු ක්ෂයවීම් පිරිවැයන් වාර්තා කරයි.

දේපළ. යන්ත්‍ර සහ උපකරණ වල පිරිවැය ප්‍රතිතක්සේරුගත අගයන් හෝ ඕනෑම අභඹු ලෙස මිලදී ගැනීමේ පිරිවැයන් දක්වයි.

2.3.2 ප්‍රතිතක්සේරුකරණය ක්‍රියාත්මක වන දිනය වන්නේ 2012.12.31

පහත සඳහන් උපකල්පනයන් සහ ක්‍රමවේදයන් පදනම් ව ප්‍රතිතක්සේරුකරණය සිදු කර ඇත.

- වත්කම්හි වෙළඳපල වටිනාකම
- වත්කම්හි වර්තමාන තත්ත්වය
- වත්කම්හි ආයු කාලය සහ ජීවිත කාලය
- වත්කම්හි තාක්ෂණය

2.3.3 සියළුම දේපළ, යන්ත්‍ර සහ උපකරණවල පිරිවැය මත සරල මාර්ග ක්‍රමය භාවිතා කර ඒවායේ ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලැබේ. එම ක්ෂයවීම් අගය ඉවත්කර ගැනීම සඳහා පහත සඳහන් කාර්යක්ෂම ජීව කාලය සමාන වාරිකවලින් බෙදීමෙන් ලබාගත හැක. 2013 වසරේ සිට බලපවත්නා සඵල මිල අනුපාතය පහත දැක්වේ.

| විස්තරය | ආයු කාලය | අනුපාතය |
|---|---|---|
| භූමිය | | 0.0 |
| ගොඩනැගිලි සහ ගොඩනැගිලි වැඩි දියුණුව | 40 | 2.5 |
| ලී බඩු සවිකිරීම්, කාර්යාල උපකරණ | 05 | 20.5 |
| යන්ත්‍රෝපකරණ සහ උපකරණ | 08 | 12.5 |
| ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ | 04 | 25.0 |
| මෙවලම් හා ආයුධ | 05 | 20.0 |
| මෝටර් රථ | 08 | 12.5 |

යම් නිසි දේපළක, යන්ත්‍රයක හෝ උපකරණයක ක්ෂයවීම් එය භාවිතයත් සමඟම ඇරඹෙන අතර, ඒවායේ ක්ෂයවීම් ගාස්තුව සෑම විශේෂිත කොටසක්ම සැලකිල්ලට ගෙන වෙන් වෙන්ව ගණනය කරනු ලැබේ. නිදහසේ භුක්ති විදිය හැකි දේපල සඳහා ක්ෂයවීම් අදාළ නොවනු ඇත.

44

2.4 භාණ්ඩ ලේඛනය

භාණ්ඩ ලේඛනයේ ඇතුළත් අමතර කොටස්, නඩත්තු උපකරණ, පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය, ලිපි ද්‍රව්‍ය තොග ආදිය සාමාන්‍ය පිරිවැය පදනම මත ප්‍රකාශයට පත් කරයි.

2.5 බදුගත් භූමිය සැලකිල්ලට ගන්නා විට බදු කාල සීමාව තුළ සමාන වාරික බැගින් බදු වාරික ඉවත් කෙරේ.

2.6 අමාත්‍යාංශය විසින් 2010 කාල වකවානුව තුළ CHPD ගොඩනැගිල්ලෙහි වත්කම් පවරාගෙන ඇත. මෙම වත්කමෙහි වටිනාකම 2013 වසරේදී ගණනය කර ඇත.

2.7 2013 වසර තුළ GIZ හි වත්කම් අමාත්‍යාංශය මගින් පවරාගෙන ඇත. මෙම වත්කම්හි වටිනාකම් 2013 වසර තුළ ගණනය කර ඇත.

2.8 ලැබිය යුතු මුදල්

ඇස්තමේන්තුගත ලාභයේ වටිනාකම හා සමානව ලැබිය යුතු මුදල් සඳහන් කර ඇත. අවිනිශ්චිත සහ බොල් ණය සඳහා ශුද්ධ ප්‍රතිපාදන මේ සඳහා සැලකිල්ලට ගනු ලැබේ.

2010.12.31 දිනට ණයකරුවන් නිශ්කාශනය සඳහා නිශ්කාශන ගිණුමට බැර කර ඇත.

2.9 බොල් හා අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන

බොල් හා අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන ගණනය කර පහත ආකාරයට ගිණුම්ගත කර ඇත.

| නොගෙවූ කාලය | ප්‍රතිපාදන |
|---|---|
| මාස 12 ට අඩු | - |
| අවුරුදු 1 සිට 2 | |
| අවුරුදු 3 සිට 4 | 5% |
| අවුරුදු 4-5 | |
| අවුරුදු 5 ට වැඩි | 100% |

2.10 මුදල් හා මුදල් සාම්‍යයන්

මුදල් හා මුදල් සාම්‍යයන්හි අන්තර්ගත වන්නේ බැංකු ගත හා අත ඇති මුදල් සහ මුදල් අයෝජනයයි.

2.11 විලම්භිත ආදායම

මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායමෙහි අන්තරගත වේ.

යම් වත්කමක කාර්යක්ෂම ආයු කාලය පුරාවට විලම්භිත ආදායම ක්‍රමානුකූල සහ තර්කානුකූල පදනම මත සැලකිල්ලට ගැනෙන්නේ, විලම්භිත ආදායම වන ප්‍රාග්ධන ප්‍රමාණයන් සහ ණය හිලව් ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා යොදා ගැනෙන්නේ නම්ය.

2.12 විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය

එක් එක් සේවකයා විසින් සම්පූර්ණ කර ඇති සෑම වසරක් ම සේවයට බැඳුනු වසරෙහි සිට සැලකිල්ලට ගෙන සියළුම සේවකයන්ගේ පූර්ව මූල්‍ය වසරෙහි අවසන් මස උපයාගත් අඩ වැටුප් පදනම් ව ගණනය කිරීමෙන් ලැබෙන වටිනාකම හා සමාන ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශයෙහි විශ්‍රාම වැටුප් පාරිතෝෂිතය සඳහා වෙන්කර ඇත. කෙසේ නමුත් 1983 අංක 12 දරණ විශ්‍රාම වැටුප් පාරිතෝෂිත පනතට යටත්ව නොකඩවා වසර 5ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සේවකයින් සඳහා පමණක් මෙම වගකීම දැරීමට සිදුවේ.

2.13.1 රජයේ ප්‍රදාන

රජයෙන් ලැබෙන පුනරාවර්තන ප්‍රදාන, ආදායම් ප්‍රකාශයෙහි ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයෙහි ආදායම් මාර්ගයන් වශයෙන් නිරූපිත වේ.

2.13.2 ප්‍රාග්ධන ප්‍රදාන

මුදල් සහ වෙනත් ආකාරයෙන් රජයෙන් ලබාදෙන ලද ප්‍රාග්ධන ප්‍රදාන විලම්භිත ආදායම වශයෙන් ගැණෙන අතර, එය යම් වත්කමක කාර්යක්ෂම ආයු කාලය පුරාවට ක්‍රමාණුකූල හා තර්කානුකූල පදනම මත හැඳින්වේ.

2.13.3 ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රාග්ධන ප්‍රදාන යටතේ අත්පත් කර ගන්නා දේපල සහ උපකරණ වල වටිනාකම රු.40,000,192.00

2.14 ආදායම හඳුනාගැනීම

පහත සඳහන් මාර්ගයන්ගෙන් ආයතනය ආදායම ගණනය කරනු ලබන අතර, ඒවා උපචිත පදනම මත ගිණුම්කරණ කාර්යයේදී සැලකිල්ලට ගනු ලැබේ.

(අ) යන්ත්‍රෝපකරණ කුලියට දීම
(ආ) පාඨමාලා ගාස්තු
(ඇ) ප්‍රකාශන විකිණීම
(ඇ) ශ්‍රවනාගාරය, සම්මන්ත්‍රණ ශාලා සහ රැස්වීම් ශාලා කුලියට දීම.
(ඉ) සම්මන්ත්‍රණ සහ වැඩමුළු

2.15 වියදම

සියළුම වියදම් උපචිත පදනම යටතේ සැලකිල්ලට ගැනේ.

2.16 සමුච්චිත පිරිවැය සඳහා ගැලපුම්

රු.81,090,313.74ක ගැලපුමක් සමුච්චිත වියදම් ගිණුම සඳහා සිදුකර ඇත.

2.17 නීතිමය ගැටළු

2013 දෙසැම්බර් 31 දිනට සේවකයින්ට අදාළ නීතිමය ගැටළු කම්කරු විනිශ්චය සභාවන්හි, කම්කරු දෙපාර්තමේන්තුව සහ මානව හිමිකම් කොමිසම ආදි ස්ථානයන්හි අවසන් නොවී පවතී. ඒවායෙහි තොරතුරු මේ සමඟ අමුණා ඇත.



46

2.18 ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් අතීතයට බලපාන පරිදි යෙදීම.

මහාභාණ්ඩාගාරයෙන් ලැබී ඇති ප්‍රාග්ධන ප්‍රදානයන් සැලකිල්ලට ගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්තිය 2012 වසරේ සිට වෙනසකට ලක්වී ඇත. පූර්ව වසර වලදී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ඉක්ටාඩ්) විසින් ප්‍රාග්ධන සහ පුනරාවර්තන ප්‍රදානයන් ආධාර ගිණුමට බැර කරන ලදි. වර්තමානයේදී ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ඉක්ටාඩ්) විසින් ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ප්‍රාග්ධන ප්‍රදානයන් විලම්භිත ආදායම ලෙසටත්. පුනරාවර්තන ප්‍රදාන වෙනත් ආදායම ලෙසටත් සැලකිල්ලට ගැනීමට තීරණය කර ඇත.

ගිණුම්කරණ ප්‍රතිපත්තියෙහි වෙනස අතීතයට බලපාන පරිදි ගණනය කර ඇති අතර. 2012 වසරට සාපේක්ෂව ඉදිරිපත් කර ඇති ප්‍රකාශය නැවතත් ප්‍රකාශයට පත්කොට ඇත. 2012 වසරෙහි සිදුව ඇති වෙනස මගින් සිදුව ඇති බලපෑම පහත ආකාරයට වගුගත කර ඇත.

| විස්තරය | | 2012 වසරට බලපෑම රු. |
|---|---|---|
| විලම්භිත ආදායමෙහි ඉහළයාම | 1,440,068,039.84 | |
| වෙනත් ආදායම් ඉහළ යාම | 764,440,796.46 | |
| අතිරික්තයේ වර්ධනය | | 2,204,508,836.30 |
| ප්‍රදාන ගිණුමෙහි අඩුවීම | (2,204,508,836.30) | |
| ප්‍රදාන ගිණුමෙහි අඩුවීම | (282,241,548.88) | (2,486,750,385.18) |
| විලම්භිත ආදායමෙහි වැඩිවීම | | 282.241.548.88 |

2.19 JBIC ව්‍යාපෘතිය

JBIC ව්‍යාපෘතිය නිමකර ඇති අතර. එයට අයත් වත්කම් සහ වගකීම් 2013 වසර තුල ද ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය (ඉක්ටාඩ්) ගිණුම් සඳහා යොදා ගෙන ඇත.



47

**නඩු ලැයිස්තුව**

**ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය**

| | නඩු අංකය | උසාවිය ආයතනය | විෂය කරුණ |
|---|---|---|---|
| 1 | ඩී.ජිනසේන ද සිල්වා | මහේස්ත්‍රාත් උසාවි අංක 05 කොළඹ | හිඟ පාරිතෝෂිත ලබා ගැනීම |
| 2 | ඩබ්.ඩී.විතාරන මහතා | කම්කරු දෙපාර්තුමේන්තුව | හිඟ සේවක අර්ථසාධක අරමුදල් ලබා ගැනීම |
| 3 | එන්.කේ.මිරැන්ඩා මහතා | කම්කරු විනිශ්චය සභාව | වැඩ තහනම් කිරීම |
| 4 | ඩබ්.ඩී.විතාරන මහතා | කම්කරු විනිශ්චය සභාව | වැඩ තහනම් කිරීම |
| 5 | එන්.කේ.මිරැන්ඩා මහතා | කම්කරු දෙපාර්තුමේන්තුව | පැවරීමක් සඳහා ගෙවීම |
| 6 | එන්.කේ.මිරැන්ඩා මහතා | මානව හිමිකම් කොමිසම | ඉහත පැවරීම සම්බන්ධයෙන් ගෙවීම |
| 7 | පී.බී.එච්.කුලසිංහ මහතා | කොළඹ මහාධිකරණය | සේවය අවසන් කිරීම(කොළඹ කම්කරු විනිශ්චය සභාවේ අභියාචනය) |

| සංකේත අංකය | විස්තරය | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|
| | සටහන 1<br>**බැංකුගත හා අත ඉතිරි මුදල්** | | | |
| 684 | ලංකා බැංකුව කොල්ලුපිටිය ගිණුම | | 1,309,135.05 | 317,619.05 |
| 685 | ලංකා බැංකුව බත්තරමුල්ල (CETRAC) | | 819,549.44 | 200,723.79 |
| 686 | ලංකා බැංකුව ටොරිංටන් | | 3,230,541.71 | |
| 687 | ලංකා බැංකුව තිරප්පනේ - OTC | | | 329,077.09 |
| 688 | ලංකා බැංකුව ටොරිංටන් ඉදිකිරීම් සංවර්ධන ව්‍යාපෘති | | | 21,434.82 |
| | | | **5,359,226.20** | **868,854.75** |
| 694 | අත ඉතිරි මුදල් පැලවත්ත | | 88,300.00 | |
| 691 | අත ඉතිරි මුදල (ප්‍රධාන කාර්යාලය) | | 263,134.76 | 12,716,903.55 |
| | | | **351,434.76** | **12,716,903.55** |
| 693 | අත ඉතිරි මුදල් (OTC) | | 124,500.00 | 1,704,020.00 |
| 692B | සුළු මුදල් අග්‍රිම | 34 | 2,655.20 | 2,655.20 |
| | | | **127,155.20** | **1,706,675.20** |
| | සටහන 2 | | **5,837,816.16** | **15,292,433.50** |
| | **ආයෝජන** | | | |
| 551 | භාණ්ඩාගාර බිල්පත් (හීනවන අරමුදල) | 33 | 15,707,803.20 | 15,707,803.20 |
| | | | **15,707,803.20** | **15,707,803.20** |

| සංකේත අංකය | විස්තරය | සටහන | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|---|
| | සටහන 3 | | | |
| | **වෙළඳ සහ අනෙකුත් ලැබීම්** | | | |
| | **ණයගැතියන්** | | | |
| 620 | ණයගැති පාලනය | | | 12,934,791.75 |
| 620 a | ණයගැති පාලනය (ප්‍රධාන කාර්යාලය) | 13 | 1,474,408.75 | |
| 620b | ණයගැති පාලනය - CHPD | 14 | 1,067,673.00 | |
| 62c | ණයගැති පාලනය - CETRAC | 15 | 2,839,922.70 | |
| 620d | ණයගැති පාලනය - OTC | 16 | 4,024,584.62 | |
| 621 | ණයගැති නිෂ්කාශන ගිණුම | 17 | 6,139,897.23 | 6,761,278.21 |
| 622 | සෞඛ්‍ය රක්ෂණය | | | 5,235.51 |
| 623 | අයවිය යුතු සෞඛ්‍ය රක්ෂණය | 18 | 597,597.90 | 168,250.42 |
| 624 | අයවිය යුතු භාණ්ඩාගාර ප්‍රදාන | 19 | 14,608,000.00 | |
| 625 | ලැබිය යුතු හිග වැටුප් | 20 | 407,845.57 | |
| 642 | වෙනත් ණයගැතියන් | 21 | 117,059,557.97 | 118,042,203.56 |
| 647 | දේශීය ආදායම් | 22 | 4,149,645.00 | 1,128,270.48 |
| | | | **152,369,132.74** | **139,040,029.93** |
| | **තැන්පතු** | | | |
| 632 | සේවා සඳහා තැන්පතු | 23 | 389,250.00 | 508,250.00 |
| | | | **389,250.00** | **508,250.00** |
| | **අත්තිකාරම්** | | | |
| 628 | සැපයුම්කරුවන් සඳහා අත්තිකාරම් | 24 | 486,709.97 | 141,327.71 |
| 629 | සේවාවන් සඳහා අත්තිකාරම් | 25 | 7,639.50 | 74,831.50 |
| 656 | සාමාන්‍ය අත්තිකාරම් | 26 | 200,124.00 | 1,791,648.71 |
| 670 | පුහුණු මධ්‍යස්ථාන සඳහා අත්තිකාරම් | | | 63,877.00 |
| 671 | පුහුණු පාඨමාලා සඳහා අත්තිකාරම් | 27 | 103,255.00 | 27,744.00 |
| 672 | ප්‍රමිතිය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සඳහා අත්තිකාරම් | 28 | 100,000.00 | 100,000.00 |
| | | | **897,728.47** | **2,199,428.92** |
| | **කාර්ය මණ්ඩල ණයගැතියෝ** | | | |
| 650 | උත්සව අත්තිකාරම් | 29 | 235,534.70 | 274,000.00 |
| 652 | ගමන් ගාස්තු අත්තිකාරම් | 30 | 3,425.00 | 3,425.00 |
| 654 | ඉන්ධන අත්තිකාරම් | 31 | 44,206.00 | 10,983.20 |
| 658 | ආපදා ණය | 32 | 4,127,921.98 | 4,156,646.54 |
| 659 | පොත් ණය | | | 250.00 |
| | | | **4,411,087.68** | **4,445,304.74** |
| | | | 158,067,198.89 | 146,193,013.59 |
| 679 | අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන | | (120,217,073.93) | (122,319,522.18) |
| | | | **37,850,124.96** | **23,873,491.41** |
| | සටහන 4 | | | |
| | **තොග** | | | |
| 1120 | තොග (OTC) | 10 | 54,430,282.81 | 44,980,120.11 |
| 1120 | තොග (CETRAC) | 11 | 81,910,199.57 | 134,896,237.03 |
| 1120 | තොග (ප්‍රධාන කාර්යාලය) | 12 | 11,510,578.19 | 14,244,877.82 |
| | | | **147,851,060.57** | **194,121,234.96** |

| සංකේත අංකය | දේපල යන්ත්‍ර හා උපකරණ | ව්‍යාපෘති අංකය | 2013.01.01 | පිරිවැය 2013.01.01 | එකතු කිරීම් 2013 | ප්‍රතිතක්සේරුකරණය 2013 | | | මුළු පිරිවැය 2013.12.31 | ිගය 2013 | සමුච්චිත ක්ෂයවීම් | ශුද්ධ ශේෂය 2013.12.31 | ශුද්ධ ශේෂය 2012.12.31 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සටහන 5 | | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 500 | භූමිය | | 77,000.50 | 77000.50 | | | | | 77,000.50 | | | 77,000.50 | 77,000.50 |
| 502 | ගොඩනැගිලි | 1 | 1,155,348,799.06 | 1,161,081,863.41 | 5,733,054.35 | | | | 1,161,081,863.41 | 27,908,179.62 | 890,642,318.58 | 270,439,544.83 | 292,614,660.10 |
| 503 B | පරිශ්‍රයන් වැඩිදියුණු කිරීම | 2 | 1,535,817.63 | 1,535,817.63 | | | | | 1,535,817.63 | 38,395.44 | 115,607.09 | 1,420,210.54 | 1,458,605.98 |
| 504 | මෝටර රථ | 3 | 71,449,600.21 | 73,125,000.95 | 109,875.00 | 21,575,000.00 | (109,875.00) | (19,899,599.26) | 73,125,000.95 | 6,443,750.00 | 6,443,750.00 | 66,681,250.95 | 51,550,000.95 |
| 506 | ගෘහභාණ්ඩ සවිකිරීම සහ කාර්යාල උපකරණ | 4 | 110,509,048.57 | 119,153,409.78 | 7,731,296.12 | 46,274,789.35 | (11,453,183.31) | (33,907,136.95) | 119,154,813.78 | 873,608.08 | 64,322,713.50 | 54,832,100.28 | 13,152,806.20 |
| 508 | යන්ත්‍ර සහ උපකරණ | 5 | 288,847,716.26 | 298,967,411.14 | 14,053,883.93 | 129,980,000.00 | (22,430,532.76) | (111,483,656.29) | 298,967,411.14 | 8,967,887.67 | 97,963,019.09 | 201,004,392.05 | 88,368,928.55 |
| 509 | ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ | 6 | 22,418,883.09 | 17,966,563.06 | 1,048,254.51 | 3,062,441.21 | (2,492,144.89) | (6,070,870.90) | 17,966,563.02 | 126,134.99 | 14,037,719.43 | 3,928,843.59 | 2,436,427.79 |
| 510 | මෙවලම් සහ ආයුධ | 7 | 127,802,070.90 | 141,606,531.66 | 290,570.47 | 15,783,846.53 | (551,341.89) | (1,718,614.31) | 141,606,531.70 | 139,903.44 | 125,188,773.60 | 16,417,758.10 | 1,034,586.39 |
| 1124 | පුස්තකාල පොත්-ප්‍රධාන කාර්යාලය | 8 | | | | 1,435,929.79 | | - | 1,435,929.79 | | | 1,435,929.79 | |
| 1122 | පුස්තකාල පොත් - CETRAC | 9 | 1,310,450.00 | 1,310,450.00 | | | | | 1,310,450.00 | 262,090.00 | 262,090.00 | 1,048,360.00 | 1,310,450.00 |
| | | | 1,779,299,386.22 | 1,814,824,048.13 | 28,966,944.38 | 218,112,006.88 | (37,037,077.85) | (173,079,877.71) | 1,816,261,381.92 | 44,759,949.24 | 1,198,975,991.29 | 617,285,390.63 | 452,003,466.46 |
| 501 | භූමිය බදු ගැනීම | | 8,015,771.86 | 8,015,771.86 | | | | | 8,015,771.86 | 232,613.64 | 4,931,681.02 | 3,084,090.84 | 3,316,704.48 |
| | | | | | | | | | **1,824,277,153.78** | **44,992,562.88** | **1,203,907,672.31** | **620,369,481.47** | **455,320,170.94** |

| සංකේත අංකය | විස්තරය | සටහන | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|---|
| | සටහන 6 **ණයහිමියන් සහ ණයගැතියන්** | | | |
| 700 | වැටුප් වර්ධක හිඟ මුදල් සඳහා වෙන්කිරීම් | | | 924,462.59 |
| 702 | අත්තිකාරම් ලෙස ලැබූ ආදායම | 36 | 6,304,770.00 | 7,986,055.12 |
| 704 | ආපසු ගෙවිය යුතු රඳවා ගැනීම් | 37 | 1,824,578.19 | 363,505.46 |
| 708 | විවිධ තැන්පතු (නැවත ගෙවිය යුතු) | | | 1,750.00 |
| 710 | ණයහිමියන් පාලනය | 38 | 12,005,552.09 | 27,320,515.44 |
| 711 | විවිධ ණයහිමියෝ | 39 | 31,887,267.92 | 11,401,724.16 |
| 714 | ණයගැති වියදම් | 40 | 14,647,663.94 | 11,031,384.74 |
| 730 | ගෙවිය යුතු E.P.F. | 41 | 1,707,385.96 | 1,684,091.04 |
| 732 | ගෙවිය යුතු E.T.F. | 42 | 204,886.89 | 202,091.51 |
| 734 | මුද්දර වියදම් | 43 | 13,950.00 | 11,400.00 |
| 740 | ගෙවිය යුතු V.A.T. | 44 | 1,259,163.22 | 983,651.51 |
| 743 | ගෙවිය යුතු බදු | 45 | 11,249.00 | 4,526.00 |
| 744 | ගෙවිය යුතු ආර්ථික සේවා බද්ධ | | | 4,107,813.32 |
| 706 | නැවත ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු | 46 | 192,500.00 | 459,530.00 |
| 686 | ලංකා බැංකුව ටොරින්ටන් ගිණුම | | | 3,543,111.33 |
| | | | **70,058,967.21** | **70,025,612.22** |
| | සටහන 7 | | | |
| 715 | ගෙවිය යුතු පාරිතෝෂිත ප්‍රතිපාදන | 35 | 58,306,766.50 | 55,682,361.50 |
| | | | **58,306,766.50** | **55,682,361.50** |
| | සටහන 8 | | | |
| 816 | විලම්භිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන | | 371,215,686.51 | 366,716,260.75 |
| | | | **371,215,686.51** | **366,716,260.75** |
| | සටහන 9 **ප්‍රදානයන්** | | | |
| 813 | UNDP ප්‍රදාන | | 73,179,523.80 | 73,179,523.80 |
| 815 | අමාත්‍යාංශයෙන් ලැබුණු වත්කම් | | 207,540.00 | 207,540.00 |
| 840 | JBIC ප්‍රදාන | | 32,665,581.62 | |
| 818 | GIZ ප්‍රදාන | | 14,286,462.94 | |
| 812 | අත්පත්කරගත් ශුද්ධ වත්කම් (ICTAD) | | 149,907,162.02 | 149,907,162.02 |
| 803 | JICA ප්‍රදාන | | 1,310,450.00 | 1,310,450.00 |
| | | | **271,556,720.38** | **224,604,675.82** |
| | සටහන 10 සමුච්චිත අරමුදල | | | |
| | අවුරුද්ද මුල ඉතිරිය | | (70,505,081.09) | 8,253,064.34 |
| | ගැලපුම් | | (81,090,313.74) | |
| | අතිරික්තය (වසරෙහි හිඟය) | | (19,724,647.18) | (78,758,145.43) |
| | වසර අවසානයේ ඉතිරිය | | **(171,320,042.01)** | **(70,505,081.09)** |

| සංකේත අංකය | විස්තරය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| | සටහන 11 | | |
| | **අදායම** | | |
| 102 | යන්ත්‍රෝපකරණ කුලියට දීම | 10,568,139.26 | 12,833,892.57 |
| 103 | අළුත්වැඩියා අයකිරීම් | 551,680.49 | 511,428.55 |
| 104 | ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණ කාමර කුලියට දීම | 8,033,984.67 | 5,946,126.39 |
| 105 | වෘත්තීය පරීක්ෂණ ආදායම | 119,250.00 | 120,981.82 |
| 106 | පාඨමාලා ගාස්තු | 46,075,511.64 | 46,387,091.24 |
| 108 | සම්මන්ත්‍රණ | 8,534,113.57 | 5,802,088.94 |
| 107 | කුඩා පරිමාණ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය | 57,203.04 | 54,834.72 |
| 109 | කොන්ත්‍රාත්කරුවන්ගේ සාමාජික මුදල් | 80,675,565.52 | 65,993,647.70 |
| 110 | කුලිය | 3,230,080.00 | 2,390,600.00 |
| 112 | ප්‍රකාශන විකිණීම | 7,706,256.65 | 7,187,235.88 |
| 115 | සංචාරක බංගලාව | 252,210.00 | 248,200.00 |
| 128 | NVQ පුහුණු වැඩසටහන් ආදායම | 1,733,620.00 | |
| 135 | ගෘහස්ත ගාස්තු | 3,777,021.55 | 4,075,632.62 |
| 120 | උපදේශන සේවා | 652,565.64 | 1,361,482.15 |
| 178 | සේවාදායක උපකාරක සේවා | | |
| 124 | සමථකරණය ∴ විසඳීමේ ගාස්තු | 683,267.86 | 339,914.29 |
| 125 | ව්‍යාපෘති කළමනාකරණ සේවා | 1,481,845.57 | 115,000.00 |
| 136 | ICTAD සමථකරුවන්ගේ සංචිතය | 62,200.00 | |
| 169 | ඉදිකරන්නෝ හඳුනාගැනීමේ පත්‍ර | 225,400.00 | |
| | | **174,419,915.46** | **153,368,156.87** |
| | සටහන 12 | | |
| | **ආදායම් ඉපයීමේ කටයුතු සඳහා වියදම්** | | |
| | **පුද්ගල වේතන** | | |
| 200 | වැටුප් හා වේතන | 48,138,652.85 | 48,894,048.04 |
| 201 | ජීවන වියදම් දීමනාව | 13,634,756.49 | 12,646,796.50 |
| 203 | පැමිණීමේ දීමනාව | 2,307,296.62 | 2,351,019.73 |
| 206 | දූවිලි දීමනාව | 200,763.50 | 194,400.00 |
| 208 | වැඩ බැලීමේ දීමනාව | 391,417.54 | 312,057.19 |
| 210 | අනෙකුත් දීමනා | 543,700.00 | 31,200.00 |
| 220 | නිවාඩු සහ අතිකාල ගෙවීම් | 3,467,768.58 | 3,801,655.12 |
| 220a | නිවාඩු සහ අතිකාල ගෙවීම් (අ) | 3,663,529.14 | 2,746,214.07 |
| 224 | වෘත්තීය ආයතන සඳහා සාමාජික මුදල් | 30,798.80 | 36,989.20 |
| 226 | බෝනස් මුදල | 1,500,323.00 | 1,251,415.00 |
| 330 | E.P.F | 7,933,528.77 | 7,917,920.13 |
| 332 | E.T.F | 1,587,291.66 | 1,583,583.91 |
| 334 | පාරිතෝෂිතය | 3,588,742.50 | 3,395,118.75 |
| 336 | විශ්‍රාම වැටුප් | 16,935.00 | |
| | | **87,005,504.45** | **85,162,417.64** |

| සංකේත අංකය | විස්තරය | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| | **ගමන් වියදම්** | | |
| 236 | ගමන් වියදම් (දේශීය) | 356,222.25 | 414,012.50 |
| 236a | ගමන් වියදම් (ආදායම් ඉපයූ) | 905,374.00 | 724,557.50 |
| | | **1,261,599.25** | **1,138,570.00** |
| | **සැපයීම් සහ අවශ්‍යතා** | | |
| 240 | ඡායා පිටපත් වියදම් | 2,446,992.37 | 1,590,269.33 |
| 242 | ලිපිද්‍රව්‍ය | 1,344,625.55 | 1,421,469.51 |
| 244 | කාර්යාලීය අවශ්‍යතා | 458,197.11 | 718,494.70 |
| 245 | ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ ජාලගත ලියාපදිංචිය | 5,821,501.68 | |
| 246 | මුද්‍රණය යතුරු ලියනය සහ පරිවර්තනය | 136,500.00 | 221,926.83 |
| 248 | ග්‍රන්ථ සහ වාර සඟරා | 288,089.02 | 114,666.46 |
| 250 | ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ හාවිතය | 40,700.21 | 32,645.43 |
| 251 | ජාතික දත්ත බැංකුව ස්ථාපන | 5,165,000.00 | |
| 280 | රක්ෂණය (වත්කම්) | 168,524.97 | 114,649.68 |
| | | **15,870,130.91** | **4,214,121.94** |
| | **නඩත්තු වියදම්** | | |
| 260 | ගොඩනැගිලි | 8,814,203.20 | 7,995,314.82 |
| 262 | ලී බඩු සවිකිරීම් සහ කාර්යාල | 1,132,479.65 | 1,137,208.84 |
| 264 | මගී රථ | 2,050,010.06 | 3,110,698.71 |
| 266 | අනෙකුත් වාහන | 42,850.00 | 233,763.28 |
| 268 | යන්ත්‍ර උපකරණ | 5,242,471.96 | 5,169,365.15 |
| 270 | මෙවලම් සහ ආයුධ | 23,714.00 | 33,635.36 |
| | | **17,305,728.87** | **17,679,986.16** |
| | **කොන්ත්‍රාත් හා සේවා** | | |
| 290 | මගී වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම් | 2,605,837.30 | 3,513,365.72 |
| 292 | අනෙකුත් වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම් | 5,148,069.50 | 3,455,225.53 |
| 294 | කුලී ගාස්තු (වාහන) | 311,265.60 | 210,498.20 |
| 296 | තැපැල් ගාස්තු | 661,079.01 | 323,771.00 |
| 298 | දුරකථන | 794,003.40 | 670,073.22 |
| 299 | අන්තර්ජාල ගාස්තු | 121,649.68 | 20,549.58 |
| 306 | විදුලිය | 11,798,729.91 | 13,130,377.40 |
| 308 | ජලබදු | 1,841,737.01 | 1,655,853.47 |
| 310 | සෞඛ්‍ය හා සනීපාරක්ෂාව | 3,010,066.80 | 2,910,234.02 |
| 312 | ආරක්ෂක සේවා | 2,260,346.82 | 824,135.00 |
| | | **28,552,785.03** | **26,714,083.14** |

| සංකේත අංකය | විස්තරය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| | **පුහුණු කටයුතු** | | |
| 360 | ශිෂ්‍යත්ව හා පුහුණු (දේශීය) | 106,000.00 | 332,975.00 |
| 362 | ශිෂ්‍යත්ව හා පුහුණු (විදේශීය) | 193,654.00 | 3,142,758.00 |
| 390 | උපදේශකයන්ගේ ගාස්තු හා දීමනා | 4,594,750.00 | 242,500.00 |
| 392 | ගුරු මණ්ඩලයේ ගාස්තු හා දීමනා | 8,412,600.00 | 5,875,489.00 |
| 394 | සහාය කාර්ය මණ්ඩලයේ ගාස්තු හා දීමනා | 49,600.00 | 224,100.00 |
| 396 | සංවර්ධන පිරිවැය | 289,600.00 | 128,100.00 |
| 410 | පුහුණු ද්‍රව්‍ය | 94,178.99 | 104,324.83 |
| 412 | පුහුණුව සඳහා අමතර ද්‍රව්‍ය | 4,823,566.60 | 4,382,714.80 |
| 414 | පුහුණුව සඳහා ඉන්ධන | 4,959,116.89 | 3,481,744.61 |
| 416 | පුහුණු ආධාර | | 5,000.00 |
| 418 | අත්මෙවලම් සහ කුඩා උපකරණ | 127,217.57 | 5,734.86 |
| 424 | පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම් | 72,000.00 | 236,341.24 |
| 425 | පුහුණු වැඩසටහන් සඳහා ආහාරපාන | 5,825,536.00 | 4,925,027.00 |
| 426 | අනෙකුත් | 31,598.00 | 4,190.00 |
| 440 | පුහුණු දීමනා | 1,052,850.00 | 168,675.00 |
| 441 | දේශනශාලා ගාස්තු ආදායම | 597,225.70 | 165,744.29 |
| 443 | උපකරණ කුලියට ගැනීම | 37,920.00 | 24,150.00 |
| 445 | NVQ සඳහා වියදම | | |
| | | **31,267,414.15** | **23,449,568.63** |
| | **අනෙකුත්** | | |
| 345 | රඳවා ගැනීමේ බද්ද | 3,514,899.00 | 737,651.00 |
| 344 | N.B.T. | 650,493.63 | 746,249.36 |
| 346 | කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම් | 1,213,210.25 | 974,957.00 |
| 348 | කාර්ය මණ්ඩල සඳහා සංග්‍රහ | 328,369.67 | 281,219.64 |
| 350 | සෞඛ්‍ය රක්ෂණය | 2,641,218.18 | 1,640,640.32 |
| 351 | බොල් ණය | 20,010.90 | 27,505.00 |
| 354 | අනෙකුත් | 238,405.50 | 42,925.00 |
| 369 | ප්‍රදර්ශන | 3,689,997.50 | 2,761,942.18 |
| 370 | දැන්වීම් සහ ප්‍රචාරණ | 348,765.94 | 301,405.37 |
| 372 | විනෝද උත්සව | 1,097,360.00 | 638,800.00 |
| 373 | ආසන දීමනාව | 75.00 | 525.00 |
| 379 | සේවා ගාස්තු (කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය | | |
| 380 | නීතිමය හා වෘත්තීමය ගාස්තු | | |
| 381 | ආර්ථික සේවා ගාස්තු | | 1,533,681.57 |
| 382 | බලපත්‍ර ගාස්තු | 54,361.42 | 48,029.54 |
| 384 | විවිධ වියදම් | 41,459.95 | 301,574.28 |
| 385 | කුලී හා වරිපනම් | 76,614.33 | 103,169.58 |
| 388 | නවාතැන් ගාස්තු | 110,054.12 | 44,759.60 |
| | | **14,025,295.39** | **10,185,034.53** |
| | **ආදායම් ඉපැයීමේ කටයුතුවල සමස්ථ වියදම** | **195,288,458.05** | **168,543,782.04** |
| | | | |

| සංකේත අංකය | විස්තරය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| | සටහන 13 | | |
| | **අනෙකුත් ආදායම** | | |
| 116 | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු | 101,142.87 | 125,500.04 |
| 118 | දඩ අධිභාර සහ වෙනත් | 28,986.00 | 9,307.69 |
| 111 | විලම්භීත ආදායම | 35,510,574.24 | 2,484,378.10 |
| 119 | පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත් | 1,593,439.69 | 1,675,520.73 |
| 122 | විවිධ | 733,151.57 | 1,081,404.10 |
| 123 | ලාභ/අලාභ ස්ථාවර වත්කම් ඉවත් කිරීම | | 3,143,281.31 |
| 126 | විවිධ (අනුග්‍රහක) | 3,198,000.00 | |
| 141 | විවිධ ආදායම් (VAT රහිත) | 214,217.00 | 471,154.00 |
| 167 | කොන්ත්‍රාත්කරුවන් සඳහා හැඳුනුම්පත | 19,500.00 | 23,100.00 |
| 170 | කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලිය විකිණීම | | 201,785.23 |
| 329 | ICTAD ගුණාත්මක ජ“නලය | 245,000.00 | |
| 377 | ICTAD ගුණාත්මක සංවර්ධන ව්‍යාපෘතියෙන් ලද ආදායම | 4,725,000.00 | 2,750,000.00 |
| | | **46,369,011.37** | **11,965,431.20** |
| | සටහන 14 | | |
| | **පරිපාලන වියදම්**<br>**පුද්ගල වේතන** | | |
| 200 | වැටුප් හා වේතන | 24,937,995.88 | 22,913,935.39 |
| 201 | ජීවන වියදම් දීමනාව | 6,833,429.75 | 5,555,861.37 |
| 203 | පැමිණීමේ දිරි දීමනාව | 1,344,473.21 | 1,158,222.13 |
| 208 | වැඩ බැලීමේ දීමනාව | 422,080.52 | 315,189.89 |
| 210 | අනෙකුත් දීමනා | 82,150.00 | 49,456.17 |
| 220 | නිවාඩු දින ගෙවීම් සහ අතිකාල | 3,154,289.82 | 3,601,220.35 |
| 220a | නිවාඩු දින ගෙවීම් සහ අතිකාල | 1,200,308.16 | |
| 224 | වෘත්තීය ආයතන සඳහා සාමාජික මුදල් | 19,569.60 | 44,920.60 |
| 226 | බෝනස් ගෙවීම | 811,526.00 | 554,773.00 |
| 330 | E.P.F | 4,012,342.90 | 3,790,432.92 |
| 332 | E.T.F | 798,862.94 | 757,218.06 |
| 334 | පාරිතෝෂිතය | 2,014,246.25 | 1,065,587.00 |
| | | **45,631,275.03** | **39,806,816.88** |
| | **ගමන් වියදම්** | | |
| 236 | ගමන් වියදම් (දේශීය) | 403,108.38 | 414,384.75 |
| 236a | ගමන් වියදම් (ආදායම් ඉපයූ) | 104,231.50 | |
| | | **507,339.88** | **414,384.75** |
| | **සැපයීම් සහ අවශ්‍යතා** | | |
| 240 | ඡායා පිටපත් වියදම් | 674,857.34 | 494,916.08 |
| 242 | ලිපිද්‍රව්‍ය | 271,956.69 | 83,747.17 |
| 244 | අනෙකුත් අවශ්‍යතා | 850,226.02 | 40,200.82 |
| 246 | මුද්‍රණය යතුරු ලියනය සහ පරිවර්තනය | 193,335.40 | 192,710.00 |
| 248 | ග්‍රන්ථ සහ සඟරා | 219,654.64 | 200,115.00 |
| 250 | ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ භාවිතය | 84,651.67 | 28,605.74 |
| 280 | රක්ෂණය (වත්කම්) | 422,852.33 | 340,501.45 |
| | | **2,717,534.09** | **1,380,796.26** |
| | **එකතුව - පරිපාලන වියදම්** | **48,856,149.00** | **41,601,997.89** |

| සංකේත . අංකය | විස්තරය | 2013 රු. | 2012 රු. |
|---|---|---|---|
| | සටහන 15 | | |
| | **අනෙකුත් වියදම්** | | |
| | **නඩත්තු වියදම්** | | |
| 260 | ගොඩනැගිලි | 2,483,819.13 | 2,566,088.57 |
| 262 | ගෘහභාණ්ඩ සවිකිරීම් සහ කාර්යාල උපකරණ | 956,212.78 | 1,794,566.44 |
| 264 | මගී වාහන | 2,260,011.88 | 1,921,136.15 |
| 268 | යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 8,000.00 | |
| 272 | වෙනත් | | |
| | | **5,708,043.79** | **6,281,791.16** |
| | **කොන්ත්‍රාත් සේවා** | | |
| 290 | මගී වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම් | 5,818,851.57 | 4,543,611.97 |
| 294 | වාරික හා කුලී ගාස්තු (වාහන) | 198,500.00 | 6,100.00 |
| 296 | තැපැල් ගාස්තු | 156,446.22 | 466,276.00 |
| 298 | දුරකථන | 766,290.86 | 755,994.73 |
| 299 | අන්තර්ජාල ගාස්තු | 256,696.69 | 126,123.65 |
| 306 | විදුලිය | 4,982,806.92 | 2,627,483.14 |
| 308 | ජලබද්දු | 438,445.73 | 374,036.16 |
| 310 | සෞඛ්‍ය හා සනීපාරක්ෂාව | 908,277.93 | 699,071.35 |
| 312 | ආරක්ෂක සේවය | 370,006.46 | 165,780.81 |
| | | **13,896,322.38** | **9,764,477.81** |
| | **පුහුණු කටයුතු** | | |
| *320* | පර්යේෂණ සහ අධ්‍යයන | | 14,700.00 |
| 360 | ශිෂ්‍යත්ව සහ පුහුණුව (දේශීය) | 72,400.00 | 135,775.00 |
| 362 | ශිෂ්‍යත්ව සහ පුහුණුව (විදේශීය) | | 38,300.00 |
| 392 | ගුරු මණ්ඩලයේ ගාස්තු හා දීමනා | 15,000.00 | 11,700.00 |
| 396 | සංවර්ධන පිරිවැය | 19,297.67 | |
| 410 | පුහුණු ද්‍රව්‍ය | 1,445.54 | 1,533.10 |
| 416 | පුහුණු ආධාර | | 62,554.89 |
| 428 | විශේෂ රැකියා සඳහා වියදම් | 250,000.00 | |
| 439 | කාර්ය මණ්ඩල ශුභ සාධනය | 10,000.00 | |
| 440 | පුහුණු දීමනාව | 711,500.00 | 102,000.00 |
| 441 | ශාලා ගාස්තු | 30,000.00 | |
| 425 | පුහුණු පාඨමාලා සඳහා සංග්‍රහ | 4,195.00 | |
| | | **1,113,838.21** | **366,562.99** |

| සංකේත අංකය | විස්තරය | 2013<br>රු. | 2012<br>රු. |
|---|---|---|---|
| | වෙනත් | | |
| 344 | N.B.T. | 102,419.00 | 2,228,065.00 |
| 346 | කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් | 252,641.65 | 169,419.33 |
| 348 | කාර්ය මණ්ඩලය සඳහා සංග්‍රහ | 602,868.00 | 473,406.00 |
| 350 | සෞඛ්‍ය රක්ෂණය | 321,535.84 | 188,106.46 |
| 351 | බොල් ණය | 2,916,470.99 | 298,099.25 |
| 353 | අධිභාරය | 66,352.50 | |
| 354 | වෙනත් | 33,965.00 | 8,000.00 |
| 353 | අධිභාරය | | 23,013.00 |
| 369 | ප්‍රදර්ශන | 81,923.68 | 34,286.18 |
| 370 | දැන්වීම් හා ප්‍රචාරණ | 2,467,314.18 | 1,965,143.61 |
| 372 | විනෝද උත්සව | 491,396.02 | 450,248.76 |
| 373 | ආසන දීමනාව | 292,800.00 | 264,032.00 |
| 374 | විගණන ගාස්තු | 175,000.00 | 250,000.00 |
| 378 | රක්ෂණ පොදු | | |
| 380 | නීතිමය හා වෘත්තීය ගාස්තු | 117,806.40 | 14,034.96 |
| 381 | ආර්ථික සේවා ගාස්තු | | 88,221.50 |
| 382 | බලපත්‍ර ගාස්තු | 144,205.09 | 107,523.12 |
| 384 | විවිධ වියදම් | 95,048.59 | 122,853.19 |
| 385 | කුලී හා ගාස්තු | 1,876.40 | 1,924.52 |
| 388 | නවාතැන් | 125,254.60 | |
| 390 | උපදේශනයන් සඳහා ගාස්තු හා දීමනා | | |
| 425 | පුහුණු වැඩසටහන්වලදී සංග්‍රහ | | |
| | | **8,288,877.94** | **6,686,376.88** |
| | **එකතුව - වෙනත් වියදම්** | **29,007,082.32** | **23,099,208.84** |

මගේ අංකය :
1/1/Legal/5
දිනය : 08.12.2014

වැඩබලන අධ්‍යක්ෂ (මූල්‍ය) / ICTAD

2014 දෙසැම්බර් 05 දින පවත්වන ලද අංක 10.∴2014 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් උපුටා ගන්නා ලද තතු විස්තරය ඔබගේ අවධානය / අවශ්‍ය කටයුතු සඳහා යොමු කරමි.

| අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | විෂයය |
|---|---|
| 14-10-5.2 | 2014 දෙසැම්බර් 05 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම<br><br>2013 අවසන් ගිණුම් - අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රය අංක. 2014-10-11<br><br>2013 අවසන් ගිණුම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට ඇත.<br>වැඩ බලන අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් ඉදිරිපත් කර ඇත. |

කේ.ඒ.සී.ද අල්විස්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

මගේ අංකය :
1/1/Legal/5
දිනය : 08.12.2014

වැඩ බලන අධ්‍යක්ෂ (මූල්‍ය) /
ICTAD

2014 දෙසැම්බර් 05 දින පවත්වන ලද අංක 10.∴2014 දරණ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමෙන් උපුටා ගන්නා ලද තතු විස්තරය ඔබගේ අවධානය / අවශ්‍ය කටයුතු සඳහා යොමු කරමි.

| අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | විෂයය |
|---|---|
| 14-10-5.2 | 2014 දෙසැම්බර් 05 දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම<br><br>1971 අංක 38 දරණ මූල්‍ය පනතේ වගන්ති 14 (2) (C) අනුකූලව 2013.12.13 දින විගණකාධිපති වාර්තාව සහ ඊට අදාළ පිළිතුරු - අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අංක 2014.10.12.<br><br>වැඩ බලන අධ්‍යක්ෂ (මූල්‍ය) විසින් ඉදිරිපත් කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවේ අන්තර්ගතය වෙත අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කරන ලදි. |

කේ.ඒ.සී.ද අල්විස්
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්
ICTAD

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊඑච්/එෆ් /අයිසීටීඒඩී/එෆ්ඒ/13 ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2015 පෙබරවාරි 06 දින

සභාපති ,

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය .

**ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14( 2 )( සී ) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය

60

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department
AGDSL

ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

--------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

### 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

----------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (ICTAD) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPAS) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

61

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයේ ලියාපදිංචිය වර්ෂ තුනකට වරක් අළුත් කරනු ලැබේ. කෙසේ වුවද ආයතනය විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 ට පටහැනිව මෙම සියළුම ලියාපදිංචි ගාස්තු ඒවා ලැබුණු වර්ෂයේ ආදායම ලෙස හඳුනාගෙන තිබුණි. තවද , මූල්‍ය ප්‍රකාශනවල ආදායම ලෙස මෙම ලියාපදිංචි ගාස්තු හඳුනාගැනීම සඳහා ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උත්පාදනය කරන ලද අරමුදල් සහ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දේපල, පිරියත හා උපකරණ අත්කර ගැනීම නිරවුල්ව හඳුනාගෙන නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල වෙනම හෙළිදරව් කර නොතිබුණි. එබැවින් රජයේ ප්‍රදාන ගිණුම් තැබීම පිළිබඳ නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

(ආ) රු. 15,707,803 ක් වූ ක්ෂය සඳහා ප්‍රතිපාදනය භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබූ අතර ආයෝජනයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වුවද එම ආයෝජනයට අනුකූල වන පරිදි අරමුදල් ගිණුමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් ලබාදුන් කාල විශ්ලේෂණයට අනුව, 2013 දෙසැම්බර් 31 දිනට රු.3,853,725 ක් වූ විවිධ ණය හිමියන් වර්ෂ 2 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. ඉන් රු.2,266,032 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් නිරවුල් නොකර පැවතුණි.

(ආ) 2011 සිට 2013 කාල පරිච්ඡේදය තුළදී පුහුණු කරන ලද අභ්‍යාසලාභීන් සඳහා ලබාදුන් රු.2,839,923 ක ණය පහසුකම් අයකර ගැනීම සැක සහිතය.

62

විගණකාධිපති දෙපාර්තමේන්තුව
Auditor General's Department

(ඇ) ආයතනයේ පුහුණු කිරීම් මධ්‍යස්ථානයක් වන ජනාවාස සැලසුම් හා සංවර්ධනය සඳහා මධ්‍යස්ථානය විසින් ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව පුහුණු පාඨමාලා කිහිපයක් පවත්වා තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට හිඟ හිට පැවති රු.105,048 ක් වූ පාඨමාලා ගාස්තු 2014 නොවැම්බර් 30 වන විටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) 1997 සිට 2004 කාලපරිච්ඡේදය තුළදී මෝටර් වාහන සහ පිරියත හා යන්ත්‍රෝපකරණ කුලියට දීමට අදාළව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ සංවිධානයෙන් (NEMO) ලැබිය යුතු රු.114,529,393 ක ශේෂය පිළිබඳව 2014 සැප්තැම්බර් දක්වාත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1971 අංක 38 දරන මුදල් පනත | |
| (අ) 11 වගන්තිය | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසානයට රු.15,707,803 ක මුදලක් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) 13(2) වගන්තිය | 1998 සිට 2011 කාල පරිච්ඡේදය සඳහා රු.2,145,358 ක් වූ විගණන ගාස්තු ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනය විසින් 2014 සැප්තැම්බර් වන විටත් ගෙවා නොතිබුණි. මෙම ශේෂය යථා කාලයේදී නිරවුල් කරන බව මේ සම්බන්ධයෙන් ආයතනයේ සභාපතිවරයා විසින් දක්වා තිබුණි. |

63

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department
AGDSL

| | |
|---|---|
| (ඇ) 14(1) වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් නියමිත පරිදි විගණකාධිපතිවරයාට ඉදිපත් කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.19,724,647 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.78,758,145 ක් වූයෙන් රු.59,033,498 කින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් දැක්වුණි. ආදායම හා භාණ්ඩාගාර ප්‍රදාන පිළිවෙලින් රු.55,455,327 කින් හා රු.27,440,000 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 262 ක් වූ කාර්ය මණ්ඩලය, රු.මිලියන 861 ක් වටිනා මුළු වත්කම් යොදා ගැනීම හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.මිලියන 115 ක රජයේ දායකය හේතුවෙන් ආයතනයේ මෙහෙයුම් ඌනතාවය රු.මිලියන 25 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ ඌනතාවය මුළු වත්කම්වලින් සියයට 3 ක් නියෝජනය වූ අතර එය ඉකුත් වර්ෂයේ සියයට 11 ක සාපේක්ෂව සියයට 8 ක හිතකර තත්ත්වයක් විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1996 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් තිබූ ජංගම නොවන බැරකම් යටතේ දැක්වෙන රු.2,663,659 ක් වූ ආපසු ගෙවිය යුතු විදේශාධාර නිරවුල් කිරීම සඳහා 2013 වර්ෂයේදීත් ඵලදායී ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

64

(ආ) තථ්‍ය අවශ්‍යතාවය පිළිබඳ තක්සේරු කිරීමකින් තොරව රු.4,351,000 ක මුළු පිරිවැයකට කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලින් පිටපත් 2000 ක් මුද්‍රණය කර තිබුණි. එයින් පිටපත් 1050 ක් 2014 නොවැම්බර් 30 වන විටත් ගබඩාවේ නිෂ්කාර්යව පැවතුණු අතර එහි අඩංගු තොරතුරු මේ වන විට යල් පැන ගොස් තිබුණි.

(ඇ) තාක්ෂණ නිලධාරියකු ඔහුට ලැබිය යුතු වැටුප් සමග නැවත සේවයේ පිහිටුවීම සඳහා 2010 නොවැම්බර් 30 දින මහාධිකරණය මඟින් තීන්දුවක් ලබාදී තිබුණි. එම තීන්දුවෙන් වර්ෂ දෙක හමාරකට පසුව 2013 අප්‍රේල් 04 දින ආයතනය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර තිබූ අතර ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එම අභියාචනය ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් ඉවත දමා තිබුණි.

## 4.2 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සුදුසු පුද්ගලයන්ගෙන් පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමෙන් තොරව ආයතනයේ අභ්‍යන්තර විගණක, මුදල් අධ්‍යක්ෂ හා නියෝජ්‍ය සංවර්ධන අධ්‍යක්ෂ ආදී තනතුරු ඇතුළත් විධායක මට්ටමේ තනතුරු 17 ක් 2013 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ කිහිපයක් වැඩ බැලීමේ පදනම මත පැවතුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 318 ක් හා 234 ක් වූ අතර එහි පුරප්පාඩු වූ තනතුරු 84 කින් 27 ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු විය. මෙම පුරප්පාඩු තනතුරු පිරවීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවට විගණනයේදී නිරීක්ෂණය නොවීය.

## 5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

## 5.1 සංයුක්ත සැලැස්ම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 - 2015 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණද, ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය පිළිබඳ කාලීන සමාලෝචනය සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. තවද එය 2011 වර්ෂයේ සිට චක්‍රීය සැලැස්මක් ලෙස යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) ඉඩම්, ගොඩනැගිලි, මෙහෙයුම් පහසුකම් , මානව සම්පත් ආදී තිබෙන සම්පත් සහ අවශ්‍ය හා ආයතනයේ දැනට තිබෙන කළමනාකරණ නිපුණතා සංයුක්ත සැලැස්මේ දක්වා නොතිබුණි.

(ඇ) ආයතනයේ ශක්තීන් හා දුර්වලතා සහ බාහිර බලපෑම් හා අවස්ථා (SWOT) විශ්ලේෂණය කර නොතිබු අතර, උපායමාර්ග විධිමත්ව සකස් කිරීම සඳහා සලකා බලා නොතිබුණි.

(ඈ) ප්‍රධාන කාර්ය සාධන දර්ශකයන් තීරණය කර එහි ඇතුළත් කර නොතිබුණි.

(ඉ) සංයුක්ත සැලැස්මට අනුව උපදේශක සේවා, ආයතනයේ උපදේශක අංශයේ ප්‍රධාන කාර්යයන් වූ නමුත් 2013 වර්ෂය තුළ ආයතනය විසින් උපදේශක සේවා සිදුකර නොතිබුණි.

## 5.3 අයවැය පාලනය

අයවැය සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ඉදිකිරීම් අභ්‍යාස හා පුහුණු කිරීම් ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ණයගැතියන් හා ණයහිමියන්

(ඇ) අයවැය

(ඈ) කාර්ය සාධනය මැනීම

(ඉ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම

(ඊ) ඉන්වොයිසි නිකුත් කිරීම

(උ) දේපල, පිරියත හා උපකරණ

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩ බලන )

66